බුදු දහම දැක ගනිමු - 12

ඇනිච්ච නැනිච්ච සහ පටිච්චසමුප්පන්න බව අතර වෙනස

(සම්මිද්ධි සූත්‍ර ඇසුරෙන්)



රවින්ද්‍ර කොග්ගලගේ

බුදු දහම දැක ගනිමු - 12

ඇතිවීම නැතිවීම සහ පටිච්චසමුප්පන්න ඛව අතර වෙනස

(සම්ද්ධි දුක්ඛපඤ්හ, සම්ද්ධි මාරපඤ්හ, සම්ද්ධි ලොකපඤ්හ,
සම්ද්ධි සන්තපඤ්හ සූත්‍ර ඇසුරෙන්)

සංයුත්තනිකාය, සළායතනවග්ගය, වෙදනාසංයුත්තය, විභජාලවග්ගය

රවීන්ද්‍ර කොග්ගලගේ

ප්‍රථම මුද්‍රණය : 2018 නොවැම්බර් (පිටපත් 5,000)

ISBN No. 978-955-43763-4-2

පොත පිළිබඳ විමසීම්:

මහාචාර්ය රවින්ද්‍ර කොග්ගලගේ
Email: koggalage@yahoo.com
Web: http://ravi.harimaga.com
Mobile : 0777234239

මුද්‍රණය:
කොලිටි ප්‍රින්ටර්ස්
17/2, පැඟිරිවත්ත පාර, ගංගොඩවිල
නුගේගොඩ
දුරකථනය: 011 4 870 333

ධර්ම දානයකි - නොමිලයේ බෙදාහැරීම පිණිසයි.

සබ්බ දානං ධම්ම දානං ජිනාති

සියලු දානයන් අතරින් ධර්ම දානය උතුම් වේ.

පුණ්‍යානුමෝදනාව

උතුම් ශ්‍රී සද්ධර්මය මැනවින් අධ්‍යනය කරමින්, බුදුරජාණන් වහන්සේ දේශනා කළ පෙර නොඇසූ විරූ දහම කුමක්දැයි තේරුම් ගැනීම පිණිස අපගේ ප්‍රඥා චක්ෂුශය අවදි කරන්නට මහත් පරිශ්‍රමයක් දරණ මහාචාර්ය රවින්ද්‍ර කොග්ගලගේ මැතිඳුන්ට ඉමහත් ගුරු ගෞරවයෙන් කරන පුණ්‍යානුමෝදනාවයි මේ.

චතුරාර්ය සත්‍ය, පටිච්චසමුප්පාදය, ස්කන්ධ, ධාතු, ආයතන ආදී දහම් කරුණු වල අර්ථ කියාදෙමින් අප හට ලබාදෙන මෙම මගපෙන්වීමට අමතරව, ගරු ස්වාමීන් වහන්සේලා සමග පවත්වන සාකච්ඡා අන්තර්ජාලය තුළින් අප සමග බෙදා ගැනීම සහ මාර්ගය වැඩීමට අවශ්‍ය වැදගත්ම සූත්‍ර අසන්නට ලැබීම අප ලැබූ මහත් භාග්‍යයක් ලෙස සලකමු. ලෞකික සහ ලෝකෝත්තර සම්මාදිට්ඨිය අතර වෙනස, ආර්ය මාර්ගය අරඹන්න පුළුවන් ලෝකෝත්තර සම්මාදිට්ඨිය ඇති කෙනාට පමණක් බව, කායානුපස්සනාව නිවැරදිව වඩන ආකාරය සහ විදර්ශනාව ආරම්භ වන්නේ සමුදය ධම්මානුපස්සී වීම තුළින් බව, නිරෝධය යනු හටගත් දෙය නැතිවීම නොව නූපදින ස්වභාවය බව, අනිච්ච සඤ්ඤාව නිවැරදිව වඩන්නේ කෙසේද ආදී අපි නොදන සිටි දහමේ ගැඹුරුම තැන් ස්පර්ශ කිරීමට අපට කරන මේ උපකාරය ගැන ඔබතුමාට ඉතාමත් කෘතඥ වෙමු.

ඔබතුමාගේ වටිනා කාලය සහ ශ්‍රමය අප වෙනුවෙන් කැප කර, මේ ලැබූ ක්ෂණ සම්පත්තියේ වටිනාකම ගැන නිතර අපට මතක් කර දෙමින්, අතිභයංකර සසරෙන් එතර වීමට නම් දහම දන්න-දකින කෙනෙක් වන්න, දහම භාවිතා බහුලීකතා කරන්න කියන උපදෙස් වලින් අපව නිරන්තරයෙන් දිරිගන්වමින්, ලෝකෝත්තර මාර්ගය වෙත අපව යොමු කිරීම ගැන ඔබතුමාට අනේකවාරයක් පින්. නිවන් දකිනා තෙක් මෙවන් කල්‍යාන මිත්‍ර ඇසුරක් ලැබේවායි ප්‍රාර්ථනා කරමු. මතු මත්තේත් මෙවැනිම ධර්ම දානමය කටයුතු වල නියැලීමට අවශ්‍ය ශක්තිය, ධෛර්ය, නිරෝගි සම්පත්තිය ඔබතුමාට ලැබේවා! මේ ගෞතම බුද්ධ ශාසනයේම නිවනින් නිවේවා යන්න අපගේ අවංක පැතුමයි.

- මියගිය ආදරණීය දෙමාපියන් වන ඇග්නස් වෛද්‍යරත්න, ෆැන්සිස් වෛද්‍යරත්න, සහ එච්.බී. වීරරත්න පියාණන් ඇතුළු මියගිය සියලු ඥාතීන්ට මේ පින් අනුමෝදන් වේවා! අප සියලු දෙනාටත් ධර්මාවබෝධය පිණිසම මේ ධර්මදානමය කුසලය හේතුවාසනා වේවා!

- පින් කැමති සියලු දෙනාම මෙම දහම් පුස්තකය එළිදැක්වීමට දායකත්වය සැපයීමෙන් ලැබෙන පින් අනුමෝදන් කරගනිත්වා. උතුම් ධර්මාවබෝධය පිණිසම මේ පින හේතු වේවා! සාදු! සාදු! සාදු!!!

  - වෛද්‍ය කමල් තෙන්නකෝන්, ඔස්ට්‍රේලියාව.

- කළුබෝවිල රෝහලේ සේවය කළ වෛද්‍යවරු පිරිසක් - සියලු සත්වයන්ගේම නිවන් මඟ උදෙසාත්, ඒ අයගේ දෙමාපියන්ට නිවන් මඟ සඳහාත් පිං පිණිසයි.

- ඉමක් කොනක් නොපෙනෙන සසර ගමනක් උරුම කරගත් අපට ඒ ගමන අවසන් කරගැනීමට උපකාරී වන, ප්‍රඥාව උදකර ගැනීමට බුදුන් දේශනා කළ පෙර නොඇසූ විරූ දහම ඉතාමත් සරලව පැහැදිලි කරමින් සුවිශේෂී පරිශ්‍රමයක් දරන පින්වත් රවින්ද්‍ර කොග්ගලගේ මැතිඳුන්ට මේ ගෞතම ශාසනයේදීම වහ වහා චතුරාර්‍ය සත්‍යය ධර්මය අවබෝධවීම පිණිසත්, මෙම සත් කාර්‍යය තවදුරටත් කරගෙන යාම සඳහා අවශ්‍ය ශක්තිය ධෛර්‍ය හා නිදුක් නිරෝගි සුවය ලැබේවායි ප්‍රාර්ථනා කරන්නේ රත්නපුර කාන්ති පීරිස් මහත්මිය විසිනි.

- පරලෝසැපත් එස්. ඒකනායක පියාට, ජී. ඒකනායක මවට, ඩී. ඩබ්. සමරසිංහ ස්වාමිපුරුෂයාට, ලක්ෂ්මන් සහ රංජිත් යන සහෝදරයන් දෙදෙනා සහ පරලෝ සැපත් සියලුම ඥාතීන්ට පිං පිණිසත්, සුජීවත්ව සිටින දූදරුවන්, සහෝදරියන් ඇතුළු පවුල්වල සාමාජිකයන්ටත්, අපට මහඟු සේවයක් කරන මහාචාර්‍ය රවින්ද්‍ර කොග්ගලගේ මැතිතුමන්ටත්, එතුමාගේ පියාණන්ටත් උතුම් නිර්වානය අවබෝධ කරගැනීමට මෙම ධර්ම දානමය කුසලය හේතුවේවා!

  - පී. ඇම්. සමරසිංහ මිය.

- පරලෝසැපත් ඇල්බට් අළුත්ගමගුරුගේ වන මාගේ ස්වාමිපුරුෂයාට පිං පිණිස මෙම ධර්මදානමය කුසලය හේතුවේවා! අපට උතුම් සේවාවක් කරන අපගේ ගුරු කල්‍යාණමිත්‍ර මහාචාර්ය කොග්ගලගේ මහතාට හා එතුමාගේ පියාණන්ට උතුම් නිර්වානය අවබෝධ කරගැනීමට මෙම කුසලය හේතුවේවා!

  - A. W. ද සිල්වා මිය.

- ගාල්ල, ඇල්පිටිය පදිංචි S. K. රණදීර පියාණන්ගේ ජනවාරි 27 දිනට යෙදෙන ජන්ම දිනයට ආශීර්වාද කිරීම. මේ උතුම් ධර්ම දානමය කුසල බලයෙන් නිදුක්, නිරෝගී සුවය, දීර්ඝායුෂ ප්‍රාර්ථනා කරන අතර, පවුලේ සැමටත්, ලොව සියලු දෙනාටත් ධර්මාවබෝධයටහ හේතු වේවා! මහාචාර්ය රවී කොග්ගලගේ

මැතිතුමා ඇතුළු පවුලේ සැමට නිදුක් නිරෝගී සුවය ලැබේවා! මේ ධර්ම දානයේ ආනිශංස සැමටම නිවන් අවබෝධය පිණිසම හේතු වේවා!

- ඊෂාණි දියණිය

- පරලෝ සැපත් කේ. එල්. එස්. ඒ. සහබන්දු සහ පියදස පට්ටියකුඹුර පියතුමන්ලා ඇතුලු සියලු ඥති හිතෛෂීන්ගේ මතු භවයන් සුගතිගාමී වීමටත්, සියලු ඥති හිතෛෂීන්ට උතුම් ධර්මාවබෝධය සඳහාත් රුවන්, තුෂාරි, රුචිර සහබන්දු විසින් මෙම ධර්ම දානය සඳහා සපයන ලද දායකත්වය ඔවුනට චතුරාර්ය සත්‍යය අවබෝධය පිණිස හේතු වේවා!

- දායකත්වය හේමා විදානගේ මිය - පවුලේ මියගිය සියලු දෙනාට පිං පිණිස සහ අප සැමට චතුරාර්ය සත්‍යය අවබෝධ වේවා!

- නො. 1/15, ග්‍රාමසංවර්ධන මාවත, දෙපානම, පන්නිපිටිය පදිංචිව සිට 2018-01-09 දින මිය පරලොව ගිය තිබ්බොටුවාව ගමගේ පියදස මහතාට සහ මිය පරලොව ගිය දෙමව්පියන් වන තිබ්බොටුවාව ගමගේ බබුන් අප්පුහාමි පියාට, K. දිනකහාමි මැණියන්ට, සේවිස් අමරසිරි ගුණවර්ධන පියාට, K.P.K. ගිමාරා මැණියන්ට, මේ පින් අත්වේවා! මේ පින් බලෙන් මේ දහම් පොත් සකසන, කියවන සෑම දෙනාටම උතුම් චතුරාර්‍ය සත්‍යය අවබෝධ වේවා!

මෙයට බිරිඳ සහ දරුවන් තිදෙනා.

- ඩී.එස්. ඇපාසිංහ පියාණන්, අ.ප.ගේ. ජයසේකර පියාණන්, බී.ඩී. පද්මාවතී ජයසේකර මැණියන්, රම්මැණිකේ කුලසූරිය පුංචි අම්මා, බී.ඩී.එම්. පුංචිමැණිකේ, ඩී.ඒ. දයාසේන මස්සිනා යන ඥතීන් ඇතුළු සියලුම පරලෝ සැපත් ඥති හිතමිතුරන්ද, අප සමග ජීවත් වී පරලෝ සැපත් සියලු දෙනාටම පිං පැමිණෙවීම සහ නිර්වාන අවබෝධය ප්‍රාර්ථනා කිරීමටත්, අප සියලු දෙනාටම නිර්වාන අවබෝධය කෙටි කලකින්ම ලැබේවායි ප්‍රාර්ථනා කරමින් ඇපා සහ තමරා විසින් දායකත්වයක් දරන ලදී.

- 2017.10.05 දින අවුරුදු 59ක් ආයු වළඳ රෝගාතුරව සිට අප අතරින් වියෝවූ පරගහතොට වතුගෙදර පදිංචිව සිටි එච්. එන්. කුසුමාවතී මැණියන්ට සසර වසන තුරාවට මෙවන් වූ අකල් මරණයකට පත්වීමට සිදුනොවේවායිද, මෙම ධර්මදානමය කුසලය ඇයට නිවන් අවබෝධය පිණිසම උපනිශ්‍රය වේවා යයිද ප්‍රාර්ථනා කරමු. තවද එන්. එච්. කුසුමාවතී මහත්මියගේ සුජීවත්ව සිටින දයාබර ස්වාමිපුරුෂයා වන බී. ජිනරත්න මහතා ඇතුළු දුවා දරුවන්ටද, මුණුබුරු මිණිබිරියන්ටද නිදුක් නිරෝගි සුවය සහ චිර ජීවනය ප්‍රාර්ථනා කරමු. දේශකයාණන් වන මහාචාර්ය රවින්ද්‍ර කොග්ගලගේ මැතිඳුන්ට මෙම කාර්යය තවදුරටත් ඉදිරියටම කරගෙන යාමට නිදුක් නිරෝගි සුවය ලැබේවායිද, අවසානයේ ඔහු පතන බෝධියකින් නිවන් අවබෝධය පිණිසම හේතුවාසනා වේවායිද පතමු.

- වලස්මුල්ලේ පදිංචි සිරිසේන සහ කුසුම් විජේසේකර යන දෙපලගේ මියගිය ඥාති මිත්‍රාදී සැමට පිං පිණිසත් රවී කොග්ගලගේ මහතාණන්ට උතුම් නිවන් සාක්ෂාත් කරගැනීම පිණිසත් ඔවුන් දෙපල විසින් මේ සඳහා දායකත්වය දරන ලදී. එමෙන්ම කේ.බී. විමලා ගන්දර, එච්.ඒ. හින්නිඅප්පුහාමි කඹුරුපිටිය, අකුරුගොඩ සහ එච්.ජී. බුද්ධිකා මාකාවිට විසින් මියගිය සියලු ඥාති මිත්‍රාදීන්ට පිං පිණිසත්, සුජිවත්ව සිටින දෙමව්පියන් ඇතුලු සියලුදෙනාටම සෙත්පතාත් දායකත්වය දරනලදී.

- මාතර, පඹුරණ, කුමාරතුංග මාවතේ සුනිල් එදිරිසූරිය, පද්මසීලි වීරසිංහ දෙමාපියන් සහ සුමිඳු පුතා, කළණි දියණියගේ ද දායකත්වයෙන් යුත් මෙම ධර්ම පුස්තකය පරිහරණය කරන සියලුදෙනාටම උතුම් ධර්මාවබෝධය වේවා! එමෙන්ම සසර කතරේ අතරමංව සිටි අප දහම් මගට යොමුකළ කල්‍යාණමිත්‍ර රවීන්ද්‍ර කොග්ගලගේ මහතාට මේ භවයේදීම උතුම් චතුරාර්ය සත්‍යය අවබෝධ වේවා!! අප සියලුදෙනාටම නිදුක් නිරෝගිභාවය ලැබී ඉක්මන් නිවන් අවබෝධය පිණිසම මෙම ධර්මදානමය කුසලය හේතු වාසනා වේවා!!!

- බැද්දගේ මදුරාවතී මහත්මිය නමින් මියගිය සියලු ඥාතීන්ට පිං පිණිසත්, මේ පොත කියවන සියලු දෙනාටත් චතුරාර්ය සත්‍යය අවබෝධය පිණිසත් මේ ධර්මදානමය කුසලය හේතු වාසනා වේවා!

- නම් වශයෙන් සඳහන් නොකළ, නුගේගොඩ සුභද්‍රාරාමයේ, මාතර, මාතලේ ඇතුළු නොයෙකුත් ස්ථානවල ධර්ම සාකච්ඡා වලට සම්බන්ධ වී මේ සඳහා දායක වූ සියලුම පින්වතුන්ට මෙම උතුම් ධර්මදානමය කුසලය නිවන් අවබෝධය පිණිසම හේතුවාසනා වේවා!

- මෙම පොත පරිඝණක කිරීමට සහාය දැක්වූ අමරතුංග මහතාටත්, දිල්රුක්ෂි මහත්මියටත්, පිටකවරය සකසා දුන් අමිල් මහතාටත්, පොතට ගැළපෙන පෙරවදනක් ලියා දුන් කොස්වත්තේ අරියවිමල හිමියන්ටත්, නිදුක් නිරෝගිභාවය සහ ඉක්මන් නිවන් අවබෝධය සඳහාම මෙම ධර්ම දානමය කුසලය හේතුවාසනා වේවා!

පෙරවදන

පුහුදුන් දැනීම් මට්ටම සංජානනයයි. (**සඤ්ජානාති**) එය ඉඳුරන් මඟින් ලැබෙන අත්දැකීම් මට්ටමයි. සසුන් පිළිවෙතට අයත් සේඛ මට්ටම අභිජානනයයි. (**අභිජානාති**) එය වෙසෙස් නුවණින් හෙවත් යෝනිසෝමනසිකාරයෙන් දැකීමයි. ප්‍රතිපදාව පිරිපුන් කළ අසේඛ මට්ටම පරිජානනයයි. (**පරිජානාති**) ඒ නිසා සසුන් පිළිවෙතේ දී භාවිතා වියයුත්තේ අභිජානාති මට්ටමයි.

ඇසත් රූපත්, කනත් ශබ්දත්, නැහැයත් ගන්ධයත්, දිවත් රසයත්, කයත් පහසත්, මනසත් සංකල්පත් යන සළායතන සම්බන්ධතාව ඔස්සේ අපි අත්දැකීම් ලබමු. ඒ නිමිති වලට අපි ඇලෙමු. ගැටෙමු රැවටෙමු. **ලෝභයෙන්** ඇලෙන තැනත් රැවටීම තිබේ. **ද්වේෂයෙන්** ගැටෙන තැනත් රැවටීම තිබේ. නො ඇලෙන, නො ගැටෙන ගෙහසිත උපේක්ෂාවෙහිත් **මෝහයෙන්** යුතු නිසා රැවටීම තිබේ. ඒ අවිද්‍යාවෙන්, අයෝනිසෝමනසිකාරයෙන් යුක්ත නිසයි.

අප රැවටෙන්නේ කුමකට ද? නාමරූපයටයි. ඵස්සය, මනසිකාරය ඔස්සේ විඤ්ඤාණය විසින් මවා දෙන සළායතනික රූපනිමිති රාගානුසය, පටිඝානුසය, අවිජ්ජානුසය අවදි කරගනිමින් අපි විඳගනිමු. හඳුනාගනිමු. චේතනා මවමු. **අනුසය** තත්ත්ව **පරියුට්ඨාන** වී රාගයෙන්, ද්වේෂයෙන්, මෝහයෙන් හැසිරීම **ව්‍යතික්‍රමණයයි**. මේ ස්වභාවය ක්‍රියාත්මක වන්නේ යම් තාක් ද, ඒ තාක් සකස් වන්නේ සසරයි.

සළායතනික නිමිති මුණගැසෙන්නේ මනසිකාරයටයි. (**මනසිකාරසම්භවා සබ්බෙධම්මා**) නිමිති සමුදය වන්නේ ඵස්සය ප්‍රත්‍යයෙනි. (**ඵස්සසමුදයා සබ්බෙධම්මා**)[1] ඵස්සය වූයේ ඉන්ද්‍රියයත් අරමුණත් විඤ්ඤාණයත් එක්තැන් වීමයි. මෙයයි, පුහුදුන් අත්දැකීම් ලෝකයේ සමුදය. දැන් අපි ලෝභය, ද්වේෂය, මෝහය නමැති

[1] කිංමූලක සූත්‍රය - අඞ්ගුත්තරනිකාය, අට්ඨකනිපාතො, සතිවග්ගො

කෙලෙස් තුළින් සළායතනික ලෝකය අත්දකිමු. අපි කෙලෙස් සහිත චේතනා සහිතව අත්දකින්නේ විඤ්ඤාණය විසින් මවා දුන් නාමරූපය ය. (**පස්සං නරෝ දක්ඛිති නාමරූපං**) දැක දැනගන්නේ ඒ මැවිල්ලමයි. (**දිස්වාන වා ඤස්සති තානිමෙව**)[2] මවාගත් ලෝකය ඇත්තක් යයි අපි සිතමු. (**නිවිට්ඨං නාමරූපස්මිං ඉදං සච්චන්ති මඤ්ඤති**)[3] මේ ආකාරයෙන් චේතනාමය අභිසංස්කරණයන්ගේ සමුදය නුවණින් දැකීම එහි ප්‍රහාණය පිණිස වේ. එමඟින් සාක්ෂාත් වන්නේ නිරෝධයයි. මෙහි දී වෙසෙසින් අවධාරණය කරන්නේ හටගත් දෙයක නැතිවීම ගැන නොව ''**ඉමස්මිං අසති ඉදං න හොති**'' යන ධර්මන්‍යායයට අනුව සමුදය නො යෙදුන විට නො හටගන්නා බවයි.

මේ ධර්මතාව සාකච්ඡා මාර්ගයෙන් සරළ ලෙස ලෝකයාට පහදා දෙමින් **මහාචාර්‍ය, රවීන්ද්‍ර කොග්ගලගේ මහතා** විසින් පවත්වන ලද සාකච්ඡා කීපයක් ඇතුළත් ''**බුදුදහම දැක ගනිමු - 12**" කෘතිය දැන් ඔබ අතට පත් වී තිබේ. එතුමාගේ විශේෂ ප්‍රයත්නය සමුදය වූ දේ නිරුද්ධ කිරීමට වෙහෙසීම වෙනුවට ''**සමුදය ධර්මතාව**" නුවණින් දැකීම තුළින් සමුදය ප්‍රහාණය කිරීම පිළිබඳව ධර්මකාමීන්ට පැහැදිලි කිරීමයි. විඤ්ඤාණයේ මැවෙන නාමරූප මායාවේ සමුදය පිළිබඳ ප්‍රත්‍ය සම්බන්ධතාව නුවණින් දකිනව නම්, එය ඇත්තක් සේ ගන්නා පුරුද්ද ක්‍රමයෙන් අඩු වේ. ඒ විරාගය පිණිස, නිරෝධය පිණිස වැඩෙන නිබ්බේධික පඤ්ඤාවයි. ''**ඉමස්මිං අසති ඉදං න හොති**" යන නිරෝධ න්‍යායය අර්ථසම්පන්න වන්නේ එවිටයි. මේ සියුම් තැන ධර්මකාමීන්ට තේරුම් කර දෙන්න එතුමා ගන්නා උත්සාහය සඵල වේවා. තව තවත් දහම් සේවාවන් සැපයීමට එතුමන්ට රත්නත්‍රය ආශීර්වාදය, නිදුක් නිරෝගී බව වේවායි අපි ආශිංසනය කරමු.

කොස්වත්තේ අරියවිමල හිමි.

2018. 11. 09

[2] මහාව්‍යූහ සූත්‍රය - බුද්දකනිකාය, සුත්තනිපාත, අට්ඨකවග්ගො

[3] ද්වයතානුපස්සනා සූත්‍රය - බුද්දකනිකාය, සුත්තනිපාත, මහාවග්ගො

22-06-2018 දින සුභද්‍රාරාමයේ දී පැවැත්වූ ධර්ම සාකච්ඡාව

පඨම සමිද්ධි මාරපඤ්හ සූත්‍රය

එකං සමයං භගවා රාජගහෙ විහරති වෙළුවනෙ කලන්දක නිවාපෙ. අථ ඛො ආයස්මා සමිද්ධි යෙන භගවා තෙනුපසංකමි, උපසංකමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නො ඛො ආයස්මා සමිද්ධි භගවන්තං එතදවොච: මාරො මාරොති භන්තෙ, වුච්චති. කිත්තාවතා නු ඛො භන්තෙ මාරො වා අස්ස මාරපඤ්ඤත්ති වාති?

යත්ථ ඛො සමිද්ධි අත්ථි චක්ඛු, අත්ථි රූපා, අත්ථි චක්ඛුවිඤ්ඤාණං, අත්ථි චක්ඛුවිඤ්ඤාණවිඤ්ඤාතබ්බා ධම්මා. අත්ථි තත්ථ මාරො වා මාරපඤ්ඤත්ති වා. අත්ථි සොතං, අත්ථි සද්ද, අත්ථි සොතවිඤ්ඤාණං, අත්ථි සොතවිඤ්ඤාණවිඤ්ඤාතබ්බා ධම්මා, අත්ථි තත්ථ මාරො වා මාරපඤ්ඤත්ති වා. අත්ථි ඝානං, අත්ථි ගන්ධා, අත්ථි ඝානවිඤ්ඤාණං, අත්ථි ඝානවිඤ්ඤාණවිඤ්ඤාතබ්බා ධම්මා, අත්ථි තත්ථ මාරො වා මාරපඤ්ඤත්ති වා. අත්ථි ජිව්හා, අත්ථි රසා, අත්ථි ජිව්හාවිඤ්ඤාණං, අත්ථි ජිව්හාවිඤ්ඤාණවිඤ්ඤාතබ්බා ධම්මා, අත්ථි තත්ථ මාරො වා මාරපඤ්ඤත්ති වා. අත්ථි කායො, අත්ථි ඵොට්ඨබ්බා, අත්ථි කායවිඤ්ඤාණං, අත්ථි කායවිඤ්ඤාණවිඤ්ඤාතබ්බා ධම්මා, අත්ථි තත්ථ මාරො වා මාරපඤ්ඤත්ති වා. අත්ථි මනො, අත්ථි ධම්මා, අත්ථි මනොවිඤ්ඤාණං, අත්ථි මනොවිඤ්ඤාණවිඤ්ඤාතබ්බා ධම්මා, අත්ථි තත්ථ මාරො වා මාරපඤ්ඤත්ති වා.

යත්ථ ච ඛො සමිද්ධි නත්ථි චක්ඛු, නත්ථි රූපා, නත්ථි චක්ඛුවිඤ්ඤාණං, නත්ථි චක්ඛුවිඤ්ඤාණවිඤ්ඤාතබ්බා ධම්මා, නත්ථි තත්ථ මාරො වා මාරපඤ්ඤත්ති වා. නත්ථි සොතං...පෙ.... නත්ථි ඝානං...පෙ.... නත්ථි ජිව්හා, නත්ථි රසා, නත්ථි ජිව්හාවිඤ්ඤාණං, නත්ථි ජිව්හාවිඤ්ඤාණවිඤ්ඤාතබ්බා ධම්මා, නත්ථි තත්ථ මාරො වා මාරපඤ්ඤත්ති වා. නත්ථි කායො...පෙ..... නත්ථි මනො, නත්ථි ධම්මා, නත්ථි මනොවිඤ්ඤාණං, නත්ථි මනොවිඤ්ඤාණවිඤ්ඤාතබ්බා ධම්මා, නත්ථි තත්ථ මාරො වා මාරපඤ්ඤත්ති වා'ති.

මේ සූත්‍රයේ දී සමිද්ධි ස්වාමීන් වහන්සේ බුදුරජාණන් වහන්සේගෙන් මාරයා ගැන ප්‍රශ්න කරනවා. 'ස්වාමීනි, මාරයා මාරයා යැයි කියනු ලැබේ. කොපමණකින් මාරයා හෝ මාරයා පැනවීම වන්නේ ද? '

එවිට බුදුරජාණන් වහන්සේ පිළිතුරු දෙනවා - 'සමිද්ධි යම් තැනක ඇස ඇත්තේ ද, රූපයෝ ඇත්තාහු ද, චක්ඛු විඤ්ඤාණය ඇත්තේ ද, චක්ඛු විඤ්ඤාණයට අරමුණු වෙන ධම්ම ඇත්තේ ද, එතැන **මාරයා හෝ මාරයා කියලා පනවන ප්‍රඥප්තියක් තියෙනවා**'. එතැන මාරයා කියලා පනවන්න පුළුවන්.

බුදුරජාණන් වහන්සේ විඤ්ඤාණය මායාකාරයෙකුට උපමා කරනවා. මේ මැජික් එකට, මායාවට අහුවෙන කෙනාට, විඤ්ඤාණය කියන දෙය එහෙමම පිළිගන්න කෙනාට මාරයා ඉන්නවා. තමන් ළඟ මාරයා ඉන්නවාද, නැත්ද කියලා බලාගන්න හොඳ විදියක් මේක.

ඇසට, කනට, නාසයට, දිවට, කයට විතරක් නෙවෙයි, මනසටත් මේ විදියටම බුදුරජාණන් වහන්සේ මාරයා හෝ මාර ප්‍රඥප්තිය ඇතිවෙන හැටි දේශනා කරනවා.

ඊළඟට බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා - 'සමිද්ධි යම් තැනක ඇස නැතිනම්, රූප නැතිනම්, චක්ඛු විඤ්ඤාණය නැතිනම්, චක්ඛු විඤ්ඤාණයට අරමුණු වෙන ධම්ම නැතිනම්, එතැන මාරයා හෝ මාරයා කියලා පනවන ප්‍රඥප්තියක් තියෙන්නේ නැහැ' කියලා. එතැන මාරයා කියලා පනවන්න බැහැ. අනිත් ආයතන වලටත් බුදුරජාණන් වහන්සේ මේ ආකාරයටම දේශනා කරනවා.

දැන් මාරයා ඉන්නේ කොයි වෙලාවටද, මාරයා නැත්තේ කොයි වෙලාවටද කියලා තමන්ටම තේරෙන්න ඕන. ආයතන හය තියෙනවා නම් මාරයා ඉන්නවා, ආයතන හය නැතිනම් මාරයා නැහැ. එතකොට මාරයාගෙන් මිදෙන්න නම් ආයතන වලින් මිදෙන්න වෙනවා. එහෙනම් මාරයාගෙන් මිදෙන්න - අමර වෙන්න - මේ ජීවිත කාලය තුළ පුළුවන්. රහතන් වහන්සේට ජීවත්ව සිටිද්දීම මාරයාගෙන් මිදෙන්න පුළුවන් වුණා. ඒ නිසායි අජර-අමර කියන්නේ.

විඤ්ඤාණයෙන් දතයුතු ධම්ම ගැනත් අපි හොඳට විමසන්න ඕන. මේ සම්බන්ධව මතක් කරගත යුතු තවත් සූත්‍රයක් තමයි මාලුඞ්ක්‍යපුත්ත සූත්‍රය[4]. බුදුරජාණන් වහන්සේ මාලුඞ්ක්‍යපුත්ත ස්වාමීන් වහන්සේගෙන් අහනවා - 'මාලුඞ්ක්‍යපුත්ත යම්කිසි චක්ඛුවිඤ්ඤෙය්‍ය වූ රූපයක් තියෙනවා නම්, ඒ රූපය දැන් පෙනෙන්නෙත් නැහැ, අතීතයේ දැකලාත් නැහැ, අනාගතයේ දකින්න ලැබෙන්නෙත් නැහැ, කවදා හරි දකින්න ලැබෙයි කියලා හිතන්නත් බැහැ, එහෙම රූපයකට චන්දයක්, රාගයක් ඇතිවෙයිද' කියලා. 'නැත ස්වාමිනි' කියනවා. එතකොට බුදුරජාණන් වහන්සේ කියනවා, 'එහෙනම් මාලුඞ්ක්‍යපුත්ත මෙන්න මෙහෙම හික්මෙන්න - **දිට්ඨෙ දිට්ඨමත්තං, සුතෙ සුතමත්තං, මුතෙ මුතමත්තං, විඤ්ඤාතෙ විඤ්ඤාතමත්තං**'. දැකීම දැකීම පමණක් වුණොත් චක්ඛුවිඤ්ඤෙය්‍ය වූ රූපයක් තියෙන්න බැහැ. චක්ඛුවිඤ්ඤෙය්‍ය වූ රූපයක් නැතිනම් ඇහැ තියෙන්නත් බැහැ. රූප නැත්නම් ඇහැට කරන්න කෘත්‍යයක් නැහැ. ඇහැක් තියෙනවා කියන එකේ තේරුමක් නැහැ.

ඇහැ සහ රූප හටගත්තේ නැතිනම් චක්ඛු විඤ්ඤාණයකුත් තියෙන්න බැහැ. මධුපිණ්ඩික සූත්‍රයේ[5] සඳහන් වෙනවා - **චක්ඛුඤ්ච පටිච්ච රූපෙ ච උප්පජ්ජති චක්ඛුවිඤ්ඤාණං තිණ්ණං සඞ්ගති ඵස්සො** - ඇහැ සහ රූප නිසා චක්ඛු විඤ්ඤාණය හටගන්නවා කියලා. එහෙනම් ඇහැ සහ රූප හටගත්තේ නැත්නම් චක්ඛු විඤ්ඤාණය හටගන්න බැහැ. ඒ තුන නැතිනම් චක්ඛුවිඤ්ඤෙය්‍ය වූ රූපයක් කියලා ධර්මතාවයක් තියෙන්නත් බැහැ. අපට එහෙම ස්වභාවයක් හිතාගන්න බැරි වුණාට ඇහැ, රූප, චක්ඛු විඤ්ඤාණය ඉක්මවා ගිය මනසට, චක්ඛුවිඤ්ඤෙය්‍ය වූ රූප ඉක්මවා ගිය මනසට එහෙම ස්වභාවයක් තියෙනවා. ඒ තමයි මාරයා ඉක්මවා ගිය මනස. ඕවා තුළ ජීවත්වෙනවා නම් එතන මාරයා ඉන්නවා කියලා මේ සම්බුද්ධි සූත්‍ර වල සඳහන් වෙනවා.

[4] මාලුඞ්ක්‍යපුත්ත සූත්‍රය - සංයුත්ත නිකාය, සළායතනවග්ගය, වෙදනා සංයුත්තය, ඡලවග්ගය

[5] මධුපිණ්ඩික සූත්‍රය - මජ්ඣිම නිකාය, මූලපණ්ණාසකය, සීහනාද වග්ගය.

මාරයා සමග ඉන්න කැමතිද, මාරයාගෙන් මිදෙන්න කැමතිද කියලා හොඳට හිතලා බලන්න. මාරයාගෙන් මිදෙන්න නම් ආයතන හයෙන්ම මිදෙන්න වෙනවා. ආයතන තියෙනතාක් කල් එතන මාරයා ඉන්නවා. ආයතන හටගෙන නැතිවුණා කියලා බැලුවත්, ඒ කියන්නේ ඇතිවෙලා නැතිවෙන ධර්මතාවය බැලුවත් මාරයා ඉන්නවා කියලා නුවණට පෙනෙන්න ඕන. ඒක හරියට මාරයා ඇතිවෙලා නැතිවුණා කියලා කියන කියමනක් වගේ වෙනවා. එතකොට පෙර නොතිබීම හටගෙන, ඉතුරු නැතුවම නිරුද්ධ වුණා කියලා කියනවා නම් එතන මාරයාත් පෙර නොතිබීම හටගෙන, ඉතුරු නැතුවම නිරුද්ධ වුණා කියලා කියන්න වෙනවා. එතකොට ක්ෂණයක් ක්ෂණයක් පාසා මාරයාත් උපදිනවා.

අතරක් නැතුව ආයතන ඉතාම වේගයෙන් ඇතිවෙනවා නැතිවෙනවා කියලා කියනවා නම්, මේ ඇතිවීම නැතිවීම කොච්චර වේගයෙන් වුණත් මාරයා හැම මොහොතේම ඉන්නවා. (චිත්‍රපටියක වෙන වෙනම තියෙන රූප රාමු වේගයෙන් යනකොට රඟපෑමක්, සජීවීකරණයක් තියෙන බවක් පෙනෙනවා වගේ). ඒ නිසා ඇතිවීම නැතිවීම බැලීම තුළින් විතරක් මාරයා ඉක්මවා යන්න බැරි බව නුවණට වැටහෙන්න ඕන.

සම්ද්ධි-මාරපඤ්හ සූත්‍ර දේශනාවේ මේ ධර්ම කරුණ පැහැදිලිව පෙන්නලා තියෙනවා. එතකොට මාරයා නැතිවෙන්න නම් ඇහැ නැතිවෙන්න ඕන - **නත්ථි චක්ඛු, නත්ථි රූපා, නත්ථි චක්ඛුවිඤ්ඤාණං, නත්ථි චක්ඛුවිඤ්ඤාණවිඤ්ඤාණතබ්බා ධම්මා** වෙන්න ඕන. එතකොට තමයි **නත්ථි මාරෝ වා, මාරපඤ්ඤත්ති වා** වෙන්නේ. ඔය කියන මාරයා එතකොට නැහැ. දැනට නම් මාරයා අපේ ළඟින්ම ඉන්නවා. ඒ නිසා මාරයා නැතිකරගන්න නම් ඇහැ, රූප, චක්ඛු විඤ්ඤාණය ඇසුරු නොවෙන්න ඕන. ඒ වගේම චක්ඛු විඤ්ඤාණයෙන් දතයුතු ධර්මත් නැතිවෙන්න ඕන. එදාට මාරයා අප ළඟ නැහැ කියන්න පුළුවන් වෙයි. එතකොට මාරයාත් එක්ක ඉන්නවාද, මාරයාගෙන් මිදෙනවාද කියන එක තියෙන්නේ තමන් ළඟ බව වැටහෙන්න ඕන.

සමිද්ධි-සත්තපඤ්ඣ සූත්‍රය

'සත්තො සත්තොති භන්තෙ වුච්චති, කිත්තාවතා නු ඛො භන්තෙ සත්තො වා අස්ස සත්තපඤ්ඤත්ති වාති' - සත්ව, සත්ව යයි කියනු ලැබේ, ස්වාමිනි කොපමණකින් සත්ත්ව හෝ සත්ත්ව ප්‍රඥප්ති හෝ වන්නේ ද කියලා සමිද්ධි ස්වාමින් වහන්සේ ප්‍රශ්න කරනවා.

කලින් සඳහන් කළ සමිද්ධි-මාරපඤ්ඣ සූත්‍රය තුළ තියෙන ආකාරයටම ඉතිරි පාලි වචන ටික යෙදෙනවා. 'සමිද්ධි යම් තැනක ඇස ඇත්තේ ද, රූපයෝ ඇත්තාහු ද, චක්ඛු විඤ්ඤාණය ඇත්තේ ද, චක්ඛු විඤ්ඤාණයෙන් දතයුතු ධර්මයෝ ඇත්තාහු ද, එහි **සත්ත්වයා හෝ සත්ත්වයා යන පැනවීම හෝ ඇත්තේය**'.

'සමිද්ධි යම් තැනක ඇස නැත්තේ ද, රූපයෝ නැත්තාහු ද, චක්ඛු විඤ්ඤාණය නැත්තේ ද, චක්ඛු විඤ්ඤාණයෙන් දතයුතු ධර්මයෝ නැත්තාහු ද, එහි සත්ත්වයා හෝ සත්ත්වයා යන පැනවීම හෝ නැත්තේය'.

ඒ වගේ ආයතන හයටම කියනවා. එතකොට මාරයා පැනෙව්වා වගේ සත්ත්වයාත් පැනවෙන්නේ ඒ ආකාරයටමයි. එතනින් අපට ගන්න වෙන්නේ සත්ත්වයා ඉන්න හැම තැනකම මාරයාත් ඉන්නවා කියලායි. 'මම හිටියොත් මාරයා' ඉන්නවාමයි. ඔය දෙන්නාම ඉන්නේ කවුරු හිටියොත් ද? ආයතන තිබුණොත්. ආයතන ඉපදුණොත් ඔය දෙන්නාම උපදිනවා. ආයතන නැති වුණොත් ඔය දෙන්නාම නැතිවෙනවා. ඇතිවෙන-නැතිවෙන ආයතන තිබුණොත් ඔය දෙන්නාම ඇතිවෙනවා-නැතිවෙනවා. වේගය වැඩි වුණොත්, නොකඩවා ඔය ඇතිවෙන-නැතිවෙන සිද්ධිය වුණොත් අර චිත්‍රපටිය වගේ, ඇතිවෙන-නැතිවෙන 'මමත්' ඉන්නවා, මාරයාත් ඉන්නවා. අපට මාරයා ඉන්නවා කියලා පෙනෙන්නේ නැහැ, තමන්ව විතරයි පෙනෙන්නේ!

සමිද්ධි-දුක්ඛපඤ්හ සූත්‍රය

'දුක්ඛං දුක්ඛන්ති භන්තෙ වුච්චති, කිත්තාවතා නු ඛො භන්තෙ දුක්ඛං වා අස්ස දුක්ඛපඤ්ඤත්ති වාති' - මෙතන දී දුක සහ දුක්ඛ ප්‍රඥප්තිය පවතින්නේ කුමකින්ද කියලා සමිද්ධි ස්වාමීන් වහන්සේ ප්‍රශ්න කරනවා.

'සමිද්ධිය, යම් තැනක ඇස ඇත්තේ ද, රූපයෝ ඇත්තාහු ද, චක්ඛු විඤ්ඤාණය ඇත්තේ ද, චක්ඛු විඤ්ඤාණයෙන් දතයුතු ධර්මයෝ ඇත්තාහු ද, එහි **දුක හෝ දුක යන පැනවීම හෝ ඇත්තේය**'. (අනෙක් ආයතන වලටත් ඔය ආකාරයටම යෙදෙනවා).

'සමිද්ධි යම් තැනක ඇස නැත්තේ ද, රූපයෝ නැත්තාහු ද, චක්ඛු විඤ්ඤාණය නැත්තේ ද, චක්ඛු විඤ්ඤාණයෙන් දතයුතු ධර්මයෝ නැත්තාහු ද, එහි දුක හෝ දුක යන පැනවීම හෝ නැත්තේය'.

එතකොට ආයතන තියෙනවා නම් එතන මාරයාත් ඉන්නවා, සත්ත්වයාත් ඉන්නවා, දුකත් තියෙනවා. ආයතන නැතිනම් ඔය එකක්වත් පැනවෙන්නේ නැහැ. ඊළඟට;

සමිද්ධි-ලොකපඤ්හ සූත්‍රය

'ලොකො ලොකොති භන්තෙ වුච්චති, කිත්තාවතා නු ඛො භන්තෙ ලොකො වා අස්ස ලොකපඤ්ඤත්ති වාති' - ලෝකය සහ ලෝකයප්‍රඥප්තිය පවතින්නේ කුමකින්ද කියලා සමිද්ධි ස්වාමීන් වහන්සේ ප්‍රශ්න කරනවා.

'සමිද්ධිය, යම් තැනක ඇස ඇත්තේ ද, රූපයෝ ඇත්තාහු ද, චක්ඛු විඤ්ඤාණය ඇත්තේ ද, චක්ඛු විඤ්ඤාණයෙන් දතයුතු ධර්මයෝ ඇත්තාහු ද, එහි **ලෝකය හෝ ලෝකය යන පැනවීම** හෝ ඇත්තේය'.

'සමිද්ධි යම් තැනක ඇස නැත්තේ ද, රූපයෝ නැත්තාහු ද, චක්ඛු විඤ්ඤාණය නැත්තේ ද, චක්ඛු විඤ්ඤාණයෙන් දතයුතු ධර්මයෝ

නැත්තාහු ද, එහි ලෝකය හෝ ලෝකය යන පැනවීම හෝ නැත්තේය'. (අනෙක් ආයතන වලටත් ඔය ආකාරයටම යෙදෙනවා).

එතකොට මාරයා, සත්ත්වයා, දුක, ලෝකය - ආයතන ඇති කල්හි ඔය සියල්ලම තියෙනවා. ආයතන නැතිනම් ඔය එකක්වත් පැනවෙන්නේ නැහැ.

මධුපිණ්ඩික සූත්‍රයත් මෙතැනට ගළපගන්න පුළුවන්. **චක්ඛුස්මිං සති, රූපෙ සති, චක්ඛුවිඤ්ඤාණෙ සති** - ඇස, රූප, චක්ඛුවිඤ්ඤාණය ඇති කල්හි, ඵස්සයක් පැනවෙනවා. ආයතන ස්පර්ශයක් තියෙනවා නම් ඔය සියල්ලම තියෙනවා. ලෝකයම තියෙනවා, මාරයාත් ඉන්නවා, සත්ත්වයාත් ඉන්නවා, දුකත් තියෙනවා. ආයතන හටගත්තොත් ඔය සියල්ලම හටගන්නවා. එහෙනම් ආයතන 'ඇතිවුණා-නැතිවුනා' කිය කියා ඉඳලා හරියන්නේ නැහැ. අපි ඇතිවෙන-නැතිවෙන මාරයා, සත්ත්වයා, දුක, ලෝකය තියාගත්තොත් මාරයාට, සත්ත්වයාට, දුකට, ලෝකයට අහුවෙන බව දකින්න ඕන.

ඉතින් මම මේ සූත්‍ර තුළින් පෙන්වන්න හදන්නේ - 'ඇතිවෙනවා-නැතිවෙනවා' කියලා බල බලා ඉඳලා ඇති ද කියන එකයි. එහෙම බැලීම ලෝකෝත්තර මාර්ගය - ලෝකයෙන් එතෙර වෙන මාර්ගය නොවෙයි කියන එක තේරුම් ගන්න. ඒක ලෝකයට අයිති විමසීමක්. අපි කරන්නේ <u>රූපයේ අනිත්‍ය බලනවා, අනිත්‍ය වූ රූපය දකින්නේ නැහැ</u>. තියෙන රූපයක අනිත්‍ය දකින්න අපි හරි දක්ෂයි - රූපයක් තියෙනවා ඕක වෙනස් වෙනවා, ඇතිවෙනවා-නැතිවෙනවා කියලා බලනවා. නමුත් <u>**අනිත්‍ය වූ රූපයක්**</u> දිහා නේ ඔය බැලුවේ කියන එක අපට පෙනෙන්නේ නැහැ. එහෙම දකින්න අපි තවම දක්ෂ මදි. මෙතැන හොඳට නුවණින් විමසිය යුතු ගැඹුරු තැනක්.

නිත්‍ය කරන්න බැරි අර්ථයෙන් අනිත්‍යයි කියලා දකින්න ඕන. අනිත්‍ය කියන්නේ නිත්‍ය කරන්න බැහැ, පිහිටුවන්න බැහැ කියන අර්ථයයි. අපි නිතර කියන උපමාව මතක් කරගත්තොත් - වතුරේ ඉන්න බල්ලා අනිත්‍යයි කිය කියා ඉන්න පුළුවන්. ඉන්න බල්ලා අනිත්‍යයි කියන එකයි, අනිත්‍ය වූ බල්ලෙක් කියන එකයි අවස්ථා දෙකක්. අනිත්‍ය වූ බල්ලා කියන කොට බල්ලාව පිහිටුවන්න බැහැ.

බල්ලාගේ අනිත්‍ය බලනවා කියන්නේ ඉන්න බල්ලා වෙනස් වෙනවා, ඇතිවෙනවා-නැතිවෙනවා කියලා බලනවා. ක්ෂණයකටවත් පිහිටුවන්න බැහැ කියන එකට තමයි ලෝකෝත්තර මාර්ගයේ අනිත්‍ය කියලා කියන්නේ. චිත්තක්ෂණයකට හෝ පිහිටුවොත් ඒ ක්ෂණයට නිත්‍ය වෙනවා නේද කියලා මේ විමසන ක්‍රම දෙක අතර වෙනස හොඳට නුවණින් දකින්න දක්ෂ වෙන්න.

ඕනෑම ආයතනයක් ඇතිවෙනවා-නැතිවෙනවා කියලා බලන කොට, ඇතිවෙන මොහොතේ ඒ ආයතනය හටගෙන තියෙනවා. එතන දී ආයතන පිරිසිඳ දැකලා නැහැ. හටගත්තා කියන්නේ ඒ මොහොතේ දී සමුදය සහ ඵලය කියන දෙකම යෙදිලා. දුක සහ දුක්ඛ සමුදය යෙදිලා. ඒ හටගත්ත දෙය ඇතිවෙලා-නැතිවෙන එක ලෝක ධර්මතාවයක්. අපි ඇතිවෙලා-නැතිවෙන දෙය ඉක්මවා ගිහිල්ලා නැහැ. ඒකෙන් මිදිලා නැහැ. පටිච්චසමුප්පන්න බව දැකලා නැහැ.

ඒ නිසා ලෝකයෙන් එතෙර වෙන්න නම් පෙර නොතිබීම හටගෙන, ඉතුරු නැතුවම නැතිවෙනවා කියලා බල බලා ඉඳලා හරියන්නේ නැහැ. ඊට එහා දෙයක් අපි දකින්න ඕන - හටගත්ත මොහොතේ දී, වර්තමානයේ දී මොකක්ද වුණේ කියලා විමසන්න ඕන. බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා අතීතය ගැන බලලා වැඩකුත් නැහැ, අනාගතය ගැන බලලා වැඩකුත් නැහැ, නමුත් වර්තමානයේ කරන්න දෙයක් තියෙනවා. ඒ තමයි **පච්චුප්පන්නඤ්ච යො ධම්මං තත්ථ තත්ථ විපස්සතී** [6] වීම. වර්තමානයේ ප්‍රත්‍යයන්ගෙන් උපන් ධර්මතාවයක් තියෙනවා නම් එතන එතන විදර්ශනා කරන්න කියලා දේශනා කරනවා. ඇතිවෙලා-නැතිවෙනවා කියන එක ලෝකෝත්තර විදර්ශනාවක් නෙවෙයි. සතර සතිපට්ඨානයට අනුව නිවැරදි විදර්ශනය වෙන්නේ ඇතිවුණේ කොහොමද කියලා සමුදය ධම්මානුපස්සී වුණොත් විතරයි. වර්තමානයේ - හටගත් ක්ෂණයේ දී සමුදය ධම්මානුපස්සී වෙන්න ඕන.

රූපය ගැන සමුදය ධම්මානුපස්සී වුණොත් ඒක කායානුපස්සනාව වෙනවා. වේදනාවන් ගැන සමුදය ධම්මානුපස්සී වුණොත් ඒක

[6] භද්දෙකරත්ත සූත්‍රය - - මජ්ඣිමනිකාය, උපරිපණ්ණාසකය, විභඞ්ගවග්ගය.

වෙදනානුපස්සනාව වෙනවා. සිතක සමුදය ධම්මානුපස්සී වුණොත් චිත්තානුපස්සනාව වෙනවා. හිතට අරමුණු වෙන ධම්ම ගැන සමුදය ධම්මානුපස්සී වුණොත් ධම්මානුපස්සනාව වෙනවා. සතර සතිපට්ඨානය තමයි එකම මාර්ගය කියලා බුදුරජාණන් වහන්සේ දේශනා කරලා තියෙනවා. ඇතිවෙනවා-නැතිවෙනවා කියලා බලන එක නෙවෙයි. ඇතිවීම-නැතිවීම මේ ලෝකයාට ඉන්ද්‍රිය ගෝචර දෙයක්. ශබ්දයක් ඇතිවුණා - ඒ ශබ්දය නැතිවුණා කියලා කොහොමද දැනගත්තේ? ඉන්ද්‍රියකින්, ආයතනයකින්. කන හටගත්ත නිසා තමයි ශබ්දයක් ඇතිවුණා නැතිවුණා කියලා කිව්වේ.

එතකොට කන හටගෙන නම් සම්බුද්ධ-මාරපඤ්හ සූත්‍රයට අනුව එතැන මාරයාත් හටගෙන ඉවරයි. සත්ත්වයා, දුක, ලෝකය කියන මේ සියල්ලම එතැන හටගෙන. විඤ්ඤාණ භයට විඤ්ඤෙය්‍ය වූ ධර්මතා තියෙනකම් එතන මාරයා ඉන්නවා. විඤ්ඤෙය්‍ය වූ දෙයක් ගැන තමයි ඔය ඇතිවුණා නැතිවුණා කියලා කිව්වේ. ඇතිවුණ නැතිවුණ බව දැනගත්තේ විඤ්ඤාණයකින්. මාරයා, සත්ත්වයා, දුක, ලෝකය තියෙනවා නම් ඇතිවුණා නැතිවුණා කියලා බලන එක ලෝකෝත්තර මාර්ගය වෙන්න බැහැ නේද? ඒවා ආයතන වලට ගෝචර දෙයක් මිසක් ආයතන ඉක්මවා යෑමක් නෙවෙයි.

ආයතන ඉක්මවීම සඳහා අවශ්‍ය මාර්ගයකුයි බුදුරජාණන් වහන්සේ නමක් දේශනා කරන්නේ. ඉතින් දහම දකින්න ඕන අයට මේ දේශනා හතරෙන්ම මේ ගැන තේරුම් ගන්න පුළුවන්. මාරයාගෙන්, සත්ත්වයාගෙන්, දුකෙන්, ලෝකයෙන් එතර වෙන්න ඕන නම් අපි බුද්ධ උපදේශය පිළිපදින්න ඕන. වර්තමානයේ යමක් හටගත්තා නම් බුදුරජාණන් වහන්සේ ඒ පිළිබඳව මොකක්ද කරන්න කිව්වේ? සතර සතිපට්ඨානය වඩන්න කියනවා. **සමුදය ධම්මානුපස්සී වා** වෙන්න කියනවා. එතන එතනම විදර්ශනය කරන්න කියනවා. **පච්චුප්පන්නඤ්ච යො ධම්මං තත්ථ තත්ථ විපස්සති** වෙන්න කියනවා. ඔය දෙය කරන්නේ නැතුව අපට ඕන විදියට ඇතිවෙලා-නැතිවෙන එක බල බලා හිටියාට ලෝකයෙන් එතර වෙන්න බැහැ. හට නොගත්තොත් විතරයි එතරවීමක් වෙන්නේ. ඒ නිසා එතර වෙන්න නම් අපට බුද්ධ දේශනාවට අනුව ක්‍රියාකරන්න වෙනවා. බුදුරජාණන් වහන්සේ දීපු වැඩ පිළිවෙල හොයන්න වෙනවා.

දුකෙන් මිදෙන්න තියෙන එකම මාර්ගය සතර සතිපට්ඨානය කියලා බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා. එහෙම නම් වර්තමානයේ සතර සතිපට්ඨානය වඩන්න වෙනවා. සමුදය ධම්මානුපස්සී වෙන්න වෙනවා. හටගත්ත දෙය හටගත්තේ කොහොමද කියලා බලන්න වෙනවා. මාරයා, සත්වයා, ලෝකය, දුක හටගත්තා නම් හටගත්තේ කොහොමද කියලා බලන්න වෙනවා. කවුරු මොනවා දේශනා කළත්, තමන් වඩන්නේ බුදුරජාණන් වහන්සේ දේශනා කරපු ආර්ය මාර්ගයද නැත්නම් තවම ලෝකයට අයිති මාර්ගයක්ද කියලා හොඳට නුවණින් තම තමන්ටම විමසන්න වෙනවා.

ලෞකික මාර්ගයයි, ලෝකෝත්තර මාර්ගයයි වෙන් කරලා දැනගන්න තමන් දක්ෂ වෙන්න ඕන. (මහාචත්තාරීසක සූත්‍රය[7]) මේ වඩන්නේ ලෝකයට අයිති දෙයක්ද, ලෝකයෙන් එතර වෙන මාර්ගයක්ද කියන එක හොයාගන්න දක්ෂ වෙන්න. දුක ඇතිවෙලා නැතිවෙන මට්ටම බලලා නවතිනවා ද, දුකෙන් එතරවෙනවා ද කියන එක තම තමන්ට අයිති වැඩක්. මාරයා ඇතිවෙලා නැතිවෙන මට්ටම බලලා නවතිනවා ද, මාරයා ඉක්මවනවාද කියලා බලන එක තම තමන්ට අයිති වැඩක්.

පච්චුප්පන්නඤ්ච යෝ ධම්මං තත්ථ තත්ථ විපස්සතී කියන තැන විපස්සතී කියන්නේ මොකක්ද කියන එක සතර සතිපට්ඨානයෙන් පැහැදිලි කරනවා. සතර සතිපට්ඨානයේ හැමතැනකම කියන්නේ සමුදය ධම්මානුපස්සී වෙන්න කියලා. හටගෙන නැතිවුණාට කමක් නැහැ, හටගත්තේ කොහොමද කියලා හොයන්න. එතකොට සතර සතිපට්ඨානය පටන්ගත්තා වෙනවා.

එතකොට මේ සම්ද්ධි සූත්‍ර හතරෙන්ම පැහැදිලි වෙනවා ආයතන හටගත්තොත් මාරයා, ලෝකය, සත්ත්වයා, දුක කියන සියල්ලම හටගත්තා කියලා. ආයතනයක් (උදෘ: ඇස) කියන කොට එතන ජාති හතරක් යෙදෙනවා - ඇහැ, රූපය, චක්ඛු විඤ්ඤාණය, චක්ඛු විඤ්ඤෙය්‍ය වූ ධර්මතා. ඔය හතරෙන් එකක් හෝ හටගත්තොත් මාරයාට අහුවුණා, ලෝකයට අහුවුණා, දුක උපන්නා, සත්ත්වයා

[7] මහාචත්තාරීසක සූත්‍රය - මජ්ඣිම නිකාය, උපරිපණ්ණාසකය, අනුපදවග්ගය.

හටගත්තා - එතකොට එතන 'මමත්' උපන්නා. එහෙනම් ඕවා හටගත්තේ කොහොමද කියලා අපට හොයන්න වෙනවා. සමුදයක් නිසායි හටගන්නේ. ඔය හතරම පටිච්චසමුප්පන්න ධර්ම කියලා බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා. ඉබේ පහල වෙනවා නෙවෙයි. ඒවා සංඛතයි, හේතුප්‍රත්‍යයෙන් හටගන්නේ. සංඛතයි, පටිච්චසමුප්පන්නයි, අවිද්‍යා ප්‍රත්‍යයෙන් කියලා දේශනා කරනවා. දැන් අපි ඒ ටික හොයාගන්න ඕන. ඒකට තමයි සමුදය ධම්මානුපස්සී වෙනවා කියන්නේ. ඇහැ, රූපය, චක්ඛු විඤ්ඤාණය, චක්ඛු විඤ්ඤෙය්‍ය වූ ධර්මතා හටගත්තා නම්, ඔය හතරේම විමසන්න දෙයක් තියෙනවා - හටගත්තේ කොහොමද කියලා බලන්න තියෙනවා.

අපි ප්‍රායෝගිකව මේ කියපු ටික අත්දකින්න උත්සාහ කරමු. දැන් ලේනෙක් කෑගහනවා. එතන ලෝකයක් හටගත්තා, රූපයක් හටගත්තා කියලා පෙනෙනවා ද? ඌ කෑගහන ශබ්දයත් ඇතිවෙලා නැතිවෙනවා නේද? එතකොට ඇතිවෙනවා-නැතිවෙනවා කියලා කිව්වේ ආයතන වලින් දැනගෙන ද, නැතිනම් නුවණින් දැනගෙන ද? ආයතනයකින් තමයි දැනගෙන තියෙන්නේ. කණෙන් තමයි කියන්නේ ඔය ශබ්දය ඇතිවෙනවා-නැතිවෙනවා කියලා. ඒක ආයතනයට ගෝචර වුණ දෙයක්. එහෙනම් ඇතිවීම-නැතිවීමක් ගැන කිව්වේ ආයතන වලට අහුවෙලා නේද? ශබ්දය පිලිඅරගෙන, ශබ්දය ඇතිවෙනවා-නැතිවෙනවා කියලා කියනවා. රූපය පිලිඅරගෙන, ඒ රූපය ඇතිවෙනවා-නැතිවෙනවා කියලා කියනවා. ඒක ලෝකයේ සිදුවෙන දෙයට අවධානය යොමු කරන ඕනෑම කෙනෙක් දන්න දෙයක්. ඇතිවෙනවා-නැතිවෙනවා කියන්නේ පටිච්චසමුප්පාදය නෙවෙයි. ඇතිවෙනවා-නැතිවෙනවා කියන්නේ ඉන්ද්‍රිය ගෝචර දෙයක්. ඒක ආයතන වලින් කියන දෙයක්, ලෝකයට අයිති කතාවක්. ඔය ලෝකය ඉක්මවා යන දර්ශනය නෙවෙයි. ඕක ලෝකයට අයිති ඇත්තක්.

ලෝකයට අයිති ඇත්ත ආර්ය දර්ශනයේදී මුසාවක් වෙනවා.[8] (ද්වයතානුපස්සනා සූත්‍රය) ආර්ය දර්ශනය ගැන අහලා තියෙන

[8] ද්වයතානුපස්සනා සූත්‍රය - බුද්දක නිකාය, සුත්ත නිපාතය, මහා වග්ගය

කෙනාටයි ඒ බව පෙනෙන්නේ - මෙච්චර කල් බොරුවක් ගැන නේ කතා කරලා තියෙන්නේ කියලා. ශබ්දය ඇතිවෙනවා-නැතිවෙනවා කියන එක බොරුවක්මත් නෙවෙයි. හැබැයි ඒක බොරුවක් නොවෙන්නේ කාටද? ලෝකයාට. විඤ්ඤාණයෙන් කියපු දෙයක් පිළිඅරගෙන තමයි ඔහොම කියන්නේ. මැජික්කාරයා කියපු දෙය ඒ විදියටම පිලිගත්තා. එතකොට ඒක ඉක්මවා යන්න නම් ප්‍රඥාවෙන් දකින්න වෙනවා. ප්‍රඥාව වඩන්න නම් බුදුරජාණන් වහන්සේගේ ධර්මය හොයන්න වෙනවා. අපට ඕන ඕන දේවල් කරලා හරියන්නේ නැහැ. ඇත්ත දකින්න නම් බුද්ධ දේශනාව මොකක්ද කියලා නුවණින් විමසන්න වෙනවා. එතකොට පෙනෙනවා සමුදය ධම්මානුපස්සී විය යුතුයි කියලා. ඇතිවෙලා-නැතිවෙනවා කියන තැනින් එහාට ගිහිල්ලා හටගත්තේ කොහොමද කියලා බලන්න වෙනවා. ඇතිවුණ-නැතිවුණ ශබ්දය පච්චුප්පන්න වූ මොහොතේ හටගත්තේ කොහොමද කියලා හොයලා බලන්න වෙනවා.

එතකොට මේ දෙළොස් ආයතනයම ඇතිවෙනවා නැතිවෙනවා තමයි. ඒවා ඇතිවෙන්නේ කොහොමද කියලා බලන්න. එහෙම හොයන කොට ලෝකයට අයිති හේතු ටික තමයි අපට මුලින්ම අහුවෙන්නේ. ඒ හේතු අවිද්‍යාව දක්වාම හොයාගෙන යන්න ඕන. හේතු හොයාගෙන යනකොට මුළාව, මෝඩකම අහුවෙනකම්ම සමුදය බලන්න ඕන. වර්තමාන සිද්ධියම විමසන්න ඕන. ටිකක් නුවණින් බැලුවොත් පෙනෙනවා ඇතිවෙලා නැතිවෙනවා කියන එකත් කාලයට අහුවෙලා කියන කතාවක් කියලා. පෙර නොතිබීම හටගත්තා කියන කොට අතීතයටත් අහුවෙනවා, වර්තමානයටත් අහුවෙනවා. ඉතුරු නැතුවම නිරුද්ධ වෙලා කියන කොට වර්තමානයටත් අහුවෙලා, අනාගතයටත් අහුවෙලා. එතැනිනුත් පෙනෙනවා ඔක ලෝකයට අයිති විමසීමක් කියලා.

එහෙනම් ලෝකෝත්තර දර්ශනය මොකක්ද කියලා හොයාගන්න තමන් දක්ෂ වෙන්න ඕන. බුදුරජාණන් වහන්සේ දේශනා කරන ධර්මය මොකක්ද කියලා හොයන්න. අපට ඕන ඕන දේවල් කරමින් ඉඳලා නිවන් මාර්ගය, ආර්ය මාර්ගය වැඩෙන්නේ නැහැ. දහමට ගළපලාම හොයන්න වෙනවා. මේ ආයතන හටගත්තා නම් ලෝකය හටගෙන, මාරයා හටගෙන, සත්ත්වයා හටගෙන, දුක හටගෙන බව

නුවණින් දකින්න. හටගත්ත මොහොතේ හටගත්තේ කොහොමද කියලා හොයාගත්තොත්, ඒ සමුදය නොයෙදුණොත් හටගන්නේ නැති බව නුවණට වැටහෙනවා. හටගන්න හේතු යෙදුණොත් හටගන්නවා. හටගන්න හේතු යෙදුණේ නැත්නම් හටගන්න බැහැ. ඔන්න ඔය ධර්මතාවයටයි පටිච්චසමුප්පාදය කියන්නේ. ඇතිවෙලා නැතිවෙන එක පටිච්චසමුප්පාදය නෙවෙයි. **ඉමස්මිං සති ඉදං හොති, ඉමස්මිං අසති ඉදං න හොති** - මෙය ඇති කල්හි මෙය වෙයි, මෙය නැතිනම් ඔහොම වෙන්න බැහැ කියන ධර්මතාවයටයි පටිච්චසමුප්පාදය - ඉදප්පච්චයතාව කියන්නේ. ඇතිවෙලා නැතිවෙනවා කිව්වාට ඒ ධර්මතාවය දකින්න බැහැ.

සමුදය හොයාගත්තොත් සමුදය තියෙනකම් ඵලය තියෙනවා කියලා කියන්න පුළුවන්. සමුදයත් තමන්ගේ ප්‍රඥාවට අනුව එක එක මට්ටමට අහුවෙනවා.

ප්‍රශ්නය: සමාධිය මනොවිඤ්ඤාණයෙන් කරන දෙයක් ද?

පිළිතුර: සමාධිය කියන්නේ ප්‍රඥාව නෙවෙයි. සමාධිය කියන්නේ හිත එකඟවෙලාද, නැත්ද කියන එක විතරයි. සිද්ධවෙන්නේ මොකක්ද කියලා බලන්නේ නුවණින්. හටගත්තේ කොහොමද කියන එක ප්‍රඥාවෙන් හොයන්න ඕන දෙයක්. සමාධියෙන් වෙන්නේ නීවරණ යටපත් කරන එක පමණයි.

ප්‍රශ්නය: ආයතන පිරිසිඳ දකින කොට ආයතන මුළාව දැකලා රූපයත් නැහැ, රූපය දකින ඇහැත් නැහැ, චක්ඛු විඤ්ඤාණයත් නැහැ, ඒ තුන නැත්නම් ඵස්සයකුත් නැහැ කියලා එතනත් සමුදයක් දකිනවා නේද?

පිළිතුර: නැහැ කියලා බලනවා නෙවෙයි, හටගන්නේ කොහොමද කියලා සමුදයයි හොයාගන්න ඕන. නැහැ කියන එක නෙවෙයි - පටිච්ච සමුප්පන්න බවයි අවබෝධ විය යුත්තේ. අපි නැවතත් ටිකක් ප්‍රායෝගිකව විමසලා බලමු. දැන් මේ මොහොතේ ශබ්දය හටගත්තේ කොහොමද? ලේනෙක් කෑගහනවා ඇහෙනවා. ඒ ඇහෙන වෙලාවේ අපේ ලෝකයට ශබ්දයයි, ලේනෙකුයි හටගත්තා. අපි තවම හටගත්තේ කොහොමද කියලා සමුදය බැලුවේ නැහැ. අපි තවම

දැනගත්තේ ශබ්දය ඇතිවුණා-නැතිවුණා කියලා විතරයි. ඒ ටික කිව්වේ කවුද? විඤ්ඤාණයෙන්. බුදුරජාණන් වහන්සේ විඤ්ඤාණය මායාකාරයෙකුට උපමා කරනවා. එහෙනම් අපි මායාකාරයා කියපු දෙය ඇත්ත කියලා පිලිඅරගෙන ශබ්දය ඇතිවුණා-නැතිවුණා කියලා බල බලා ඉන්නවා. එතනින් එහාට අපි හෙව්වේ නැහැ. එතකොට විඤ්ඤාණය තමයි අපි ගුරු තනතුරේ තියාගත්තේ. මායාකාරී විඤ්ඤාණය කිව්වා ඔය ශබ්දය ඇතිවුණා-නැතිවුණා කියලා.

අපේ ශාස්තෘන් වහන්සේ බුදුරජාණන් වහන්සේ නම් අපි බුදුරජාණන් වහන්සේ කියපු දෙය කරන්න ඕන. ඒ මොකක්ද? සමුදය - හටගත්තේ කොහොමද කියලා බැලිය යුතුයි. අපි තවම එහෙම බැලුවේ නැහැ. සමුදය ධම්මානුපස්සී වුණේ නැහැ. ඉතින් සතිපට්ඨානය පැත්තකින් තියලා අපි විඤ්ඤාණය (මාරයා) ගුරු තනතුරේ තියාගෙන මාර ධර්මය වඩනවා. ඇතිවෙලා-නැතිවුණා කියන එක මාරයා කියන දෙයක්. එහෙම කිව්වේ ආයතන වලින් නිසා ඒක ලෝකයට අයිති දෙයක් මිසක් ලෝකයෙන් එතර වෙන මාර්ගයක් නෙවෙයි නේද? (මෙහෙම කිව්වේ නැත්නම් ඕවා ගැන හිතන්නෙවත් නැහැ! - මාරයා ගුරු තනතුරේ තියාගෙන භාවනා කර කර ඉන්නවා!). මෙතැනින් මිදෙන්න තමයි බුදුරජාණන් වහන්සේ සතිපට්ඨානය දේශනා කරන්නේ. සමුදය ධම්මානුපස්සී වෙන්න කියන්නේ.

එහෙනම් ඒ ශබ්දය, ශබ්දය අහපු කණ, ඒ බව දැනගත්ත විඤ්ඤාණය, ඒ විඤ්ඤාණයෙන් මොනවා හරි දැනගත්තා නම් ඒ ටික - මේ සියල්ලම මාරයා, ලෝකයා, සත්ත්වයා, දුක බව මේ සූත්‍රයේ පැහැදිලිව පෙන්නලා තියෙනවා. ඉතින් මාරයා ඇතිවෙලා-නැතිවෙනවා කිව්වාට මාරයාගෙන් මිදෙන්න බැහැ. මාරයා ආයෙත් ඇතිවෙනවා. දැන් නැතිවුණාට ඊළඟ මොහොතේ ආයෙත් ඇතිවෙනවා. සමුදය යෙදුණොත් ඵලය ඉපදිලා. බුදුරජාණන් වහන්සේ නමක් තමයි පෙන්නන්නේ ඔය දේවල් ඉබේ පහළවෙන ඒවා නෙවෙයි. සමුදයක් නිසාමයි හටගන්නේ. ඒ නිසා සමුදය හොයාගන්න, සමුදය ධම්මානුපස්සී වෙන්න කියලා දේශනා කරනවා.

සමුදය හොයන කොට එක එක ප්‍රඥ මට්ටම් තියෙනවා. ශබ්දය ගැන දැනගත්තේ කන-ශබ්දය-සොතවිඤ්ඤාණයයි නිසා. ඔය තුනේ එකතුවට තමයි සොතසම්ඵස්සය කියන්නේ. ස්පර්ශය නිසා සිද්ධවෙන ටික දැන් සිද්ධවෙලා ඉවරයි. ලෝකයත් ඉපදිලා, මාරයත් ඉපදිලා, සත්ත්වයාත් ඉපදිලා, දුකත් ඉපදිලා. ස්පර්ශයට අහුවුණොත් ඔය ඔක්කෝම උපදිනවා. දැන් විමසලා බැලුවොත් ස්පර්ශයත් ලෝකයට අයිතියි. එහෙනම් ස්පර්ශයේ සමුදයත් හොයාගන්න වෙනවා. ඒ නිසා තමයි මම කිව්වේ සමුදය හොයන කොට තමන්ගේ ප්‍රඥව අනුව එක එක මට්ටමට පෙනෙනවා. ඒකේ මුල අහුවෙනකම් ගැඹුරෙන් ගැඹුරට යන්න ඕන. ස්පර්ශය ගැන කතා කරන කොට තුන්දෙනෙක් අහුවෙනවා නේ. එතකොට ඒ තුන්දෙනත් හටගත්තේ කොහොමද කියලාත් හොයන්න වෙනවා. කන හටගත්තේ කොහොමද, ශබ්දය හටගත්තේ කොහොමද, සොතවිඤ්ඤාණය හටගත්තේ කොහොමද? ඕවා හටගත්තේ නැත්නම් ස්පර්ශය වෙන්න බැහැ.

එතකොට පහළ සිට විමසුවොත් - සොතවිඤ්ඤාණය හටගත්තේ කොහොමද? කනයි-ශබ්දයයි නිසා. එතකොට සොතවිඤ්ඤාණයට සමුදය කනයි-ශබ්දයයි. ඒ දෙක හටගත්තේ නැත්නම් සොතවිඤ්ඤාණය හටගන්න බැහැ. එහෙනම් කනයි-ශබ්දයයි ඇයි හටගත්තේ, කොහොමද හටගත්තේ කියන ධර්මතාවයන් හොයාගත්තොත් දහම දකින්න පුළුවන් වෙයි.

ප්‍රශ්නය: විඤ්ඤාණයෙන් නේද ඒක කිව්වේ?

පිළිතුර: විඤ්ඤාණයෙන් කිව්වා නම් එයා මායාකාරයාද, ඇත්ත කියන කෙනාද? මායාකාරයා. එහෙනම් මාරයාගේ ධර්මය පිලිගත්තා වෙනවා. අපි දැන් කන තියෙනවා කියලා දැනගත්තේ කොහොමද කියලා විමසලා බලමු. ශබ්දය ඇහුණ වෙලාවේ කන ඉපදුනා. කන ඉපදුනා කියලා දන්නේ කොහොමද? ශබ්දය ඇහුණ නිසායි. ඇහුණේ නැතිනම් කනක් ඉපදුනා කියලා කියන්න බැහැ. ඇහුණ හින්දා තමයි කනක් හටගත්තා කියන්නේ.

කන ගැන ඉගෙනගත්ත නැති පොඩි දරුවෙක් ඉන්නවා කියලා හිතමු. අපි එයාගෙන් ඇහුවොත් ඇහුණද කියලා එයා ඇහුණා කියයි. කනෙන්ද ඇහුණේ කියලා ඇහුවොත්, එයා කනක් ගැන කවදාවත් අහලා නැහැ. කන කියන්නේ මොකක්ද කියලා දන්නෙවත් නැහැ. දැන් එයා කියන්නේ නැහැ කන නිසා ඇහුණා කියලා. එයාගේ ලෝකයට කනක් ඉපදිලා නැහැ. දෙන්නටම ඇහුණ නමුත් ඇයි එයාගේ ලෝකයට කන උපදින්නේ නැතුව අපේ ලෝකයට ඉපදුණේ? අපි ඉගෙනගත්ත දෙයක් - පෙර ඇසුරක් මෙතෙන්ට ඇදලා අරගෙන තියෙනවා. ඇසීමේ සිද්ධියට අපි එකතු කරන දේවල් අයිති වෙන්න බැරි බව තේරුම් ගන්න ඕන. ඇසීමේ සිද්ධියට කන අයිති වුණා නම් පොඩි දරුවාටත් ඒක තියෙන්න ඕන. (මේ කියන දෙය අපි කන පනවන හැටි පෙන්වන්න ගන්න උපමාවක් හැටියට විතරක් ගන්න. පොඩි දරුවා රහත්වෙලා කියන එක නෙවෙයි මේ කියන්නේ. වරදවා තේරුම්ගන්න එපා).

එතකොට ඇහෙන නිසායි කන තියෙනවා කියලා අපි දැනගත්තේ. ඇසීම කිව්වේ නැහැ කනෙන් ඇහෙනවා කියලා. අපි ඇසීම ගැන කල්පනා කරලා - හිතන්න ගිහිල්ල තමයි කිව්වේ ඇහෙන්න නම් කනක් තියෙන්න ඕන කියලා. අපි හිතන දේවල් ඇසීම කියන ක්‍රියාවට අයිතිද කියලා හොඳට නුවණින් විමසන්න. ඇසීමේ සිද්ධිය වුණාට පස්සේ තමයි අපි ඇසීම ගැන හිතන්නේ. එහෙනම් ඇසීමේ සිද්ධියට, එයට පසුව අපි හිතන දේවල් අයිති වෙන්න බැහැ. ඒ වුණාට දැන් අපි හිතලා තියෙනවා නේද ඇහෙන්න නම් කනක් තියෙන්න ඕන කියලා? කන කියන්නේ රූපයක්. අපි මොනවා හිතුවත් නැතත් ඇහෙන එක ඇහෙනවා. ඇහෙන සිද්ධිය වෙනවා. ඇහෙන සිද්ධිය ඉවරවෙලා තමයි අපි කල්පනා කරන්නේ. කන තියෙනවා කියලා හිතුව හින්දා නෙවෙයි නේ ඇහුණේ. ඇහුණ හින්දයි හිතුවේ. අපි ඇහුණා විතරයි කියලා නවත්වලා නැහැ, එතන දී කනක් පනවලා ඉවරයි. කන කියන්නේ කයක්. එතකොට ඒකේ කායානුපස්සී වෙන්න නම් කනේ සමුදය හොයාගන්න වෙනවා. කන හටගත්තේ කොහොමද කියලා හොයාගන්න වෙනවා.

සමුදය හොයන කොට කන තියෙන්නේ ඇසීමේ සිද්ධිය තුළ නෙවෙයි කියන බව පෙනෙන්න ඕන. අපේ මෝඩකමට තමයි

කනක් හදලා ඔය සිද්ධියට සම්බන්ධ කරලා තියෙන්නේ. මේ ආයතන ක්‍රියාකාරිත්වය නොදන්නාකමට - ඇසීම ඇසීම පමණයි කියලා නොදන්නාකමට ඇහෙන්න නම් කනක් තියෙන්න ඕන කියනවා. මේ සිද්ධිය හොඳට තේරුම් ගන්න උත්සාහ කරන්න. ඇසීම ඇසීමෙන් නවත්වලා නැති නිසා තමයි කනක් උපද්දලා තියෙන්නේ.

ප්‍රශ්නය: අපට ඇසීම ඇසීමෙන් නවත්වන්න බැහැ නේද?

පිළිතුර: අපි මේ ඉන්න මට්ටමේ දී ඒක කරන්න බැහැ. නමුත් නවත්වන්න බැරි වුණාට එතන වුණ සිද්ධිය මොකක්ද කියලා බලන්න පුළුවන්. ඇසීම ඇසීමෙන් නවත්වන්න බැරි නිසා තමයි අපි සසරේ යන්නේ, මාරයාත් එක්ක ඉන්නේ. මේ සූත්‍රයේ පැහැදිලි කරනවා කන තියෙනකම් මාරයා ඉන්නවා. **අත්ථි සොතං.** මාරයා සමග ඉන්න අපට මාරයා ඉක්මවා යන ක්‍රමය තමයි බුදුරජාණන් වහන්සේ කියලා දෙන්නේ. ඒ නිසා සමුදය බලන්න, කන ඉපදුනේ ඇයි කියලා බලන්න. සමුදය ධම්මානුපස්සී වෙන්න.

මේ ඇසීමේ සිද්ධිය නැවතත් විමසලා බැලුවොත් - ඇහුණේ කොහොමද කියලා කල්පනා කරන්න ගිහිල්ලා තමයි ඇහෙන්න නම් කනක් තියෙන්න ඕන කියලා කනක් ඉපැද්දුවේ. ඒක අපි එකතු කරගත්ත ආස්‍රවයක් නේද? කනක් ගැන අපි කොහෙන් හරි ඉගෙනගෙන ඒ නිමිත්ත ඇතුළට දගෙන තියෙනවා. එහෙම දගත්තේ නැති මනසට (ඒකයි මම කන ගැන අහලත් නැති පොඩි දරුවෙක් උපමාවට ගත්තේ) - එයාට ඒ ආස්‍රවය තවම සකස්වෙලා නැහැ. එයාට ඒ නිමිත්ත තවම ඇදලා ගන්න බැහැ. නැතුව කුඩා දරුවාට කෙලෙස් නැහැ කියලා නෙවෙයි මේ කියන්නේ. ඒක වරද්දගන්න එපා. මේ සිද්ධියෙදී කනක් උපද්දලා ඇසීමේ සිද්ධියට එකතු කළේ අපේ මෝඩකමට කියලා තේරුම් කරන්නයි මේ උපමාව කිව්වේ.

යම්කිසි නිමිත්තක් ඉතුරු කරගත්ත නිසායි අපි කනක් ගැන කතා කරන්නේ. නිමිති ඉතුරු කරගත්තේ කලින් ආයතන මුළාව නිසායි. මේ මොහොතේ නෙවෙයි, ඒක පෙර කළ කර්මයක්. එතකොට අතීත කර්මයකට දැන් ඉඩ දුන්නා අලුතෙන් කනක් හදන්න. ඔය ඇහුණේ කන තිබුණ නිසායි කියලා දැනුත් කනක් හදන කර්මය

කළා. ඇසීම කියන සිද්ධියට කන කියලා දෙයක් අයිති නැහැ. ඇහුණේ කොහොමද කියලා කල්පනා කරන්න ගිහින් තමයි ඇහෙන්න නම් කනක් තියෙන්න ඕන කිව්වේ. එතකොට කල්පනා කරපු ටික ඇසීමට අයිති වෙන්න බැහැ නේ. ආයතන පැත්තෙන් විමසුවත් එතන ආයතන දෙකක් යෙදිලා තියෙනවා. එක ආයතනයකින් කරන කෘත්‍ය තව ආයතනයකින් කොහොමටවත් කරන්න බැහැ.

එතකොට ඇසීමේ ක්‍රියාවට සිතීම, දැකීම, දැනීම කියන මොකුත් අයිති නැහැ. ඇසීම කියන්නේ ඇසීමක් විතරයි. අපේ ආයතන මුළාව නිසා තමයි මේ සිතපු දෙය ඇසීමට සම්බන්ධ කරලා තියෙන්නේ - ඇහෙන්න නම් කන තියෙන්නම ඕන කියලා. නුවණින් විමසන කොට ඇසීමේ ක්‍රියාවට අපි හිතලා හදපු කන අවශ්‍ය වන්නේ නැති බව පෙනෙයි. ආයතන දෙකක් කිසිම වෙලාවක එකට වැඩ කරන්නෙත් නැහැ, ආයතන දෙකකට එකම වැඩය කරන්නත් බැහැ. එහෙම පුළුවන් නම් ආයතන දෙකක් ඕන වෙන්නේ නැහැ නේ. උණ්ණාභ බ්‍රාහ්මණ සූත්‍රයේ[9] සඳහන් වෙනවා **නානාගොචරානි නානාවිසයානි** - ආයතන වල ගෝචර භූමි වෙනස්, විෂය වෙන දේවල් වෙනස් කියලා. ඇහෙන් කරන වැඩය කනට කරන්න බැහැ. එහෙනම් කනෙන් කරන වැඩය හිතට කරන්නත් බැරිවෙන්න ඕන.

එහෙනම් ඇසීමේ සිද්ධියට අපි දැනගත්ත කන අයිති නැති බව තේරුම් ගන්න. අපි කනක් කියලා යම්කිසි දෙයක් පැනෙව්වා නම් ඒක ඇසීමේ සිද්ධියට අයිති නැහැ. ඇහුණට පස්සේ තමයි හිතලා තියෙන්නේ. එතකොට අපි පසුව හිතපු ටික මුලින් වෙච්ච ඇසීමට කොහොමටවත් අයිති වෙන්න බැහැ නේ. කාලයට දලා ගත්තත් එහෙම වෙන්න බැහැ. ඇහුණට පස්සෙයි හිතුවේ. එතකොට හිතනකොට හදපු දේවල් ඇසීමට අයිති වෙන්න බැහැ. ඇහෙන වෙලාවේ තියෙන්න බැහැ - ඒක අතීතයේ සිද්ධියක්. ලෝකයට අයිති පැත්තෙන් පැහැදිලි කළත් ඔය සිද්ධිය තේරුම්ගන්න පුළුවන්.

[9] උණ්ණාභ බ්‍රාහ්මණ සූත්‍රය - සංයුත්ත නිකාය, මහාවග්ගය, ඉන්ද්‍රිය සංයුත්තය, ජරාවග්ගය.

එතකොට ඔය ඇහුණේ කනෙන් කියන එක මෝඩකමට පනවපු දෙයක් බව නුවණින් විමසන කෙනාට පෙනෙන්න ඕන. ඒක ආයතන මුළාව මත කියපු දෙයක්. ඇසෙන වෙලාවේදි කන කියන සිද්ධියක් එතන නැහැ. ඇසීම ගැන කල්පනා කරන්න ගිහිල්ලා තමයි ඇහෙන්න නම් කනක් තියෙන්න ඕන කියලා හිතෙන් කිව්වේ. ඒක හිතෙන් කරන වැඩක්. ඒක ඇසීමේ සිද්ධියට කිසිම සම්බන්ධයක් නැහැ. අපි හිතන දේවල් කිසිවක් ඇසීමේ ක්‍රියාවට සම්බන්ධයක් නැහැ.

අතීතයේ එකතු කරගත්ත නිමිති තමයි ඔය ගලාගෙන එන්නේ. අපට පෙනෙන්නේ නැහැ මේ පෙර ඇසුර යෙදෙන්නේ කියලා. මේ කන කියන්නේ පුරාණ කර්මයක් කියලා අපට පෙනෙන්නේ නැහැ. අපට එහෙම දකින්න නුවණක් නැහැ. බුදුරජාණන් වහන්සේ නමක් තමයි ඒක පැහැදිලි කරන්නේ. ඒ නිසා තමයි බුද්ධ දේශනා වලට අනුව දහමට ගළපන්න කියන්නේ. **චක්ඛුං භික්ඛවෙ පුරාණකම්මං** කියලා කම්ම සූත්‍රයේ[10] දේශනා කරලා තියෙනවා. මේ වගේ ආයතන හයටම කියනවා. අපි තවම විඤ්ඤාණය කියන දේවල් තමයි පිළිගන්නේ. ඒ කියන්නේ මාරයාගේ ධර්මය තමයි පුරුදු කරන්නේ කියලා දකින්නවත් නුවණින් මේ දහම් කරුණු විමසන්න ඕන. පුරාණ කර්මය නොතිබුණා නම්, පුරාණ කර්මය මේ මොහොතේ යෙදුණේ නැතිනම්, කන කියන නිමිත්තක් මෙතැනට ගලාගෙන ආවේ නැත්නම්, කනක් සකස්වෙන්නේ නැහැ. නමුත් ඇසීමේ ක්‍රියාව සිදුවෙනවා. දැන් ඇසීම අනුව හිතන්න ගිහිල්ලා තමයි කනක් සකස්වුණේ.

කනෙන් කරන්න පුළුවන් ඇසීම විතරයි කියලා බලන මට්ටමට වඩා එහාට ගිය මට්ටමක් ගැනයි දැන් මේ කතා කරන්නේ. මොන කනෙන්ද ඔය ඇහුවේ කියන්නේ තව මට්ටමකින් විමසීමක් කරනවා. මූළික මට්ටමේ දී අපට පැහැදිලි වෙන්නේ එක ආයතනයකින් කරන කෘත්‍ය තව ආයතනයකින් කරන්න බැරි බවයි. දැන් කනෙන් කරන සිද්ධිය බැලුවොත් - ඇසීමක් වුණා. ඒ ඇසීම් වුණ අවස්ථාවේ දී අපි

[10] කම්ම සූත්‍රය - සංයුත්ත නිකාය, සළායතන වග්ගය, වෙදනා සංයුත්තය, නවපුරාණ වග්ගය.

දන්න කන එතන තිබුණද? එතන යෙදුණද? නැහැ. ඇයි එහෙම කියන්නේ? ඇහුණේ කොහොමද කියලා හිතන්න ගිහිල්ලා තමයි අපි කනක් පනවාගත්තේ. හිතට කනක් සකස්කරන්න පුළුවන් වුණේ පෙර නිමිති තිබුණ නිසා. කන කියලා නිමිත්තක් ඉතුරු කරගෙන තිබුණ නිසා තමයි කනක් දැන් සකස් කළේ, හිතට කනක් ගැන හිතන්න පුළුවන් වුණේ. අතීතයේ කනක් කියලා නිමිත්තක් සකස්කරලා නොතිබුණා නම්, නිමිත්තක් ඉතුරු කරගෙන නොතිබුණා නම්, ඇහෙන්න නම් කනක් තියෙන්න ඕන කියලා කියන්නේ නැහැ. එතකොට කනේ සමුදය පෙනෙන්න ගන්නවා - ඒ තමයි ආයතන මුළාව.

ඇසීම ඇසීම පමණක් බව නොදන්නකමටයි ඇසීමේ සිද්ධියට කනක් එකතු කළේ. පොඩි දරුවාට කන කියලා දෙයක් එකතු කරන්න පෙර ඇසුරක් තවම නැහැ. නමුත් වෙන දේවල් හදන්න පෙර ඇසුර තියෙනවා. ඒකයි එයා රහත්වෙලා නැහැ කියන්නේ. අනුශය ධර්ම තියෙනවා. අපි හදපු කන හදන්න තවම නිමිත්ත අලුත්වෙලා නැහැ. පුරාණ කර්ම නිසා තමයි නිමිති ඉතුරුවෙන්නේ. දැන් කන කියන කොටම අපට යම්කිසි රූපයක හැඩයක් පෙනෙනවා. ඇහැ වගේ නෙවෙයි කන කියලා පෙනෙනවා. කොහොමද එහෙම පෙනෙන්නේ? ඒ අතීතයේ ඉතුරු කරගත්ත නිමිති. ඒ නිසා තමයි ඒක පුරාණ කර්මයක් කියන්නේ. පුරාණ කර්මයක් නිසා දැන් කනක් හැදුවා කියලා දකින්න අපට නුවණ නැහැ. ඒ තැන දක්වා අපේ ප්‍රඥව තවම වැඩිලා නැහැ. ඒ ඇයි? අපි තවම බුදුදහමට අනුව සමුදය ධම්මානුපස්සී වුණේ නැති නිසායි. කනක් සකස් වුණේ පුරාණ කර්මයෙන් වුණාට, පුරාණ කර්මයෙන් කන හැදුවේ මේ මොහොතේ සිහිය නුවණ නැති නිසා. **සුතෙ සුතමත්තං** කියලා සිහිය නුවණ නැති නිසායි පුරාණ කර්මය නිසා දැන් කනක් හදන්න ඉඩ දුන්නේ. <u>**සුතෙ සුතමත්තං** වුණා නම් පුරාණ කර්ම කොච්චර තිබුණත් ප්‍රශ්නයක් නැහැ, නව කර්ම හැදෙන්නේ නැහැ</u>. මේ මොහොතේ මුළාව නැත්නම් භයවෙන්න එපා. අනන්ත සංසාරයක කර්ම තිබුණාට කමක් නැහැ. මේ මොහොතේ ඒ කර්ම වලට මොකුත් කරන්න බැහැ.

එතකොට කනේ සමුදය ඇසීම නොවන බව දැන් අපට පෙනෙනවා. ඇසීම ඇසීම බව නොදන්නකම තමයි කනේ සමුදය - කන හටගන්න හේතුව. **සුතෙ සුතමත්තං** නොවුණ නිසා කනක් හැදුවා. ඇසීම කියන එකට අපි හදපු කන අයිති වෙන්න බැහැ. ඇසීම ඇසීමක් කියලා නවත්වපු නැති නිසා තමයි අපි කනක් නිර්මාණය කළේ. ඇසීම ඇසීමක් කියලා නුවණින් දැක්කා නම් ඔතැනට කනක් සම්බන්ධ කරන්නේ නැහැ. දැන් කනක් පැනෙව්වේ මෝඩකමට කියලා පෙනෙන්න ඕන. ඒ තමයි කන කියන රූපයේ සමුදය.

දැන් මේ සූත්‍රවල **අත්ථි සොතං, නත්ථි සොතං** කියන තැන නැවතත් මතක් කරගන්න. මෝඩකම තියෙනකම් කන තියෙනවා. නමුත් හටගත්තේ කොහොමද කියලා කනේ සමුදය දැක්කොත් කනක් උපදින්නේ නැහැ. ඒ තමයි **නත්ථි සොතං** කියන අවස්ථාව. **නත්ථි සොතං** වුණොත් මාරයා නැහැ. කන තිබුණොත් මාරයා ඉන්නවා. **සුතෙ සුතමත්තං** බව නොදන්නාකමටයි කන හටගන්නේ. ඇසීමට අමතරව කනක් පනවලා. **නත්ථි සොතං** කියලා දකින්න තියෙන්නේ ප්‍රඥාවෙන්. සමුදය දකින කෙනාටයි නිරෝධය සාක්ෂාත් වෙන්නේ. ඒ නිසා තමයි සමුදය ධම්මානුපස්සී විය යුත්තේ. සමුදය දැක්කොත් විතරයි නිරෝධය මොකක්ද කියලා අවබෝධ වෙන්නේ. නිරෝධ වෙනවා පෙනෙනවා නෙවෙයි, ප්‍රඥාවට වැටහෙනවා නිරෝධය කියන්නේ මොකක්ද කියලා.

'මෝඩකමට කන පැනෙව්වා නම්, මෝඩකම නැත්නම් කනක් පැනවෙන්නේ නැහැ' කියන නුවණ එනවා. අවිද්‍යාවෙන් සංස්කාරයක් කළා නම්, අවිද්‍යාව යෙදුණේ නැත්නම් සංස්කාරය හටගන්න බැහැ. **ඉමස්මිං සති ඉදං හොති, ඉමස්මිං අසති ඉදං න හොති** කියන ධර්මතාවයයි ඔය දකින්නේ.

ප්‍රශ්නය: කන වගේම ශබ්දය ගැනත් විමසන්න ඕන නේද?

පිළිතුර: ඔව්, ඒක ඊළඟට විමසන්න ඕන. ස්පර්ශය හටගන්න ජාති තුනක් යෙදුණා නේ. කනයි, ශබ්දයයි තිබුණොත් තමයි සොත විඤ්ඤාණය ඇතිවෙන්නේ. දැන් ඒ දෙකෙන් කන ගැන තමයි අපි මෙතෙක් වෙලා විමසුවේ. කන හටගත්තේ මෝඩකම නිසා කියලා

දැන් පෙනෙනවා. මේ මොහොතේ අවිද්‍යාව නිසා. එතකොට මේ මොහොතේ අවිද්‍යාව යෙදුණේ නැත්නම් ඔය කන උපදින්නේ නැහැ. කන ඉපදුණේ නැත්නම් සොත විඤ්ඤාණය උපදින්න බැහැ. ඕක එක පැත්තක්.

දැන් ශබ්දය ගැනත් බලන්න වෙනවා. කනේ සමුදය බැලුවා වගේම ශබ්දයේ සමුදයත් ඊළඟට බලන්න ඕන. දැන් ඇහුණේ ශබ්දයක් තිබුණ නිසාමද කියලා බලන්න ඕන. අර ලේනා කැගහනකොට ශබ්දය තියෙනවා කියලා අපි දැනගත්තේ කොහොමද? ඇහුණ නිසා. ඇහුණේ නැත්නම් දැනගන්න බැහැ. එතකොට මුලින්ම ඇහෙන්න ඕන. ඇහුණේ ශබ්දය තිබුණ නිසා කියන තැන තමයි අපි ජීවත්වෙන්නේ - **අත්ථි සද්දං**. එතකොට මාරයා හටගෙනද නැත්ද? හටගෙන! දැන් අපි බුදුරජාණන් වහන්සේගේ දහම විමසීම තුළින් මාරයාගෙන් අයින්වෙන්න බලමු.

බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා සමුදය ධම්මානුපස්සී වෙන්න කියලා. ශබ්දයක් තියෙනවා නම් ශබ්දයේ සමුදය හොයන්න කියන එක තමයි බුද්ධ උපදේශය. දැන් අපි හොයන්න ඕන ශබ්දය හටගත්තේ කොහොමද කියලා. වෙනදා නම් අපි හෙව්වේ බාහිරයේ රූප දෙකක් ගැටුණ නිසා ශබ්දය හටගත්තා, ඒ ශබ්දය මගේ කනට ඇහුණා කියලා. ඒ හෙව්වේ බාහිරයෙන්. බාහිරයෙන් හොයලා ඇත්ත දකින්න බැහැ, තමා තුළින් ශබ්දය හටගත්තේ කොහොමද කියලා සෙවිය යුතුයි කියලා බුද්ධ දේශනාවේ සඳහන් වෙනවා. (රොහිතස්ස සූත්‍රය)[11]. එතකොට කොහොමද ශබ්දය තියෙනවා කියලා දැනගත්තේ? ඇසුණ නිසායි. ඇහුණේ නැත්නම් ශබ්දයක් තියෙනවා කියලා දැනගන්න විදියක් නැහැ.

දැන් ඇසීමයි, ශබ්දයයි කියන්නේ අවස්ථා දෙකක්. ඇසීම කියන්නේ ක්‍රියාවක්. ශබ්දය කියන්නේ රූපයක්. එතකොට ඇසුණ නිසායි ශබ්දයක් තියෙනවා කියලා දැනගත්තේ. ඇසීම කියන්නේ ශබ්දය නෙවෙයි. ඇසීම හේතු කරගෙන අපි ශබ්දයක් තියෙනවා කියලා දැනගන්නවා. එහෙම කිව්වොත් එතන වරදක් නැහැ. හැබැයි

[11] රොහිතස්ස සූත්‍රය - සංයුත්තනිකාය, සගාථවග්ගය, දෙවපුත්තසංයුත්තය, නානාතිත්ථියවග්ගය.

ඇසීමයි, ශබ්දයයි කියන්නේ එකක් කිව්වොත් ඒක වැරදියි. ශබ්දය කියන එක ඇසීමට අයිතිද කියලා දැන් හොඳට නුවණින් විමසන්න. ඇසීම ගැන කල්පනා කරන්න ගිහිල්ලා තමයි; 'ඔය ඇහුණේ එළියෙන් ආපු කපුටෙක්ගේ ශබ්දයක්' කියලා කිව්වේ. ඒ කිව්වේ හිතෙන්. එහෙනම් ඇසීම කියන සිද්ධියට අපි හිතපු ටික අයිති වෙන්න බැහැ. ඇසීම එක ක්‍රියාවක්, කල්පනා කරන එක තව ක්‍රියාවක්. ලෝකයට අයිති පැත්තෙන් කිව්වොත් ඇහුවට පස්සෙයි හිතන්නේ. පසුව සිද්ධ වුණ දේවල් කලින් සිද්ධියට අයිති වෙන්න බැහැ නේද? ඒක ලෝකයට අයිති පැහැදිලි කිරීමක්.

දැන් තමන් ලෝකෝත්තර දර්ශනය විමසන කොට ඇසීම කියන ක්‍රියාවේ ශබ්දය කියලා දෙයකුත් නැහැ, ඇසීම කියන ක්‍රියාවේ කන කියන රූපයත් නැහැ කියන මට්ටම දකින්න ඕන. ඒක ඇසීමක්ම විතරයි. ඇසීම ඇසීමක් පමණක් - **සුතෙ සුතමත්තං** නොවුණ හින්දයි අපි කනකුයි, ශබ්දයකුයි ඔතෙන්ට අයිති කළේ. ඕකට තමයි මාරයාට අහුවුණා කියන්නේ. කන තියෙනවා නම්, ශබ්දය තියෙනවා නම් එතන මාරයා ඉන්නවා. කන නැත්නම්, ශබ්දය නැත්නම් මාරයා නැහැ. එහෙනම් මෙන්න මෙහෙම හික්මෙන්න කියලා බුදුරජාණන් වහන්සේ බාහියට[12] දේශනා කරනවා - **සුතෙ සුතමත්තං භවිස්සති.** මාරයාගෙන් මිදෙන්න ඕන නම් ඇසීම ඇසීමක් පමණයි කියලා හික්මෙන්න. එහෙම හික්මුනොත් ඇසීමේ ක්‍රියාවට කනක් අයිති කරන්නෙත් නැහැ, ශබ්දයක් අයිති කරන්නෙත් නැහැ. එතකොට කනයි, ශබ්දයයි දෙකම ඇසීම ඇසීමක් පමණක් බව නොදන්නාකමට, අවිද්‍යාව මත පනවපු දේවල්. ඒ දෙක තියෙන කොට විඤ්ඤාණය පහළවෙනවා. ඒ තුනේ එකතුවට ඵස්සය කියනවා.

එතකොට ඵස්ස සමුදය දකින්න නම් මේ ආයතන මුළාව හඳුනගන්න වෙනවා. **සුතෙ සුතමත්තං** නොවීම මත කනක් පැනෙව්වා, ශබ්දයක් පැනෙව්වා, කනයි ශබ්දයයි තියෙන නිසා විඤ්ඤාණයක් පහළ වුණා. **සොතඤ්ච පටිච්ච සද්දෙ ච උප්පජ්ජති සොතවිඤ්ඤාණං, තිණ්ණං සඞ්ගති ඵස්සො.**

[12] බාහිය සූත්‍රය - බුද්දක නිකාය, උදානපාළි, බොධිවග්ගො.

දැන් ඔය සිද්ධියේම අනිත් පැත්ත විමසුවොත් - ඇසීම ඇසීමක් පමණයි බව දැක්කා නම් - කනක් පැනවෙන්නෙත් නැහැ, ශබ්දයක් පැනවෙන්නෙත් නැහැ. කනයි, ශබ්දයයි නැත්නම් විඤ්ඤාණයක් පැනවෙන්නෙත් නැහැ. ඒ තමයි **නත්ථි සොතං, නත්ථි සද්දං, නත්ථි තවිඤ්ඤාණං** අවස්ථාව. දැන් සොතවිඤ්ඤාණයට දැනගන්න ධර්මතා කිසිවක් නැහැ. ඒ තමයි මාරයා උපදින්නේ නැති තැන. එතන මාරයාත් නැහැ, මාරයා කියලා ප්‍රඥප්තියක් පනවගන්නත් බැරිවෙනවා.

ඕක තව පැත්තකින් විමසුවොත් - කනයි, ශබ්දයයි තියෙනවා කියලා කිව්වේ කවුද? සොතවිඤ්ඤාණය. ඒක විඤ්ඤාණයෙන් කරපු මායාවක්. කනයි, ශබ්දයයි තියෙනවා කියලා දෙපැත්තට බෙදන එකමයි සොතවිඤ්ඤාණයේ කෘත්‍යය.

ප්‍රශ්නය: සමුදය ගැන කරුණාකර පැහැදිලි කරලා දෙන්න.

පිළිතුර: ඇසීම ඇසීමක් බව නොදන්නාකම තමයි සමුදය. ආයතන මුළාව. ඇසීම ඇසීමක් බව දැනගත්තා නම් කන පැනවෙන්නෙත් නැහැ, ශබ්දය පැනවෙන්නෙත් නැහැ. ඔය දෙක පැනවුණේ නැත්නම් සොතවිඤ්ඤාණය හටගන්නත් බැහැ. ඕකට තමයි ඵස්ස නිරෝධය කියන්නේ. ඵස්සයට සමුදය යෙදුණේ නැහැ. සම්මාදිට්ඨිය ඇතිවෙන්න නම් ඵස්සය දැනගන්න ඕන, ඵස්ස සමුදය දැනගන්න ඕන, ඵස්ස නිරෝධය දැනගන්න ඕන. දැන් අපි සාමාන්‍යයෙන් නිරෝධය කියලා තේරුම් අරගෙන තියෙන්නේ ඇතිවෙලා නැතිවෙන එකට නේ. ඒක ලෝකයට අයිති කතාවක්. ඒක මාරයාගේ ධර්මයක්. බුද්ධ දේශනාවේ හැටියට නම් සමුදය තියෙනකම් ඵලය තියෙනවා, සමුදය යෙදුණේ නැත්නම් ඵලයක් උපදින්න බැහැ. හටගන්නේ නැහැ. නූපදින ගතියට, හට නොගන්න ගතියටයි නිරෝධය කියන්නේ. නමුත් ඒක තවම නිරෝධය ගැන ඥානයක් විතරයි. තවම නිරෝධ වුණේ නැහැ. සම්මාදිට්ඨිය ඇතිවෙන්න නම් නිරොධෙ ඤාණං තියෙන්න ඕන. තවම ඔය මාර්ගය පටන්ගන්න සුදුසුකම ලැබුවා විතරයි. **දුක්ඛෙ ඤාණං, සමුදයෙ ඤාණං, නිරොධෙ ඤාණං, මග්ගෙ ඤාණං, අයං වුච්චති සම්මාදිට්ඨි** කියලා බුද්ධ දේශනාවේ තියෙනවා. සම්මාදිට්ඨිය

පහළවුණ කෙනාට මාර්ගය වඩන්න පුළුවන්. එයා කළ යුත්ත දන්නවා. නමුත් බුදුරජාණන් වහන්සේ දේශනා කළ ලෝකෝත්තර මාර්ගය අපි නිවැරදිව විමසලා නැති නිසා, ඊට කලින් කරන්න ඕන දෙය ගැන අපි දන්නේ නැහැ.

ඒ නිසා අපි දහම වැඩුවා කියලා හිතාගෙන, ලෝකයට අයිති විදියට ඇතිවුණා-නැතිවුණා කියලා ආයතන තුළින් බලමින් විඤ්ඤාණය කියපු දෙය කරමින් ඉන්නවා. මාරයාව ගුරුතනතුරේ තියාගත්තා. දැන් මාරයාගෙන් මිදෙන්න නම් බුදුදහම ගුරුතනතුරට ගන්න ඕන. දැන් මේ ටික දැනගත්තා කියලා තවම මගඵල ලැබිලා නැහැ. ඒ සඳහා බුදුරජාණන් වහන්සේ දේශනා කළ ඒකායන මාර්ගය - සතර සතිපට්ඨානය වඩන්න වෙනවා. ඒකෙත් කායානුපස්සනාව මුලින්ම කරන්න තියෙනවා. වෙන විදියක් නැහැ.

ප්‍රශ්නය: ප්‍රායෝගික ජීවිතයේ ඒක කරන්නේ කොහොමද?

පිළිතුර: ප්‍රායෝගික ජීවිතය තුළ කායානුපස්සනාව වඩන්න ඕන. සමුදය ධම්මානුපස්සී වෙන්න ඕන. වෙන විදියක් නැහැ. වෙන විදියක් තියෙනවා නම් බුදුරජාණන් වහන්සේ මේකට **එකායනෝ අයං භික්ඛවෙ මග්ගෝ** කියන්නේ නැහැ. එතනදීත් ශ්‍රද්ධාව මුල් කරගෙන පටන්ගන්න ඕන. බුදුරජාණන් වහන්සේ පැහැදිලිව දේශනා කරලා තියෙනවා සමුදය ධම්මානුපස්සී වෙන්න කියලා. ඒ ටික නොකර දහම අවබෝධ කරගන්න වෙන විදියක් නැති බව තේරුම් ගන්න.

අපේ මට්ටමේදී අපි තවම රැවටෙනවා. ඒ වුණත් රැවටුනාට පස්සේ ආපස්සට ගිහිල්ලා බලන්න වෙනවා. වැරැද්ද කළාට පස්සේ වැරැද්ද වුණේ මෙහෙමයි කියලා පෙන්නලා දෙන්න ඕන. ඒක වටිනවා. ඒක තමයි බුදුරජාණන් වහන්සේ පෙන්වන්නේ, කයක් තියෙනවා නම් ඒ කයේ සමුදය හොයාගන්න කියනවා. එහෙම සමුදය හොයන කොට තමයි ඕක මෝඩකමට පනවපු කයක් කියන නුවණ එන්නේ. ඒක ප්‍රඥාවෙන් දැකිය යුත්තක්. එතකොට ඒ දැකීම තුළ මොකක්ද වෙන්නේ? මෝඩකම දුරුවෙන කොට කයක් පැනවෙන්නේ නැති බව පෙනෙනවා.

අපි වතුරට එබෙන බල්ලාගේ උපමාව මතක් කරගත්තොත් - මෝඩකම තියෙනකම් වතුරේ බල්ලා හදලා ඊටපස්සේ ඌ ගැන මෙනෙහි කළාට, ඔය බල්ලා හැදුවේ ආයතන මුළාවෙන් නේ කියලා ආයතන මුළාව පෙන්නනවා. බල්ලාව තවමත් හැදෙනවා, හැබැයි එහෙම දිගටම මුළාව පෙන්වන කොට මුළාව නැති යම්කිසි දවසක් එනවා. එදට බල්ලෙක් උපදින්නේ නැතිවෙයි. ඒ තැන දක්වා සිහිය නුවණ පිහිටන දවසක් අනාගතයේ එයි. තවම අපට ඒ නුවණ නැහැ. එතෙන්ට එන්න වැඩපිළිවෙලක් බුදුරජාණන් වහන්සේ පෙන්වලා තියෙනවා. ඒ තමයි කායානුපස්සනාව - කයක් තියෙනවා නම් ඒකේ සමුදය බලන්න කියනවා.

ප්‍රශ්නය: මෙතෙන්ට මාලුඞ්ක්‍යාපුත්ත දේශනාවත් [13] සෘජුවම යොදගන්න පුළුවන් නේද?

පිළිතුර: ඔව්. අපට නොතේරුණාට, මාලුඞ්ක්‍යාපුත්තට කියෙන්නෙත් ඔය ටිකමයි. 'මාලුඞ්ක්‍යාපුත්ත යම්කිසි චක්ඛුවිඤ්ඤෙසු රූපයක් තියෙනවා නම්, (අපට තේරෙන විදියට කියනවා නම් ඇහෙන් දකින රූපයක් තියෙනවා නම්) ඔය රූපය වර්තමානයේ පෙනෙන්නේ නැහැ'. එතන නුවණ පිහිටන්න ඕන. අපේ මෝඩකමට පෙනුනාට, ඇත්ත ඇති හැටි බැලුවොත්, වර්තමානයේ ඔය රූපය පෙනෙන්නේ නැහැ. හැබැයි දැකීම කියන ක්‍රියාව සිදුවෙනවා. දැකීම වුණාට අපි මෝඩකමින් පනවපු රූපය පෙනෙන්නේ නැහැ. දැකීමේ ක්‍රියාවට රූපය අයිති නැහැ. එතකොට චක්ඛුවිඤ්ඤෙසු රූපය වර්තමානයේ පෙනෙන්නේ නැහැ. වර්තමානයේ පෙනෙන්නේ නැත්නම් අතීතයේ කවදවත් ඕක දැකලා තියෙන්නත් බැහැ. මෝඩකමට දැක්කාට, ඇත්ත ඇතිහැටියේ බැලුවොත් දකින්න බැහැ. ඉතින් දැන් පෙනෙන්නෙත් නැහැ, අතීතයේ දැකලාත් නැත්නම්, අනාගතයේ මේ ඇහෙන් දකින්නත් බැහැ. එහෙනම් කවදවත් ඔය රූපය දකින්නත් බැහැ. මෝඩකම තියෙනකම් පෙනුනාට, ප්‍රඥාව පිහිටන කොට ඕක අදුළ නැහැ. ඉතින් එහෙම එකකට චන්දයක්, රාගයක් ඇතිවෙයි ද? කියලා අහනවා. මාලුඞ්ක්‍යාපුත්ත ස්වාමීන් වහන්සේ 'නැහැ' කියලා උත්තර

[13] මාලුඞ්ක්‍යාපුත්ත සූත්‍රය - සංයුත්ත නිකාය, සළායතනවග්ගය, වෙදනාසංයුත්තය, ඡලවග්ගය.

දෙනවා. එතකොට බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා 'එහෙනම් මාලුඞ්කපුත්ත' මෙහෙම හික්මෙන්න - **දිට්ඨෙ දිට්ඨමත්තං භවිස්සති...** ආදි වශයෙන්.

ඇහැ පනවන්නත් එපා, රූප පනවන්නත් එපා, චක්ඛු විඤ්ඤාණය පනවන්නත් එපා කියන එක තමයි තව විදියකට ඔය කියන්නේ. අපට ඒක තේරුම්ගන්න තවම ශක්තිය නැහැ - මොකද අපි සමුදය හොයාගෙන නැති හින්ද.

ප්‍රශ්නය: ගැඹුරු සමාධියෙන් ඕක බලන්න බැරි ද?

පිළිතුර: ගැඹුරු සමාධිය තිබුණාට ඕක පෙනෙන්නේ නැහැ. ඒ සඳහා ප්‍රඥව අවශ්‍යයි. ප්‍රඥව ඇතිවෙන්න නම් ඉස්සෙල්ලා මේ කියන්නේ මොකක්ද කියලා තේරුම්ගන්න ඕන.

ප්‍රශ්නය: ත්‍රිලක්ෂණය බැලුවහම හරි ද?

පිළිතුර: ආර්ය දර්ශනයේ අනිත්‍ය කියන්නේ මොකක්ද? 'මෙය ඇති කල්හි මෙය වෙයි, මෙය නැත්නම් ඔහොම වෙන්න බැහැ' කියන ධර්මතාවය අවබෝධ වෙන ක්‍රමයක් අනිත්‍ය කියන්නේ. අපි හිතාගෙන ඉන්නේ 'ඇතිවුණ දෙය නැතිවෙන' එකයි අනිත්‍ය කියලා. ඒ ලෝකයට අයිති විදියට අනිත්‍ය දැකීමක්. ලෝකයෙන් එතෙර වෙන දර්ශනයේ දී රූපය මෙය, රූප සමුදය මෙය, රූප අස්ඩ්ගමය මෙය ලෙස අනිත්‍ය සංඥව[14] වඩන විට 'සමුදය තියෙනකම් ඵලය තියෙනවා, සමුදය නැත්නම් ඵලය උපදින්න බැහැ' කියන ධර්මතාවය, පටිච්ච සමුප්පන්න ධර්මතාවය අවබෝධ වෙනවා. තියෙන ඵලයක නැතිවීමක් ගැන බැලීමක් නෙවෙයි අපි කළ යුත්තේ. උපන්න දෙයක නැතිවීම කියන්නේ ලෝකයට අයිති අනිත්‍යයක්. ලෝකෝත්තර දර්ශනයේදී කියන්නේ උපන්නේ මෝඩකම - අවිද්‍යාව නිසායි. ඔය මෝඩකම යෙදුණේ නැත්නම් උපදින්නේ නැහැ. ඉපදුණේ නැත්නම් මාරයා නැහැ - අමරණීයයි - අජර අමර. ජීවත්ව සිටිද්දීම මාරයාගෙන් මිදෙන මාර්ගයක් මේ

[14] අනිච්ච සඤ්ඤ සූත්‍රය - සංයුත්තනිකාය, ඛන්ධකවග්ගය, ඛන්ධසංයුත්තය, පුප්ඵවග්ගය.

තියෙන්නේ. එහෙම දර්ශනයකුයි බුදුරජාණන් වහන්සේ දේශනා කරන්නේ.

ඒ නිසා තමයි මෙවැනි දහමක් ඇහෙන්න ලැබෙන එක ක්ෂණ සම්පත්තියක් කියලා කියන්නේ. බුදුරජාණන් වහන්සේ නමකට විතරයි මේ වගේ දහමක් දේශනා කරන්න පුළුවන්. එතකොට ඒ දේශනාව තේරුම් ගන්න අපි දක්ෂ වෙන්න ඕන. අපට ඕන විදියට දේශනාව ගළපලා හරියන්නේ නැහැ. අපි දන්න, අපි හිතන අනිත්‍යයට බුදුරජාණන් වහන්සේ දේශනා කළ අනිත්‍ය ගළපන්න බැහැ. ඒ නිසා තමයි කියන්නේ ලෝකයාට ඇත්ත ආර්ය දර්ශනයේ දී බොරුවක් කියලා. (ද්වයතානුපස්සනා සූත්‍රය[15]) ලෝකයා තේරුම් ගන්නේ ශබ්දය ඇතිවුණා-නැතිවුණා කියලා. ආර්ය දර්ශනයේ දී ශබ්දය ඇතිවුණේ මෝඩකම නිසා කියලා පෙනෙනවා. ඉතින් ඇතිවුණා-නැතිවුණා කියන එකේ අඩුව දැන් පෙනෙනවා නේද? දැන් තේරුණාද ලෝකයාට ඇත්ත ආර්ය දර්ශනයේ දී බොරු වෙන හැටි. ලෝකයා දකින අනිත්‍ය ආර්ය දර්ශනයේ දී බොරුවක්. ආර්ය දර්ශනයේ දී සමුදය යෙදෙන නිසායි හටගන්නේ කියලා පෙනෙනවා. මෝඩකම තියෙන නිසායි ලෝකයම හටගන්නේ. මෝඩකම තියෙන නිසායි මාරයා. මෝඩකම තියෙන නිසායි සත්ත්වයා. ලෝකයාගේ දර්ශනයේ දී කියන්නේ සත්ත්වයා ඇතිවෙලා නැතිවෙනවා කියලා. මාරයා ඇතිවෙලා නැතිවෙනවා කියලා. ආර්ය දර්ශනයේ දී ඕක බොරුවක් කියලා හොඳට තේරුම් ගන්න. ලෝකයා මේ සියල්ලක්ම කියන්නේ මෝඩකම මත, අවිද්‍යාව මත බව තේරුම් ගන්න. ලෝකයා නැති දෙයක් මවාගෙන ඒක ඇතිවුණා-නැතිවුණා කියනවා. ප්‍රඥාවට විතරයි ඒ වැරැද්ද ගෝචර වෙන්නේ.

මේ ධර්මතාවය අපටත් දකින්න පුළුවන් විය යුතුයි. ඇයි එහෙම කියන්නේ? අපට නිර්මල බුදුදහම ලැබිලා තියෙන නිසායි. ඒ නිසා මාරයාගේ ධර්මයෙන් අයින් වෙලා බුදුරජාණන් වහන්සේ දේශනා කළ ලෝකෝත්තර මාර්ගය නුවණින් විමසන්න. අපි ත්‍රිලක්ෂණය බලන්නෙත් ලෝකයට අයිති විදියටයි. බුදුරජාණන් වහන්සේ අනිච්ච

[15] ද්වයතානුපස්සනා සූත්‍රය - බුද්දක නිකාය, සුත්ත නිපාතය, මහාවග්ගය

සඤ්ඤා සූත්‍රයේ[16] දී පැහැදිලිව දේශනා කරනවා **ඉති රූපං, ඉති රූපස්ස සමුදයො, ඉති රූපස්ස අත්ථඞ්ගමො** වශයෙන් බලන්න කියලා. අපි ඒ උපදේශය අමතක කරලා අපට ඕන විදියට රූපය ඇතිවුණා-නැතිවුණා කියලා බලනවා. සමුදය බලන්න අපි උත්සාහ කරන්නේ නැහැ. ඇයි අපි මාරයාගේ ධර්මය නේ අල්ලගෙන තියෙන්නේ! අපි සතිපට්ඨානය වඩන්නේ නැහැ. බුදුරජාණන් වහන්සේ දේශනා කරන්නේ සතර සතිපට්ඨානය හැර වෙන මාර්ගයක් නැහැ - ඒක ඒකායන මාර්ගය කියලා.

එහෙනම් සමුදය ධම්මානුපස්සී වෙන්න අපි දැන්වත් පටන්ගන්න ඕන. එහෙම වුණොත් මාරයා හටගන්නේ නැහැ. දුක, සත්ත්වයා, ලෝකය හටගන්නේ නැහැ. එතකොට ලෝකයයි, ලෝක සමුදයයි, නිරෝධයයි, මාර්ගයයි තමන් තුළින් දකින්න ඕන. එතෙන්ට එන්නයි අපි මේ දහම අහලා, නුවණින් විමසිය යුත්තේ.

ඉතින් මේ සමිද්ධි සූත්‍ර නුවණින් විමසන්න උත්සාහ කරන්න. මිගජාල වග්ගයේ එක විදියේ සූත්‍ර කීපයක්ම තියෙනවා - සමිද්ධි-මාරපඤ්හ, සමිද්ධි-දුක්ඛපඤ්හ, සමිද්ධි-ලොකපඤ්හ, සමිද්ධි-සත්තපඤ්හ කියලා. ත්‍රිපිටක සූත්‍ර තුළින් අපි දහම තේරුම් ගන්නවා මිසක්, අපි දැනට දන්න දෙය කවදාවත් බුදුදහම වෙන්නේ නැහැ. එහෙම වුණා නම් බුදුකෙනෙක් අවශ්‍ය වෙන්නේ නැහැ නේ. එහෙම වුණොත් අපට තනියෙන් නිවන් දකින්න පුළුවන් වෙන්න ඕන. ඒ නිසා හොඳට නුවණින් තේරුම් ගන්න - බුදුකෙනෙක් පහළවෙන එක බොහොම දුර්ලභයි. ඒ දහම අහන්න ලැබෙන එක අති දුර්ලභ දෙයක්, මනුෂ්‍ය ජීවිතයක් ලබන එකත් දුර්ලභ දෙයක් කියලා දේශනා කරන්නෙත් බුදුරජාණන් වහන්සේමයි. ඒකත් අපි දන්න දෙයක් නෙවෙයි. ඒ බව නොදන්නා නිසා නේ අපි ලබන ජීවිතයට මේවා කල් දමන්නේ! මේ වගේ ජීවිතයන් නැවත කල්ප ගණනකට ලැබෙන්නේ නැහැ කියන එක අපට හිතාගන්නවත් බැහැ.

ප්‍රශ්නය: එතකොට අපි ධර්මතාවයන් බලන්නේ විඤ්ඤාණයේ මුළාවට අහුවෙලා නේද?

---

[16] අනිච්ච සඤ්ඤා සූත්‍රය - සංයුත්තනිකාය, ඛන්ධකවග්ගය, ඛන්ධසංයුත්තය, පුප්ඵ වග්ගය.

පිළිතුර: ඔව්. අපි මෙච්චර කල් ධර්මය කියලත් ඉගෙනගෙන තියෙන්නේ ආයතන වලට අහුවෙලා, මුළාව තුළ ඉඳලා. ඒ නිසා දැන්වත් බුදුරජාණන් වහන්සේ දේශනා කළ සසරින් එතෙර වෙන ධර්මය විමසන්න ඕන.

ප්‍රශ්නය: හැමදෙයක්ම අත්හැරලා දැනවා කියන එකේ තේරුම මොකක්ද?

පිළිතුර: අත්හරිනවා කියන්නේ ලෞකික පැත්තෙන්. බුදුදහමේ ආර්ය මාර්ගයේ තියෙන්නේ නිස්සරණය - නිබ්බිදව කියලා. අත්හැරීමක් වෙනවා, අල්ලන්න දෙයක් නැති බව දකින කොටයි එහෙම වෙන්නේ. වචනයක් ඇහුණ ගමන් අපි අපේ රාමුවට දාගන්නවා, නිස්සරණය කියන්නේ අපි හිතාගෙන ඉන්න අත්හැරීම කියලා.

බල්ලාගේ උපමාවේ දී - එක පැත්තකින් බැලුවොත්; බල්ලාට ඕන නම් පුළුවන් වතුරේ ඉන්න බල්ලා කෙරෙහි ඇලෙන්නේ ගැටෙන්නේ නැතුව අතහැරලා දන්න. නමුත් එතන බල්ලෙක් පිහිටලා ඉවරයි. අනිත් පැත්තට ප්‍රඥාවෙන් දකින්න පුළුවන් වතුරේ බල්ලෙක් හැදුවේ මෝඩකමට නේ කියලා. ඒ අත්හැරීම් දෙකක් නේද? ඉන්න බල්ලා අතහරින එකයි, මෝඩකමට බල්ලෙක් පැනෙව්වා කියලා අවබෝධ වෙන එකෙයි දෙකේදීම බල්ලා අතහැරෙනවා. එහෙම වෙනසක් තියෙනවා. අවබෝධය තුළ අතහරිනවා නෙවෙයි අතහැරෙනවා - අල්ලගන්න දෙයක් නැති නිසා. අවබෝධය නිසා අල්ලගන්න දෙයක් උපදින්නේ නැහැ. එතකොට දුක් විඳ විඳ අතහරින්න ඕන නැහැ. ඒ නිසා තමයි දැන සියයක් දෙනවාට වඩා ක්ෂණයකට විදර්ශනාව වඩන එක වටිනවා කියන්නේ. එහෙම කළහම ලෝකයම අතහැරෙනවා. ඇයි ලෝකයම අතහැරෙන්නේ? ලෝකයම උපදින්නේ නැති නිසා. ඉපැද්දුවොත් තමයි අල්ලගන්න තියෙන්නේ. ඉපැද්දුවොත් මාරයා ඉන්නවා.

මේ දේශනා වල තියෙන ගැඹුර ඔය සූත්‍ර කියවන කොට තේරෙනවා නේද? දහම නුවණින් විමසීම සඳහායි අපි ධර්ම සාකච්ඡා තියන්නේ. අපි දන්න දෙයම අනිත් පැත්තට කියන්න නෙවෙයි, නොදන්න දහම් කරුණු හොයන්න ඕන. බුදුරජාණන් වහන්සේ දේශනා

කරන්නේ අපි නොදන්න දෙයක්මයි. ඒ වගේම කරන්න බැරි දෙයක් දේශනා කරන්නෙත් නැහැ. හැබැයි අපි දකින වෙන්න ඕන නිවැරදි දහම තෝරගන්න. ලෝකයට අයිති ධර්මයමයි අපට බොහෝ විට ඇහෙන්න ලැබෙන්නේ. සම්මාදිට්ඨියට අවශ්‍ය දහම් කරුණු ගැනයි අපි මේ කතා කරන්නේ. මේ දහම හොඳට විමසුවාට පසුව ඕන සූත්‍රයක් කියවලා බලන්න. එතකොට ලෝකෝත්තර මාර්ග දර්ශනය පෙනෙන්න ගන්නවා. දැන් අපට වෙලා තියෙන්නේ සූත්‍ර කියවන කොට ලෝකයට අයිති විදියට, අපි දන්න දෙයට ගළපනවා. ලෝකය පැත්තෙන් ගළපන්න යන්න එපා. ලෝකයෙන් එතෙරවෙන දහමක් බුදුරජාණන් වහන්සේ දේශනා කළේ. ඒ ගැන නුවණින් විමසන්න.

මේ දහම තේරුම් ගන්න බැරි එකක් නෙවෙයි. අපි මනුෂ්‍යයන් වෙලා ඉපදිලා තියෙන නිසා අපට තේරුම් ගැනීමේ ශක්තිය තියෙනවා. මනස උසස් තත්වයකයි අපි ඉන්නේ. දහම තියෙන කාලයක ඉපදිලා තියෙනවා, ඒ වගේම දහම අහන්නත් ලැබිලා තියෙනවා. දැන් නුවණින් විමසන එකයි කරන්න තියෙන්නේ. එතකොට අපි දකින වෙන්න ඕන ඕක මාර ධර්මයක්ද, බුදුකෙනෙක්ගේ ධර්මයක්ද - ලෝකයට අයිති ධර්මයක්ද, ලෝකයෙන් එතෙර වෙන ධර්මයක්ද කියලා හොයාගන්න. ඉතින් අපට මාරයා ඉන්නේ කොහෙද කියලා හොය හොයා යන්න ඕන නැහැ. බුද්ධ දේශනාවේ - මේ සූත්‍රයේ පැහැදිලිව පෙන්නනවා කොහෙද මාරයා ඉන්නේ කියලා. ආයතන හටගත්තොත් මාරයා ඉන්නවා. අපි කැමති වුණත් නැතත් ඕක තමයි ඇත්ත. එතකොට ආයතන හටගන්නේ ඇයි? දිට්ඨ, සුත, මුත, විඤ්ඤත කියන හතර ගැන දන්නේ නැති නිසා. එහෙනම් <u>**දිට්ඨෙ දිට්ඨ මත්තං, සුතෙ සුත මත්තං, මුතෙ මුත මත්තං, විඤ්ඤතෙ විඤ්ඤත මත්තං කියලා හික්මෙන්න - ඕක තමයි බුද්ධ උපදේශය**</u>.

නමුත් අපේ කෙලෙස් තවම වේගයෙන් ගලාගෙන එන නිසා අපට දැනට **දිට්ඨෙ දිට්ඨ මත්තං** කියලා හික්මෙන්න බැහැ. අපට තියෙන්නේ රැවටුණාට පස්සේ අනිත් පැත්තට සමුදය පෙන්නන්න - සමුදය ධම්මානුපස්සී වෙන්න. රූපයක් - කයක් තියෙනවා නම් ඒකේ සමුදය හොයාගන්න. ඒ නිසා තමයි **කායෙ කායානුපස්සී විහරති** කියන්නේ. එතකොට කය කියන්නේ මොනවද? ඇහැයි-

රූපයයි, කනයි-ශබ්දයයි, නාසයයි-ගන්ධයයි, දිවයි-රසයි, කයයි-පහසයි - ඔය ටිකට තමයි රූප කියන්නේ. සමුදය දකිනකොට තමයි **දිට්ඨෙ දිට්ඨ මත්තං** කියන්නේ මොකක්ද කියලා තේරෙන්නේ.

මේ පඤ්ච උපාදාන ස්කන්ධයම මෝඩකමට පනවපු දේවල්. පුද්ගලයා අනුව ගිය දේවල්මයි රූපය කියලා පනවන්නේ. පුද්ගලයා මෝඩකමට සකස් කරපු දේවල්. සැඩ පහරට අහුවෙලායි අපි ඉන්නේ. සංසාරයක් පුරාම රැවටිලා රැවටිලා ලෝකය හදන එක තුළ තමයි අපි ඉන්නේ. ඒ සැඩ පහර තරණය කරන්න වෙනවා. ඒකටයි ඕඝ තරණය කියන්නේ. බුදුරජාණන් වහන්සේ දේශනා කළ මාර්ගය වැඩුවොත් විතරයි මේ ඕඝය තරණය කරන්න පුළුවන් වෙන්නේ. **සමුදය ධම්මානුපස්සී** වුණොත් විතරයි ලෝකයෙන් එතෙර වෙන මාර්ගයට වැටෙන්නේ. සතර සතිපට්ඨානය විතරයි එකම මාර්ගය - **එකායනො අයං භික්ඛවෙ මග්ගො සත්තානං විසුද්ධියා, යදිදං චත්තාරො සතිපට්ඨානා**. එහෙම කිව්වේ ඇයි කියලා දහම නිවැරදිව දකින කොට පැහැදිලි වෙනවා. සමුදය බලන්නේ නැතුව රූපය පිරිසිඳ දකින්න විදියක් නැහැ. රූපය ඇතිවෙලා-නැතිවෙනවා කිව්වාට රූපය පිරිසිඳ දකින්නේ නැහැ. ඒක හොඳට මතක තියාගන්න. **සමුදය ධම්මානුපස්සී** වුණොත් විතරයි කය පිරිසිඳ දකින්නේ. කය පිරිසිඳ දැක්කොත් තමයි කයෙන් එතෙර වෙන්න පුළුවන් වෙන්නේ. **අනිස්සිතො ච විහරති, න ච කිඤ්චි ලොකෙ උපාදියති** වෙන්න පුළුවන් වෙන්නේ.

ඉතින් අපි ඒක නෙවෙයි නේ කරන්නේ. ඒ නිසා ලෝකෝත්තර දර්ශනයට අනුව සමුදය බලන්න පටන්ගන්න දක්ෂ වෙන්න. සමුදය බලන්න ඉස්සෙල්ලා මේ දහම තේරුම් ගන්න ඕන. මේ ධර්මතාවය දන්න-දකින කෙනාටයි මාර්ගය වඩන්න පුළුවන් කියලා දේශනාවේ තියෙනවා. නොදන්න කෙනාට බැහැ. **ජානතො අහං භික්ඛවෙ පස්සතො ආසවානං ඛයං වදාමි, නො අජානතො නො අපස්සතො** - සබ්බාසව සූත්‍රය[17], වාසිජට සූත්‍රය[18]. ඇයි මෙහෙම කියන්නේ? දහමක් අහලා දැනගත්තේ නැති කෙනා ලෝකයට අයිති දෙයක්මයි නිවන්

[17] සබ්බාසව සූත්‍රය - මජ්ඣිම නිකාය, මූලපණ්ණාසකය, මූලපරියායවග්ගය.

[18] වාසිජට සූත්‍රය - සංයුත්ත නිකාය, ඛන්ධක වග්ගය, ඛන්ධසංයුත්තය, පුප්ඵවග්ගය.

මාර්ගය කියලා වඩන්නේ. මාරයාට අයිති දෙයක්. බුදුදහමේ දේශනා කරන ආර්ය දර්ශනය අහලා දැනගත්ත කෙනාට විතරයි ලෝකයෙන් එතෙර වෙන මාර්ගය වඩන්න පුළුවන් වෙන්නේ. ඔය ටික තේරුම් ගත්තොත් කවුරු මොනවා කිව්වත් රැවටෙන්නේ නැහැ. ඔය ටික නොදන්නාකමට තමයි, එක එක්කෙනා නොයෙක් විදියට කියනකොට අපට දහම පටලැවෙන්නේ. දහම දන්නේ නැතිකමට එක එක ක්‍රම පස්සේ යනවා. නිවැරදි දහම දන්න-දකින කොට කවුරු හරි තමන් සෝවාන් වුණා, රහත් වුණා කිව්වාට ඕවා බුද්ධ ශාසනයේ මගඵල නම් නෙවෙයි කියලා නුවණට වැටහෙයි. ඒක මාරයාගේ ශාසනය බව පෙනෙයි. මේ සූත්‍ර ටික කියවන කොට තේරෙනවා ඔය ආලෝක සංඥා, ශූන්‍යතා කියලා කියන අත්දැකීම් සියල්ලමත් තියෙන්නේ ලෝකයට අහුවෙලාමයි කියලා. ඒවා ඉන්ද්‍රිය ගෝචරයි. මාරයාට අහුවෙලා මේ කියන්නේ. මේ සූත්‍ර හතර සරළ වගේ පෙනුනාට ඒවා තුළ ලොකු ගැඹුරක් තියෙනවා.

ආයතන හයටම - මනස ගැනත් මේ විදියටම කියලා තියෙනවා. මනස අපව රවට්ටන්නෙත් ඔය විදියටමයි. ඒ රැවටීම් තමයි ඔය ආලෝක සංඥා, ශූන්‍යතා ආදි වශයෙන් කියන්නේ. ඒ නිසා දහම නුවණින් හොයන්න. එතකොට ඔය එක එක අර්ථ දැක්වීම් වලට රැවටෙන්නේ නැහැ. ඉච්ඡ නැති බවින් අනිච්ඡයි - මේවා ඔක්කොම ලෝකයට අයිති කතා කියලා දැන් තේරෙන්න ඕන. කැමති වෙන්නේ රූපයක් තිබුණොත්, මාරයා හිටියොත් නේ. එතකොට මේ එක එක අර්ථ දැක්වීම් මොන විහිළුවක්ද කියලා පෙනෙනවා. ඉතින් බුදුදහම නිවැරදිව තේරුම් ගත්තොත් ඒ කිසිවකට අහුවෙන්නේ නැහැ. අපට ලෝකෝත්තර සම්මාදිට්ඨිය ඇතිකර ගන්නම වෙනවා. ත්‍රිපිටකය කියවන්නේ නැති නිසායි අපි නොයෙක් මත වලට අහුවෙන්නේ. ඒ නිසා බුද්ධ දේශනාව තුළ තියෙන, අපි සාකච්ඡා කරන මේ සූත්‍ර නැවත නැවතත් කියවලා තේරුම් ගන්න. ඒවා හොඳට නුවණින් විමසන්න කියලා මම හැම දෙනාටම ආරාධනා කරනවා.

හැමදෙනාටම තෙරුවන් සරණයි!

2018 අගෝස්තු 07 වැනි දින - බත්තරමුල්ලේ දී පවත්වන ලද ධර්ම සාකච්ඡාව

බුද්ධ දේශනාවට අනුව සසර අනන්තයි. අපි තවම සසර දුකෙන් මිදිලා නැහැ. බුදුදහම අහන්න ලැබෙන්නේ ඉතාමත්ම කලාතුරකින්. අපි හැමෝටම දැන් ඒ අවස්ථාව ලැබිලා තියෙනවා. දහමක් තියෙන කාලයක, මනුෂ්‍යයන් වෙලා ඉපදිලා ඉන්න එක ක්ෂණ සම්පත්තියක්. බුදුදහම ලැබුණ වෙලාවේ අපි බොහොම පරිස්සමින්, නුවණින් විමසන්න ඕන. දහම ගැන නොයෙක් මත තියෙන්න පුළුවන්. ඒ මොන මත තිබුණත් අපි දක්ෂ වෙන්න ඕන බුදුරජාණන් වහන්සේ දේශනා කළේ මොකක්ද කියලා හොයාගන්න.

පටිච්චසමුප්පාදය දැක්කොත් තමයි දහම දැක්කා වෙන්නේ. දහම දැක්කොත් තමයි බුදුන් දැක්කා වෙන්නේ කියලා පැහැදිලි දේශනාවක් තියෙනවා. (වක්කලි සූත්‍රය[19]) ඒ නිසා අපි මොනවා කතා කළත්, පටිච්චසමුප්පාදය දැක්කොත් විතරයි දහම දැක්කා වෙන්නේ. ඊළඟ දෙය තමයි දහමේ සඳහන් වෙන මූලික කරුණු පටිච්චසමුප්පාදයට ගැළපෙන්න ඕන. එහෙම ගැළපුනේ නැතිනම් ඒක බුදුදහම වෙන්න බැහැ. ඒවා කෙනා කෙනාගේ පෞද්ගලික මත වෙන්න පුළුවන්. අපට ඒ මත වලින් වැඩක් නැහැ, පටිච්චසමුප්පාදය අවබෝධ කළොත් තමයි දහම දැක්කා වෙන්නේ කියන තැනින් අපි දහම විමසන්න දක්ෂ වෙන්න ඕන.

ඊළඟ කරුණ තමයි - සැඟවිලා තියෙන චතුරාර්‍ය්‍ය සත්‍ය දේශනා කරන්නයි බුදුරජාණන් වහන්සේ නමක් පහළවෙන්නේ. ඒ වගේ දහමට ගැළපිය යුතු මූලික කරුණු කීපයක් තියෙනවා. අපි මොන පෞද්ගලික මතයක් දැරුවත් ඒක දහමට ගැළපෙනවාද කියලා විමසන්න ඕන.

දහම සෙවීමේ දී උපකාරී වෙන තව කරුණක් තමයි; මේ ලෝකය ගැන බාහිරයෙන් හෙව්වාට ඇත්ත හොයන්න බැහැ කියන

[19] වක්කලි සූත්‍රය - සංයුත්තනිකාය, ඛන්ධක වග්ගය, ඛන්ධ සංයුත්තය, ථෙරවග්ගය.

කාරණාව. බාහිරයෙන් කොච්චර හෙව්වත් ඇත්ත හම්බවෙන්නේ නැහැ. ඒ නිසා ලෝකයයි, ලෝක සමුදයයි, නිරෝධයයි, මාර්ගයයි තමන් තුළින් දකින්න කියලා බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා. (රොහිතස්ස සූත්‍රය[20])

අනිත් කරුණ තමයි; ඒකායන මාර්ගය - එකම මාර්ගය සතර සතිපට්ඨානය කියලාත් බුද්ධ දේශනාවේ තියෙනවා - **එකායනෝ අයං භික්ඛවෙ මග්ගෝ සත්තානං විසුද්ධියා, යදිදං චත්තාරෝ සතිපට්ඨානා.** එතකොට අපි මාර්ගයක් වඩනවා නම් ඒක අනිවාර්යයෙන් සතර සතිපට්ඨානය වෙන්න ඕන. සතිපට්ඨානයෙන් තොර වෙන මාර්ග නැහැ. බුදුදහමේ පෙන්නන ඒකායන මාර්ගය ඒක. දහම විමසීමේ දී මේ වගේ මූලික කරුණු කිහිපයක් තියෙන බවත් අපි දැනගෙන හිටියොත් රැවටීම් වලට අහුවෙන්නේ නැහැ. මේ කියන්නේ බුදුදහමද නැත්ද කියලා තමන්ටම ගළපලා බලන්න පුළුවන් වෙනවා.

නිවන් මාර්ගය කියලා පෙන්නන අර්යාෂ්ඨාංගික මාර්ගය කිව්වත් ඔය අදහසම වෙන්න ඕන. අර්යාෂ්ඨාංගික මාර්ගය පටන්ගන්නේ සම්මාදිට්ඨියෙන්. සම්මාදිට්ඨියත් දෙආකාරයකින් දේශනා කරලා තියෙනවා (මහා චත්තාරීසක සූත්‍රය[21]) - ලෞකික සම්මාදිට්ඨිය සහ ලෝකෝත්තර ආර්ය සම්මාදිට්ඨිය (චතුසච්ච සම්මාදිට්ඨිය) කියලා. නියත මිථ්‍යාදෘෂ්ටියෙන් මිදෙන්න ලෝකයට අයිති සම්මාදිට්ඨිය උදව් වෙනවා. ඒකටම තමයි කම්මස්සකතා සම්මාදිට්ඨිය කියන්නේ - ඒක කර්මඵල ගැන විශ්වාස කරන දැක්මක්. කම්මස්සකතා සම්මාදිට්ඨියත් නැත්නම් - ඒ කියන්නේ පින් පව් ගැන කිසිම විශ්වාසයක් නැත්නම්, එතන තියෙන්නේ මිථ්‍යාදෘෂ්ටිය. නමුත් කම්මස්සකතා සම්මාදිට්ඨිය ලෝකයට අයිති බව අපි දැනගත යුතුයි. සසරේ යන කෙනාට විපාක දෙන්නේ කොහොමද කියලා තමයි ඒකෙන් පැහැදිලි කරන්නේ. ඒ තමයි ලෝකයේ ඉපදෙමින් මැරෙමින් යන කෙනාට කර්ම විපාක බලපාන්නේ කොහොමද කියන පැත්ත. ඒ ගැනත් බුදුකෙනෙක් දේශනා කරනවා. නමුත් ඒක ලෝකයෙන් එතෙර වෙන සම්මාදිට්ඨිය

[20] රොහිතස්ස සූත්‍රය - සංයුත්තනිකාය, සගාථවග්ගය, දෙවපුත්තසංයුත්තය, නානාතිත්ථියවග්ගය.

[21] මහා චත්තාරීසක සූත්‍රය - මජ්ඣිමනිකාය, උපරිපණ්ණාසකය, අනුපදවග්ගය.

නෙවෙයි. ලෝකයෙන් එතෙර වෙන සම්මාදිට්ඨියට කියන්නේ චතුසච්ච සම්මාදිට්ඨිය කියලා.

ඊළඟට පටිච්චසමුප්පාදය - අපි එක් ආකාරයකට අහලා තියෙනවා අවිජ්ජා පච්චයා සංඛාරා, සංඛාර පච්චයා විඤ්ඤාණං... ආදී වශයෙන් දුකට යනකම් සිදුවෙන ක්‍රියාවලිය. ඒ වගේම නිරොධා කියලා පැත්තකුත් තියෙනවා. අවිද්‍යාව ඉතුරු නැතුව නිරුද්ධ වුණොත් සංඛාර නිරුද්ධයි... ආදී වශයෙන් - අනුලෝම පටිච්චසමුප්පාදය සහ පටිලෝම පටිච්චසමුප්පාදය. දුක ඇතිවෙන සහ දුක නූපදින ස්වභාවය. සාමාන්‍යයෙන් අර්ථ දක්වනවා දුක 'නැතිවෙන' හැටි කියලා, නමුත් නිවැරදි ව්‍යවහාරය තමයි දුක්ඛ 'නිරෝධය'. <u>**නැතිවෙන හැටි නෙවෙයි**, **නූපදින ගතියටයි නිරෝධය කියලා කියන්නේ**</u>.

පටිච්චසමුප්පාදය තව වචනයකින් හඳුන්වනවා ඉදප්පච්චයතාවය කියලා. පටිච්චසමුප්පාදය කිව්වහම කරුණු දෙකක් අතර සම්බන්ධයක් පෙන්නනවා. අවිජ්ජා සහ සංඛාර ගත්තොත්; පච්චයා පැත්තකුයි, නිරොධා පැත්තකුයි තියෙනවා. පච්චයා කියන එකෙන් හටගන්න හැටි පෙන්නනවා. නිරොධා කියන එකෙන් නූපදින හැටි පෙන්නනවා. අවිද්‍යාව නැත්නම් සංඛාර උපදින්න බැහැ. පටිච්චසමුප්පාදයේ ඕනෑම අංග දෙකක් ගත්තොත් හේතුවයි, ඵලයයි අතර සම්බන්ධයයි එතනින් පෙන්නන්නේ. හේතුවයි, ඵලයයි අතර තියෙන සම්බන්ධයට තමයි පටිච්චසමුප්පන්න බව, නැත්නම් ඉදප්පච්චයතාව කියලා කියන්නේ.

'මෙය ඇති කල්හි මෙය වෙයි - **ඉමස්මිං සති ඉදං හොති**'[22] - සමුදය තියෙන කොට ඵලය තියෙනවා. ඒකේ අනිත් පැත්ත තමයි; **ඉමස්මිං අසති ඉදං න හොති** - මෙය නැති කල්හි මෙය නොවෙයි කියන ධර්මතාවය. ඒ ධර්මතාවයට තමයි ඉදප්පච්චයතාව කියන්නේ. හේතු යෙදුණේ නැත්නම් ඵලයක් හටගන්න බැහැ. එතකොට 'තියෙන දෙන නැතිවුණා' කියන එකෙයි, 'හටගෙන නැහැ' කියන්නෙයි

[22] කච්චානගොත්ත සූත්‍රය - සංයුත්තනිකාය, නිදනවග්ගය, අභිසමයසංයුත්තය, ආහාරවග්ගය.

කරුණු දෙකක් බවත්, ඒ දෙකේ වෙනසත් අපි නුවණින් දකින්න ඕන.

උදාහරණයක් වශයෙන්; හෙවනැල්ලක් හටගන්න හේතු තියෙනවා. එතකොට හේතු තිබුණොත් හෙවනැල්ල තියෙනවා. ඒ හේතු යෙදුණේ නැත්නම් අපට හෙවනැල්ලක් ගැන කතා කරන්න බැහැ. හෙවනැල්ල ඉපදිලා නැහැ කියලා කියනවා මිසක් හෙවනැල්ල නැතිවුණා කියලා කිව්වොත් වැරදියි නේද? ගැඹුරින් බලන කොට ඉපදිලා නැහැ කියන ස්වභාවයට තමයි නිරෝධය කියන්නේ. අපි පුරුදුවෙලා තියෙන්නෙම ඇතිවෙලා-නැතිවෙන එකට නිරෝධය කියන්න. සාමාන්‍ය ලෞකික අර්ථයෙන් ඒ වචන දෙක යෙදෙනවා. නමුත් ලෝකෝත්තර දර්ශනයේ දී පටිච්චසමුප්පන්න බව දකින්න ඕන. 'මෙය ඇති කල්හි මෙය වෙයි, මෙය නැත්නම් ඔහොම වෙන්න බැහැ' කියන ධර්මතාවය.

ඒ ධර්මතාවය තේරුම් කරන්න තමයි මම නිතරම අර බල්ලාගේ උපමාව ගන්නේ. ඒක අපට තේරුම් ගන්න පහසුයි. වතුරේ තව බල්ලෙක් ඉන්නවා කියලා හිතාගෙනයි ගොඩ ඉන්න බල්ලා වතුරට බුරන්නේ. වතුරේ ඉන්න බල්ලා ගත්තොත් එතන පටිච්චසමුප්පන්න සම්බන්ධයක් පෙන්නන්න පුළුවන්. ඒ තමයි - ගොඩ ඉන්න බල්ලාගේ මෝඩකම යෙදෙනතාක් කල් ඌට වතුරේ බල්ලෙක් ඉන්නවා. සමුදය යෙදෙන තෙක් ඵලය තියෙනවා. ඒ මෝඩකම අප තුළ යෙදෙන්නේ නැති නිසා ඒ උපමාවත් එක්ක බලන කොට අපි ටිකක් දියුණුයි! ඒ නිසා අපට වතුරේ බල්ලෙක් උපදින්නේ නැහැ. අප තුළ එතන බල්ලෙක් හටගන්න හේතු නැහැ. එතකොට බල්ලෙක් ඇතිවුණා-නැතිවුණා කියන එක නෙවෙයි මේ කියන්නේ. හේතු යෙදෙන්නේ නැති නිසා එතන අපට බල්ලෙක් උපදින්නේ නැහැ. ඔය උපදින්නේ නැති ස්වභාවයට තමයි නිරෝධය කියන්නේ. ඒක තමයි ඇත්ත තත්වය.

බල්ලාගේ උපමාවේ දී ඇත්ත තත්වය තමයි - වතුරේ බල්ලෙක් කියන එක නිරෝධ ධර්මයක්. ගොඩ ඉන්න බල්ලාගේ මෝඩකමට තමයි වතුරේ බල්ලෙක් උපද්දවගෙන තියෙන්නේ. හටගෙන නැහැ කියන අර්ථයෙන් තමයි නිරෝධය කියන්නේ. හටගෙන නැති

ස්වභාවයක් මෝඩකම මත උපද්දවාගෙන. වතුරේ ඉන්න බල්ලා තමයි ඵලය. ඒ ඵලය හටගන්නේ අවිද්‍යාව මතයි. මෝඩකම මතයි. අපි තුළ එහෙම බල්ලෙක් උපද්දන අවිද්‍යාව යෙදෙන්නේ නැති නිසා (මේ උපමාවේදී විතරයි!) - අපට බල්ලෙක් හටගන්නේ නැහැ. ඒ ස්වභාවය උපදින්නේ නැහැ. ඒ නූපදින ගතියට තමයි නිරෝධය කියන්නේ. නමුත් අපි කිව්වොත් ඉන්න බල්ලා නැතිවුණා කියලා, ඒක වැරදියි. එතන පෙනීමක් තියෙනවා. නමුත් පෙනීම තිබුණාට මොහොතකටවත් වතුරේ බල්ලෙක් උපදින්නේ නැහැ.

ප්‍රශ්නය: බල්ලෙක් ඉපදිලා තියෙන්නේ බල්ලාගේ හිතේ නේද?

පිළිතුර: අපි දන්නවා වතුරේ බල්ලෙක් ඉපදිලා තියෙන්නේ ගොඩ ඉන්න බල්ලාගේ හිතේ කියලා. නමුත් බල්ලා විශ්වාස කරන්නේ ඌ ඉන්නේ එළියේ කියලා. දැන් ඔය විශ්වාස කරන එළියේ ඉන්න බල්ලා තමයි අපි මෙතන උපමාවට ගන්නේ. ඒකේ ඇත්ත ස්වභාවය - යථාභූත ස්වභාවය නිරෝධයි. එහෙම දෙයක් පනවන්නම බැහැ. මොහොතකටවත් වතුරේ බල්ලෙක් හටගෙන නැහැ. වතුරේ බල්ලෙක් හටගන්නේ මෝඩකම මත විතරයි. ඒ කියන්නේ ගොඩ ඉන්න බල්ලාගේ මෝඩකම මතයි. අපට පෙනෙනවා උගේ හිතේ තමයි මේක හටගෙන තියෙන්නේ කියලා. ඒ වුණාට උගේ මෝඩකමට ඌ හිතනවා එළියේ බල්ලෙක් ඉන්නවා කියලා.

එතකොට එළියේ බල්ලෙක් ඉන්නවා කියන එකට හේතුව මෝඩකම. ඕකට තමයි අවිද්‍යාව කියන්නේ. එතකොට වතුරේ ඉන්න බල්ලා අවිද්‍යාවෙන් කරපු සංඛාරයක් - සංස්කරණයක්. අවිද්‍යාව තියෙනකම් විතරයි ඒ සංඛාරය තියෙන්නේ.

ඔය සිද්ධියට තමයි පටිච්චසමුප්පන්න සම්බන්ධය කියන්නේ. හේතු යෙදුණොත් ඵලය තියෙනවාමයි. මෝඩකම තිබුණොත් බල්ලා ඉන්නවාමයි! නැහැ කිව්වාට වැඩක් නැහැ. අපි ගිහින් කිව්වොත් ඔතන බල්ලෙක් නැහැ කියලා, සමහර විට බල්ලා අපිව විශ්වාස කරලා 'ආ, නැතුව ඇති' කියයි. හැබැයි ඒ අපි කියන හින්දු මිසක් ඇත්ත දැනගෙන නෙවෙයි. එතකොට අපි කියන හින්දු බල්ලෙක් නැහැ කියලා ඌ විශ්වාස කළොත් ඒක දෘෂ්ටියක්. අවබෝධයෙන්

තොරයි. මොකද නැවතත් වතුරට එබෙන කොට 'ආ, බල්ලෙක් ඉන්නවා නේ' කියලා ඌට හිතෙනවා. ආයෙත් මතක් වෙනවා අපි කියපු එක. ඒක දැනුමක් විතරක් මිසක් ප්‍රත්‍යක්ෂයක් නෙවෙයි. එතකොට 'නැහැ' කිව්වොත් ඒක දෘෂ්ටියක් වෙනවා. ඌ ඊටපස්සේ කියන්නේ අතන බල්ලෙක් නැහැ කියලා. හැබැයි අපි බල්ලෙක් නැහැ කියන එකයි, බල්ලා බල්ලෙක් නැහැ කියන එකයි වෙනස්. බල්ලෙක් නෙවෙයි එතන අලියෙක් වුණත් නැහැ කියලා අපට කියන්න පුළුවන්. අපිට එතන මොකක්වත් ඉපදිලා නැහැ. එතකොට 'නැහැ' කියලා නෙවෙයි, 'හටගෙන නැහැ' කියලායි අපි කියන්නේ. යථාර්ථය වෙන්නේ ඒක නිරෝධ ධර්මයක්. යමක් ඉපැද්දුවා නම් උපද්දලා තියෙන්නේ මෝඩකමටයි. දැන් ඔය කිව්වේ උපමාවක් විතරක් බව තේරුම් ගන්න.

අපේ තත්වයත් ඔය හා සමානයි. අපිට ලෝකයේ බොහෝ දේවල් තියෙනවා. දහමේ පෙන්නන්නේ ඒ තියෙන හැම එකක්ම ආයතන මුළාවෙන් උපද්දලා තියෙන්නේ කියලා. අපි ඒ මුළාවේ ඉන්නකම් ඒ බව අපට පෙනෙන්නේ නැහැ. හැබැයි තියෙනවා කියලා මොනවාම දෙයක් හෝ තියෙනවා නම්, ඒ හැම එකක්ම ආයතන මුළාවකින්මයි උපද්දලා තියෙන්නේ. ඇයි එහෙම කියන්නේ? අපට ලෝකය ගැන දැනගන්න පුළුවන් ආයතන හරහා විතරයි - ඇහැ, කන, නාසය, දිව, ශරීරය, මනස. ඔය හයෙන් හැරෙන්න අපට යමක් දැනගන්න විදියක් නැහැ. මොනවාම හරි දෙයක් අපි මේ වෙනකම් දැනගත්තා නම් දැනගෙන තියෙන්නේ ඔය ආයතන හය හරහායි.

එතකොට මොනවා හරි දැනගත්තා කියන්නේ එතන ආයතන වලට අදාළ විඤ්ඤාණයක් පහළ වුණා නේද? ඇහෙන් දැනගත්තා කියන්නේ චක්ඛු විඤ්ඤාණය පහළ වෙනවා. ආයතන හයෙන්ම ඔය ටික තමයි වෙන්නේ. එතකොට විඤ්ඤාණයෙන් කියපු දෙයක් තමයි අපි දැනගෙන තියෙන්නේ. තව විදියකට කියනවා නම් අපි විඤ්ඤාණයට අහුවෙලා. මේ දැනගන්න ගතියටයි විඤ්ඤාණය කියන්නේ. වෙන අමුතු දෙයක් නෙවෙයි. එතකොට මේ ලෝකය ගැන මෙපමණ කල් අපි දන්න හැම දෙයක්ම විඤ්ඤාණයෙන් දැනගත්ත දේවල්.

බුදුරජාණන් වහන්සේ විඤ්ඤාණයට උපමා කරන්නේ මායාකාරයෙක් කියලායි - **මායූපමඤ්ච විඤ්ඤාණං** (එණපිණ්ඩූපම සූත්‍රය [23]). විඤ්ඤාණය කියන්නේ මැජික්කාරයෙක් වගෙයි. එහෙනම් ඇත්ත කියලා හිතාගෙන මැජික් සංදර්ශනයක් තමයි අපි බලලා තියෙන්නේ! දැන් බල්ලාගේ උපමාව නැවතත් යොදගන්න - බල්ලාගේ මෝඩකමට හිතෙන්නේ බල්ලෙක් ඉන්න හින්දමයි පෙනෙන්නේ කියලා. නැත්නම් පෙනෙන නිසා බල්ලෙක් ඉන්නවාමයි කියලා. ඌට ඒක ඇත්තම වෙලා. නමුත් ඔය දෙතැනම තියෙන්නේ එකම මුළාව. ඒ දෙකම දෘෂ්ටි දෙකක්. ඒ ඉන්නවා, තියෙනවා කියන ගතිය දෙන්නේ බල්ලාගේ විඤ්ඤාණයෙන්. ඒක හිතෙන් හැදුවේ. එතකොට බල්ලාගේ විඤ්ඤාණයෙන් කරපු මායාවක් තමයි ඔය එළියේ ඉන්න බල්ලෙක් පෙනෙනවා කියන්නේ. තව විදියකට කිව්වොත් ඌට හිතෙනවා තමන් අත්දකින්නේ එළියේ තියෙන දෙයමයි කියලා. ඒ ඇයි? මේ ඇහෙන් පෙනෙන නිසා.

එතකොට ඒක පිලිඅරගෙන සිතන, කියන, කරන හැම දෙයක්ම අවිද්‍යාවෙන් කරන කර්ම වෙනවා. ඒවා අපව සසරේ ගෙනියනවා, ඒවා දුක්. බල්ලෙක් ඉන්නවා කියලා හිතාගෙන බිරුවත්, වල්ගේ වැනුවත්, ඌට කෑම දෙන්න හිතුනත්, ගලක් ගහන්න හිතුනත්, ඒ සියල්ලක්ම අවිද්‍යාවෙන් කරන කර්ම - සංඛාර. ඒවාට විපාක තියෙනවා. ඇයි විපාක තියෙන්නේ? ඒවා කරන කෙනෙක් ඉන්න නිසා. පුද්ගලයෙක්. කවුද ඉන්නේ? අර වතුරේ බල්ලෙක් ඉන්නවා කියලා හිතපු ගොඩ ඉන්න බල්ලා. දැන් වතුරේ බල්ලා ඉන්න තාක්කල් ඒ බල්ලාව හදපු කෙනෙකුත් ඉන්නවා.

ප්‍රශ්නය: ඒ අවිද්‍යාව නේද?

පිළිතුර: අවිද්‍යාව විතරක් නෙවෙයි, ඒකට තමයි සක්කාය දිට්ඨිය කියන්නේ. වතුරේ බල්ලෙක් ඉන්නවා කියලා විශ්වාස කරන තෙක් සත්ත්වයෙක්, පුද්ගලයෙක් ඉන්නවා. ඒ ඇයි? එයාගේ ලෝකයට තමයි වතුරේ බල්ලා ඉන්නේ.

ප්‍රශ්නය: සාමාන්‍ය ජීවිතයට ඒ උපමාව ගළපන්නේ කොහොමද?

[23] එණපිණ්ඩූපම සූත්‍රය - සංයුත්තනිකාය, ඛන්ධකවග්ගය, ඛන්ධසංයුත්තය, පුප්ඵවග්ගය.

පිළිතුර: ඇහෙන් දැකලා දෙයක් තියෙනවා, ඒ තියෙන නිසාමයි පෙනෙන්නේ කියලා අපටත් හිතෙනවා නේ. දැන් මෙතන වටපිට බැලුවහම එක එක දේවල් අපට පෙනෙනවා. එතකොට අපට හිතෙන්නේ ඒවා තියෙන නිසායි පෙනෙන්නේ කියලා. මෙතන ඇත්තටම වුණ සිද්ධිය ගැන විමසීමක් කළොත් - අපි කොහොමද දැනගත්තේ? ඇහෙන් දැකලා. ඇහෙන් දකින කොට අපි හිතනවා තියෙන හින්දු පෙනෙනවා, පෙනෙන හින්දු ඒක තියෙනවා කියලා. හැබැයි බල්ලා ඔය ක්‍රියාවම කළහම අපි කියනවා ඌට මෝඩයි කියලා. පෙනෙන නිසා ඉන්නවා කිව්වහම ඌ මෝඩයි කියනවා. නමුත් හොඳට විමසලා බැලුවොත්, අපිත් ඒකමයි කරන්නේ! ඉතින් ඒ බල්ලාගේ මානසිකත්වයේමයි අපිත් තවම ඉන්නේ. ඒ නිසායි මම නිතරම ඔය බල්ලාගේ උපමාවම යොදගන්නේ.

අපිත් ආයතන පරිහරණය කරන්නේ ඒ මානසිකත්වයෙන්. ඒක තමයි පෘතග්ජන ස්වභාවය. ලෝකයට අයිති විදියට ආයතන පාවිච්චි කරනවා. ඕකට තමයි බුදුරජාණන් වහන්සේ කියන්නේ මාරයාට අහුවුණා කියලා. සංයුත්ත නිකායේ සමිද්ධි සූත්‍ර[24] හතරක් තියෙනවා - සමිද්ධි-දුක්ඛපඤ්හ සූත්‍රය, සමිද්ධි-මාරපඤ්හ සූත්‍රය, සමිද්ධි-ලොකපඤ්හ සූත්‍රය, සමිද්ධි-සත්තපඤ්හ සූත්‍රය. සූත්‍ර අන්තර්ගතය සඳහා සුභද්‍රාරාමයේ කළ දේශනාව බලන්න. (පිටු 1 සිට 6 දක්වා)

සමිද්ධි ස්වාමීන් වහන්සේ බුදුරජාණන් වහන්සේගෙන් ප්‍රශ්නයක් අහනවා කොපමණකින් මාරයා හෝ මාර ප්‍රඥප්තියක් වෙනවාද කියලා. සාමාන්‍ය වචනයෙන් කියනවා නම් 'මාරයා කියන්නේ කවුද?' කියලා අහනවා. ඇස ඇත්නම්, රූපය ඇත්නම්, චක්ඛු විඤ්ඤාණය ඇත්නම්, චක්ඛු විඤ්ඤාණයට අහුවෙන කුමන හෝ ධර්මතාවයක් ඇත්නම්, එතන මාරයා ඉන්නවා. මේ එකක් හරි තියෙනවා නම් එතන මාරයා ඉන්නවා කියලා බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා. ආයතන හයටම ඔය විදියට දේශනා කරනවා.

[24] සමිද්ධි-දුක්ඛපඤ්හ සූත්‍රය, සමිද්ධි-මාරපඤ්හ සූත්‍රය, සමිද්ධි-ලොකපඤ්හ සූත්‍රය, සමිද්ධි-සත්තපඤ්හ සූත්‍රය - සංයුත්තනිකාය, සළායතනවග්ගය, වෙදනාසංයුත්තය, මිගජාලවග්ගය

ප්‍රශ්නය: අජ්ඣත්ත, බහිද්ධ දෙක පැහැදිලි කරන්න. අභ්‍යන්තර, බාහිර කියන්නෙත් ඒකමද?

පිළිතුර: ඇස, කන, නාසය, දිව, කය, මනස අජ්ඣත්තයි. ඒවාට අරමුණු වෙන රූප, ශබ්ද, ගන්ධ, රස, පොට්ඨබ්බ, ධම්ම බහිද්ධයි. දේශනාවල ඒ වචන ඒ ආකාරයෙන්ම තියෙනවා. සූත්‍ර වලට තේරුම් දෙනකොට අපි ටිකක් පරිස්සම් වෙන්න ඕන. (අපි අපේ කෝණයෙන් යමක් විග්‍රහ කරනකොට, බුද්ධ දේශනාවේ තියෙන්නේ අජ්ඣත්ත බහිද්ධ කියලා, නමුත් අපි පුරුදුවෙලා තියෙන්නේ අභ්‍යන්තර, බාහිර කියන්න කියලා කිව්වොත් එතකොට අපේ අඩුවක් තියෙනවා නම් ඒක පසුව හඳුගන්න පුළුවන්).

දැන් මේ සමිද්ධි සූත්‍රවල සඳහන් වෙන්නේ **අත්ථි චක්ඛු, අත්ථි රූපා** - එතකොට අජ්ඣත්ත කියලා යෙදෙන්නේ චක්ඛුව, බහිද්ධ වෙන්නේ රූප. ඔය දෙකම තිබුණත්, දෙකෙන් එකක් තිබුණත් මේ සූත්‍රයට ගැළපෙනවා. මේකේ කියන්නේ නැහැ රූපත්, ඇසත් ඇති කල්හි, චක්ඛු විඤ්ඤාණයත් ඇති කල්හි කියලා. එහෙම නෙවෙයි මෙතන යෙදෙන්නේ. එකක් තිබුණත් මාරයා ඉන්නවා.

බල්ලාගේ උපමාවෙන් හිතුවොත් - බල්ලාට වතුරේ බල්ලා ඉන්නවා කියන කොට ඒක තමයි **අත්ථි රූපා** ස්වභාවය. එතකොට මාරයාට අහුවෙලා. එතන දී මගේ ඇහැ තියෙනවා කියලා කිව්වේ නැතුවාට මාරයාට අහුවෙලා. වතුරේ බල්ලා ඉන්නවා කිව්වා නම් ඇති මාරයාට අහුවෙන්න. මගේ ඇහැ තියෙනවා කිව්වත් ඒත් ඔය සිද්ධියමයි. හැබැයි ඕක ගැඹුරෙන් බැලුවොත් ඔය ටික ඔක්කොම එකටමයි යෙදෙන්නේ. එහෙම ධර්මතාවයක් තියෙනවා.

දහම විමසන කොට වචනයක්වත් වෙනස් නොකර පුළුවන් තරම් සූත්‍ර වලටම ගළපන්න ඕන. අපේ අදහස් දැම්මොත් දහම විකෘති වෙන්න පුළුවන්.

ඒ සූත්‍රයේ ඊළඟ කොටසේ කියනවා **නත්ථි චක්ඛු, නත්ථි රූපා, නත්ථි චක්ඛුවිඤ්ඤාණං, නත්ථි චක්ඛුවිඤ්ඤාණවිඤ්ඤාතබ්බා ධම්මා** - එහෙම වුණොත් ඔය කියන මාරයා හෝ මාර ප්‍රඥප්තිය හෝ

පිහිටන්නේ නැහැ. ඔය එකක් හෝ පිහිටන්නේ නැතිනම් මාරයාට හටගන්න බැහැ.

මේ විදියට ඔය සූත්‍ර හතරේම පෙන්වනවා - ආයතන තිබුණොත් ලෝකය තියෙනවා, මාරයා ඉන්නවා, දුක තියෙනවා, සත්ත්වයා ඉන්නවා. නත්ථි කියලා මේවා නොපැනවෙන බවකුත් දේශනා කරනවා. ඔතන ලොකු ගැඹුරක් තියෙනවා.

ප්‍රශ්නය: ඉපදුණොත් ඔය ඔක්කොම තියෙනවා නේද?

පිළිතුර: ඉපදුණොත් ඔය ඔක්කොම තියෙනවා. එතකොට ඉපදුණා කියන්නේ මොකක් ද? ජාති කියන්නේ හටගැනීම. ජාතිය කියන කොට අපට එකවරම මතක්වෙන්නේ මව්කුසකින් ඉපදීමක් ගැනයි. එහෙම ඉපදෙන කොටත් ඔය ටික තියෙනවා. ඒ එක විශේෂ අවස්ථාවක්. ඇහැක් උපදින්නේ මොන වෙලාවෙද කියලා දහමට අනුව හොයන්න ඕන. දකින මොහොතෙදි ඇහැ උපදිනවා. අහන වෙලාවෙදී කන උපදිනවා. කන උපදින වෙලාවෙදී ඇහැ ඉපදිලා නැහැ. එක මොහොතක පහළවෙන්නේ එක විඤ්ඤාණයක් විතරයි කියලාත් දේශනාවේ තියෙනවා. උණ්ණාභබ්‍රාහ්මණ සූත්‍රය [25]. විඤ්ඤාණ දෙකකට එකම මොහොතේ හටගන්න බැහැ. එතකොට එක ක්ෂණයක දී ඉපදෙන්නේ එක ආයතනයක් විතරයි. එක ආයතනයක් ඉපදිලා කියන්නේ අනික් ආයතන ඒ වෙලාවේ ඉපදිලා නැහැ. දැකීම කරන්නේ නැති වෙලාවේ දී ඇහැක් තියෙනවා කියන එකේ තේරුමක් නැහැ. ඇසීම කරන්නේ නැත්නම් කනක් තියෙනවා කියන එකේ තේරුමක් නැහැ. ආයතනයට අනුකූල ක්‍රියාව කරනවා නම් විතරයි ආයතනයක් තියෙනවා කියන්න පුළුවන් වෙන්නේ.

ප්‍රශ්නය: භෞතික කන ගැන නෙවෙයි නේද මේ කතා කරන්නේ?

පිළිතුර: මෙතනදි අපට සමහරවිට හිතෙනවා භෞතික ස්වභාවය ගැන නෙවෙයි මේ කතා කරන්නේ කියලා. එහෙම හිතන කොට අපට හිතෙන්න පුළුවන් බුදුරජාණන් වහන්සේ ලෝකය කියලා

[25] උණ්ණාභබ්‍රාහ්මණ සූත්‍රය - සංයුත්තනිකාය, මහාවග්ගය, ඉන්ද්‍රියසංයුත්තය, ජරාවග්ගය.

අදහස් කරන්න ඇත්තේ වෙනත් දෙයකට කියලා. ඒකත් විසඳ ගතයුතු තැනක්.

අපි ඉන්න භෞතික ලෝකය ගැනමයි බුදුරජාණන් වහන්සේ මේ කියන්නේ. අපි දන්න ලෝකය ගැනමයි මේ විස්තර කරන්නේ. ලෝකය හෝ ලෝක ප්‍රඥප්තියක් කියන කොට අපි පනවන ලෝකය ගැනමයි මේ බුදුරජාණන් වහන්සේ විස්තර කරන්නේ. අමුතු ලෝකයක් ගැන නෙවෙයි. වැදගත් දෙය තමයි, අපි ඉන්න තැනින් පටන් අරගෙන දහමේ ගැඹුරු පැත්තට යන්න ඕන.

ඇහෙන් දැකීම ගැන කතා කරන කොට අපි යමක් දකින මොහොත ගැනමයි මේ කතා කරන්නේ. ඇසීමක් ගැන කතා කරන කොට අපි අහන මොහොත ගැනයි මේ කියන්නේ. එතකොට ආයතන උපදින්නේ මවුකුසෙන් උපදින වෙලාවට ද, නැත්නම් මොහොතක් මොහොතක් පාසා ද කියලා විමසලා බලන්න. මේ ඉපදීම මොහොතක් මොහොතක් පාසා සිදුවෙන දෙයක් බව එතකොට නුවණින් පෙනෙයි. දකින මොහොතේ ඇහැ ඉපදුණා, ඊළඟට ශබ්දය අහන කොට කනක් උපදිනවා. කනක් උපදිනවා කියන්නේ ඒකට අදාළ කනයි, ශබ්දයයි, සොතවිඤ්ඤාණයයි, සොතවිඤ්ඤාණයෙන් දැනගන්න ධර්මතායි - සියල්ලක්ම උපදිනවා. ඒවා ඉපදුණොත් මාරයා ඉපදුණා, ලෝකය ඉපදුණා, දුක ඉපදුණා, සත්ත්වයා ඉපදුණා වෙනවා. මේ සූත්‍රයට ගළපලා බැලුවොත් අපේ ආයතනය ක්‍රියාත්මක වෙන ඕනෑම ක්ෂණයක ඔය හතරම උපදිනවා.

එතකොට ඉපදීම කියන්නේ ක්ෂණයක්, ක්ෂණයක් පාසා සිදුවෙන සංසිද්ධියක් - සම්මාදිට්ඨි සූත්‍රය[26]. **යා තෙසං තෙසං සත්තානං තම්හි තම්හි සත්තනිකායෙ ජාති, සඤ්ජාති, ඔක්කන්ති, අභිනිබ්බත්ති, ඛන්ධානං පාතුභාවො, ආයතනානං පටිලාභො - අයං වුච්චතාවුසො ජාති.** ස්කන්ධයන්ගේ පහළවීමට, ආයතනයන්ගේ පටිලාභයට තමයි ජාති කියන්නේ. මේ තියෙන්නේ ආයතනයන්ගේ පටිලාභයක්. ආයතන හයෙන් එකක් ඉපදුණොත් ජාතිය සිද්ධවෙලා. මොහොතක් මොහොතක් පාසා ජාතිය තියනවා.

[26] සම්මාදිට්ඨි සූත්‍රය - මජ්ඣිමනිකාය, මූලපණ්ණාසපාලි, මූලපරියායවග්ගය,

ප්‍රශ්නය: ආයතන ඉපදෙන බව නොදැක හිටියොත් කෙලෙස් නේද? එහෙම නම් අවධානයෙන් හිටියොත් මොකද වෙන්නේ?

පිළිතුර: දැක්කත් කෙලෙස්, නොදැක්කත් කෙලෙස්! අවධානයෙන් හිටියත් ඇහැ ඉපදුණා නම් ඒ **අසී චක්ඛු** අවස්ථාව. එතන මාරයා, ලෝකය, දුක, සත්ත්වයා කියන හතරම තියෙනවා. සූත්‍ර වලට ගළපනකොට 'මෙය ඇති කල්හි මෙය වෙයි' - **ඉමස්මිං සති ඉදං හොති** කියන පටිච්චසමුප්පන්න ධර්මතාවයයි ඔය පෙන්වන්නේ කියන බව වැටහෙන්න ගන්නවා.

ප්‍රශ්නය: ඇසෙන් දකින්නේ නැතුව අපේ හිතේ තියෙන දෙයක් මතක්වෙන කොට මොකක්ද වෙන්නේ?

පිළිතුර: ඒක අහුවෙන්නේ හයවෙනි ආයතනයට - මනසට. මන-ධම්ම-මනොවිඤ්ඤණ අවස්ථාව. මනසත් ආයතනයක්. දැන් ප්‍රශ්නය වෙන්නේ අපි දැක්කත් නැතත් මාරයා හැම මොහොතේම අපි ළඟ ඉන්නවා. අපි ජාතිය මච්කුසෙන් ඉපදුණ වෙලාවට විතරක් දැම්මොත් එහෙනම් ඒ වෙලාවේ විතරයි වෙන්න ඕන මාරයා ඉන්නේ. එහෙම බේරෙන්න බැහැ. ආයතනයක් ඉපදුණොත් මාරයා, ලෝකය, දුක, සත්ත්වයා කියන හතරම තියෙනවා.

ප්‍රශ්නය: එතකොට අපට මාරයාගෙන් මිදෙන්න ක්‍රමයක් නැත්ද?

පිළිතුර: බුදුරජාණන් වහන්සේ ඒ සඳහා ක්‍රමයක් දේශනා කරලා තියෙනවා. ඒ මිදෙන ක්‍රමයත් මේ දහමෙන්මයි හොයාගන්න ඕන. ඒ සඳහා අපි ඉන්න තැන පළමුවෙන්ම තේරුම්ගන්න ඕන. අපි ජීවත්වෙනවා කියලා මේ ආයතන පරිහරණය කරනවා කියන්නේ දුකයි පරිහරණය කරන්නේ. ඒ බව අපට පෙනෙන්නේ නැහැ. බුදුරජාණන් වහන්සේට විතරයි එහෙම දෙයක් පෙන්නලා දෙන්න පුළුවන් වෙන්නේ. ඒ නිසායි අපි හරිම වාසනාවන්තයි කියලා කියන්නේ. දහමක් අහන්න ලැබෙන එක ක්ෂණ සම්පත්තියක්. අපට මේ වගේ ධර්මතාවයක් කවදාවත් තනියෙන් හිතාගන්න බැහැ. එතන දී තමයි මූලික ශ්‍රද්ධාව යෙදෙන්නේ. බුද්ධ දේශනාව ඇත්ත කියන තැනින් අපි දහම විමසන්න පටන්ගන්න ඕන.

ප්‍රශ්නය: මොකක්ද මේ 'සත්ත්ව' කියන්නේ?

පිළිතුර: සක්කාය දිට්ඨියටම තමයි 'සත්ත්ව' කියන්නේ.

බුදුරජාණන් වහන්සේ දුකෙන් මිදෙන ඒකායන මාර්ගය හැටියට දේශනා කරලා තියෙන්නේ සතර සතිපට්ඨානයයි. (සතිපට්ඨාන සූත්‍රය [27]). අපට හොයාගන්න වෙනම මාර්ග නැහැ. සතර සතිපට්ඨානය තුළ තමයි මුළු ධර්මතාවයම තියෙන්නේ. අපේ සාමාන්‍ය ජීවිතයට සතිපට්ඨානය ගළපන්න ඕන. අපි දැන් දුක ගැන ටිකක් අහලා දැනගත්තා. අපි දුක දැක්කා නෙවෙයි නමුත් බුදුරජාණන් වහන්සේ දේශනා කරලා තියෙනවා ආයතන පනවාගැනීම දුකයි කියලා. අපට තවම ඒ දුක දැනිලා නැහැ. 'ඇහැක් උපදින එකේ මොකක්ද තියෙන දුක' කියන තැන තමයි අපි ඉන්නේ. අපේ ප්‍රඥාවට ඒ දුක තවම අහුවෙලා නැහැ. නමුත් අපි දේශනා තුළින් දුක ගැන අහලා දැනගෙන තියෙනවා.

ඊළඟට ඒ දැනගත් දෙය අපේ දැක්මක් වෙන්න ඕන. **ඤානං පස්සං යථාභූතං** කියලා දේශනාවේ තියෙනවා. දැනගත්තා කියන්නේ **ඤානං** මට්ටම විතරයි. නමුත් ඒක තවම තමන්ගේ දැක්මක් වුණේ නැහැ. පොතේ මෙහෙම තියෙනවා කියලා තවම දැනගත්තා විතරයි. ඔය දෙක අතර වෙනසත් අපි තේරුම් ගන්න ඕන. දැන් අපට කියන්න පුළුවන් අහවල් සූත්‍රයේ මෙහෙම තියෙනවා, අර ස්වාමීන් වහන්සේ මෙහෙම කිව්වා කියලා විතරයි. ඒක දැනුමක් විතරයි. තමන්ගේ දැක්මක් නෙවෙයි.

පස්සං කියන කොට ඒක අපේම දැක්මක් විදියට කියන්න පුළුවන්වෙන්න ඕන. කවුරුවත් කිව්ව නිසා නෙවෙයි, මේක මෙහෙමමයි කියලා කියන්න පුළුවන් නම් ඒක තමන්ගේ දැක්මක් වෙනවා. **ඤානං පස්සං යථාභූතං** කියන එක වැදගත්. වාසිජටොපම සූත්‍රය[28], සබ්බාසව සූත්‍රය[29] ආදී සූත්‍රවල දේශනා කරලා තියෙනවා **ඤානං පස්සං යථාභූතං** - යථාභූත ස්වභාවය දන්න දකින කෙනෙක්

[27] මහාසතිපට්ඨාන සූත්‍රය - දීඝනිකාය, මහාවග්ගය

[28] වාසිජටොපම සූත්‍රය - සංයුත්තනිකාය, ඛන්ධකවග්ගය, ඛන්ධසංයුත්තය, පුප්ඵවග්ගය

[29] සබ්බාසව සූත්‍රය - මජ්ඣිමනිකාය, මූලපණ්ණාසකය, මූලපරියායවග්ගය

වුණොත් විතරයි ආස්‍රව ක්ෂය කරන්න, මාර්ගය වඩන්න පුළුවන් කියලා. නැත්නම් ආස්‍රව ක්ෂය කරන්න බැහැ - **නො අජානතො නො අපස්සතො** - මේ සූත්‍රවල ඒ විදියටම කියලා තියෙනවා.

ඊළඟට වාසිජටොපම සූත්‍රයේ අහනවා; **කිඤ්ච භික්ඛවෙ ජානතො කිං පස්සතො ආසවානං ඛයො හොති?** - කුමක් දන්න, කුමක් දකින කෙනාටද ආස්‍රව ක්ෂය කරන්න පුළුවන්? කියලා. **ඉති රූපං, ඉති රූපස්ස සමුදයො, ඉති රූපස්ස අත්ථගමො** - මේ වචන තුන හරිම වැදගත්. මේ ආකාරයටම වේදනාවට, සංඥාවට, සංඛාරයට, විඤ්ඤාණයටත් කියනවා. සමුදය කියන කොට 'හටගැනීම' කියන අර්ථයෙන් එහාට යන්න ඕන. 'හටගත්තේ ඇයි, හටගත්තේ කොහොමද, මොනවා නිසාද, හටගන්න හේතුව' කියන අර්ථයෙන් විමසන්න ඕන. දැන් රූපය ගත්තොත් රූපය ගැන විතරක් නෙවෙයි, ඔය ජාති තුන ගැනම විමසන්න ඕන. ඒ බව දන්න දකින කෙනාට විතරයි රූපය පිළිබඳව තියෙන කෙලෙස්, ආස්‍රව ක්ෂය කරන්න පුළුවන්. ඉතින් අපට මේවා ගැන දැනගන්න තියෙන්නෙත් බුදුදහමෙන්ම විතරයි. සූත්‍ර තුළින්ම විතරයි. කිසි කෙනෙකුගේ පෞද්ගලික මත වලින් අපට වැඩක් නැහැ. සූත්‍ර විමසීමෙන් දහම දැනගෙන, ඊටපස්සේ ඒ දැනගත් දෙය තමන් තුළින් දැක්මක් කරගන්න වෙනවා. අපි දහම කියලා නොයෙක් දේවල් පුහුණු කරලා තියෙන්න පුළුවන්. නමුත් පිරිසිදු බුද්ධ දේශනාව මොකක්ද කියලා නුවණින් විමසිය යුතුයි.

ඉතින් **ඉති රූපං, ඉති රූපස්ස සමුදයො, ඉති රූපස්ස අත්ථගමො** කියන තුන දැනගත්තොත් විතරයි කෙලෙස් දුරුවෙන මාර්ගය වඩන්න පුළුවන් වෙන්නේ. ඒක තමයි ආස්‍රව ක්ෂය කරන මාර්ගය. ඔය තුන නොදන්නා කෙනා මොන මාර්ගය වැඩුවත් කෙලෙස් නම් දුරුවෙන්න විදියක් නැහැ!

ප්‍රශ්නය: ශබ්දයක් ඇසෙන අවස්ථාවට මේක ගළපන්නේ කොහොමද?

පිළිතුර: ශබ්දයක් ඇහෙන කොට මූලිකව අහුවෙන්නේ එළියේ කම්පනයක්, නැත්නම් ධාතුව ධාතුව ගැටීම නිසා තමයි ශබ්දය

හටගන්නේ කියන තැනින් තමයි අපි පටන්ගන්නේ. මේක තමයි සාමාන්‍යයෙන් ලෝකයා දන්න ආකාරය. ඒ බව දැනගත්තේ කොහොමද කියලා ඇහුවොත් අපට කියන්න වෙනවා මේ ආයතන නිසායි ඕක දැනගත්තේ කියලා. ලෝකයට අයිති ඕනෑම කෙනෙක් ඕක පිළිගන්නවා. නමුත් බුදුදහමේ දේශනා කරලා තියෙනවා ලෝකයාට ඇත්ත, ආර්ය දර්ශනයේදි බොරුවක් කියලා. (ද්වයතානුපස්සනා සූත්‍රය[30]) ඒ නිසා අපි දන්න, අපි ඉන්න තැනින් පටන්අරගෙන ක්‍රම ක්‍රමයෙන් ලෝකෝත්තර දහම දක්වා ප්‍රඥව වැඩිය යුතුයි.

ඉති රූපං කියන කොට රූපය කියන්නේ මොකක්ද කියලා විමසලා බැලුවොත් - ඇහැයි-රූපයයි, කනයි-ශබ්දයයි, නාසයයි-ගන්ධයයි, දිවයි-රසයි, කයයි-පොට්ඨබ්බයයි ගැන දහමේ සඳහන් වෙනවා. රූපස්කන්ධයට මේ ආයතන පහම (ඇහැ, කන, නාසය, දිව, ශරීරය) අයිති වෙනවා. එතෙන්ට මනස යෙදෙන්නේ නැහැ. ඒ පහේ අජ්ඣත්ත එකත් රූපස්කන්ධය, බහිද්ධ එකත් රූපස්කන්ධය. ගැඹුරෙන් බලන කොට ඔය දහය තමයි **ඉති රූපං** කියන තැන. මුළු ලෝකයේම තියෙන රූප ඔතැනට අයිති වෙනවා.

තව විදියකට, ඔය රූපය තෝරගන්න ක්‍රම තමයි සතිපට්ඨානයේ කායානුපස්සනාවේ තියෙන්නේ. සතිපට්ඨානයේ කායානුපස්සනාව යටතේ එන ඕනෑම භාවනාවක රූපය මොකක්ද කියන එක හඳුනගන්න මුලින්ම වැඩපිළිවෙලක් තියෙනවා. ආනාපානසතිය ගත්තොත්, හුස්ම දිහා බලාගෙන ඉඳලා හුස්ම කියන රූපය ගැන දැනගන්න පුළුවන්. දිග/කෙටි හුස්ම, සංසිඳුන හුස්ම, ඇතිවෙලා-නැතිවෙන හුස්ම කියලා හුස්මේ ලක්ෂණ ටික තමයි බලන්නේ. ආනාපානසති සූත්‍රය[31] ගත්තොත්, ඒකේ සඳහන් වෙනවා හුස්ම කියන්නේ කයකට උදාහරණයක් කියලා **කායෙසු කායඤ්ඤතරාහං එවං වදාමි; යදිදං අස්සාසපස්සාසා**. ආශ්වාසයයි, ප්‍රශ්වාසයයි කියන්නේ, කය කියලා මොනවා හරි කොටස් තියෙනවා නම් ඒවායින් එකක් තමයි ආශ්වාස කය හෝ ප්‍රශ්වාස කය. තව විදියකට

[30] ද්වයතානුපස්සනා සූත්‍රය - බුද්දක නිකාය, සුත්ත නිපාතය, මහා වර්ගය.
[31] ආනාපානසති සූත්‍රය - මජ්ඣිමනිකාය, උපරිපණ්ණාසකය, අනුපදවග්ගය

කිව්වොත් 'දෙයක් - රූපයක්'. එතකොට ආශ්වාසය කියන්නෙත් රූපයක්, ප්‍රශ්වාසය කියන්නෙත් රූපයක්. මේක තමයි ආනාපානසති කමටහනේ **ඉති රූපං** කියන අවස්ථාව.

ශරීරය ගැන බලන වෙනත් භාවනාවක් ගත්තොත් - ශරීරය දෙතිස් කුණපයෙන් හැදිලා තියෙනවා (කෙස්, ලොම් ආදි වශයෙන්). එතකොට මේ ශරීර රූපයට තමයි **ඉති රූපං** කියන්නේ. ඉරියව් ගැන බලන කොට, ශරීරය කරන වැඩ ගැන - හිටගෙන, ඉඳගෙන, නිදගෙන, ඇවිදින නොයෙක් ඉරියව්. මේවා ශරීරය හඳුනගන්න ලක්ෂණ. ඉරියව් වලින් තමයි අපි ශරීරය තියෙන හැටි දැනගන්නේ. ඒ තමයි ශරීර රූපය කියන එක. ඊළඟට මළ මිණියක් එක එක අවස්ථාවල කුණුවෙන හැටි - නවසීවථිකය. එතකොටත් බලන්නේ පවතින ශරීරයකට මොකද වෙන්නේ, ඒකේ තත්ත්වය මොකක්ද කියලා. ඕවා බලනකොට අපට රූපයක් ගැන අදහස් ටිකක් එනවා. එක එක්කෙනාට එක එක පැත්තෙන් ඕක විස්තර කරන්න පුළුවන්. ඒ හැමෝම කියන්නේ තමන් තියෙනවා කියලා විශ්වාස කරන ශරීරය ගැන යි.

ප්‍රශ්නය: එතකොට ඒක ද බුදුහාමුදුරුවෝ දකින්න කිව්වේ?

පිළිතුර: තවම ඔය පටන්ගැන්ම විතරයි. ඔය **ඉති රූපං** කියන අවස්ථාව. රූපය කියන්නේ මොකක්ද? ඔය ශරීරය කියන්නේ මොකක්ද කියලා ඇහුවොත් ඔන්න දැන් කියන්න පුළුවන් - 'මෙන්න මේකටයි මම ශරීරය කියන්නේ' කියලා. අපි තවම එතැනින් එහාට ගියේ නැහැ. සමුදය බැලුවේ නැහැ. තවම ශරීරය මොකක්ද කියලා හඳුනගත්තා විතරයි.

කායානුපස්සනාව වඩන්න පටන්ගන්න ඉස්සෙල්ලා අජ්ඣත්ත රූපය සහ බහිද්ධ රූපය කියන්නේ මොකක්ද කියලා දැනගන්න ඕන. **ඉති අජ්ඣත්තං වා කායෙ කායානුපස්සි විහරති, බහිද්ධා වා කායෙ කායානුපස්සි විහරති, අජ්ඣත්තබහිද්ධා වා කායෙ කායානුපස්සි විහරති** කියන අවස්ථාව. එතකොට දේශනාවට අනුව අජ්ඣත්ත රූපයෙත් **කායෙ කායානුපස්සිව** ඉන්න ඕන, බහිද්ධ කයෙත් **කායෙ**

කායානුපස්සිව ඉන්න ඕන, අජ්ඣත්ත බහිද්ධ කයෙත් **කායෙ කායානුපස්සි** වෙන්න ඕන.

එතකොට මේ කයෙහි **කායෙ කායානුපස්සි** වෙනවා කියන්නේ මොකක් ද? දැන් 'කය' කියන්නේ අපි මේ හොයාගත්ත කය. ශරීරය වෙන්න පුළුවන්, හුස්ම වෙන්න පුළුවන් - දැන් භාවනා කරලා හොයාගත්තා නේ කය මේ වගෙයි කියලා. ඒ කයෙහි අනුපස්සනාවක් කරන්න තියෙනවා. ඒ අනුපස්සනාව තමයි **සමුදය ධම්මානුපස්සී වා කායස්මිං විහරති** කියන තැන. ඊළඟට කියනවා **වය ධම්මානුපස්සී වා කායස්මිං විහරති, සමුදය වය ධම්මානුපස්සී වා කායස්මිං විහරති.** ඒක තමයි කළ යුත්ත. තවම අපි කය හඳුනාගැනීමක් විතරයි කරලා තියෙන්නේ. ඒ **ඉති රූපං** අවස්ථාව විතරයි. තමව **ඉති රූපස්ස සමුදයො** අවස්ථාවට ගියේ නැහැ. **සමුදය ධම්මානුපස්සී** වෙන්න කියලායි සතිපට්ඨානයේ පෙන්නන්නේ. අපට ඇත්ත දකින්න ඕන නම්, ඇත්ත අවබෝධ කරන්න ඕන නම් කයේ සමුදය හොයාගන්න වෙනවා. සමුදය 'දන්න-දකින' කෙනාට තමයි මේක කරන්න පුළුවන් වෙන්නේ. නොදන්න කෙනාට බැහැ. මේ ධර්මතාවයන් දන්නේ නැතුව නිකම් භාවනා කළා කියලා බුදුරජාණන් වහන්සේ දේශනා කළ මාර්ගය වැඩෙන්නේ නැහැ. කෙලෙස් දුරුවෙන්නේ නැහැ. ආස්‍රව ක්ෂය කරන්න නම් 'දන්න-දකින' කෙනෙක් විය යුතුයි. **ජානතො අහං භික්ඛවෙ පස්සතො ආසවානං ඛයං වදාමි, නො අජානතො නො අපස්සතො** - දන්නේ නැත්නම්, දැක්කේ නැත්නම් බැහැ. සබ්බාසව සූත්‍රය[32]. මේ පිරිසිදු බුද්ධ වචනය, අපේ අදහසක් නෙවෙයි.

එතකොට මොනවා 'දන්න-දකින' කෙනෙක් ද වෙන්න ඕන. **ඉති රූපං, ඉති රූපස්ස සමුදයො, ඉති රූපස්ස අත්ථගමො** - වාසිජටොපම සූත්‍රය[33]. දැන් අපට යෙදෙන්න වැඩපිළිවෙලක් තියෙනවා. සතරසතිපට්ඨානය තුළ පළමුවෙන්ම සමුදය හොයාගන්න ඕන - **සමුදය ධම්මානුපස්සී වා කායස්මිං විහරති.** සතරසතිපට්ඨානය තමයි එකම මාර්ගය කියලා දේශනා කරලා

[32] සබ්බාසව සූත්‍රය - මජ්ඣිම නිකාය, මූලපණ්ණාසයක, මූලපරියායවග්ගය.

[33] වාසිජටොපම සූත්‍රය - සංයුත්තනිකාය, බන්ධකවග්ගය, බන්ධසංයුත්තය, පුප්ඵවග්ගය

තියෙන්නේ - **එකායනෝ අයං භික්ඛවෙ මග්ගෝ.** මාර්ගය පටන්ගැනීමේ දී පළමුවෙන්ම රූපය හඳුනාගත්තා, ඊළඟට ඒ රූපයේ සමුදය හොයාගන්න තියෙනවා.

අපි වෙනත් පැත්තකින් බැලුවොත් - සමුදය හොයාගත්තා කියනකොට එතන නුවණක් යෙදෙනවා - 'මෙය ඇති කල්හි මෙය වෙයි' කියන ධර්මතාවය යෙදෙන බව. සමුදය තියෙන කොටයි ඵලය උපදින්නේ. එතනම නුවණ යෙදෙනවා 'ඔය සමුදය යෙදුණේ නැත්නම් ඵලයක් උපදින්නේ නැහැ' කියලා. රූපයේ පටිච්චසමුප්පන්න බව තමයි ඒ අවබෝධ වෙන්නේ. එතන දී රූපය පටිච්චසමුප්පන්නයි කියලා තේරුම් ගන්නවා. ඒක දැක්කොත් තමයි දහම දැක්කා වෙන්නේ. ඒ විදියට පටිච්චසමුප්පාදයට ගළපන්න උත්සාහ කරන්න ඕන.

පටිච්චසමුප්පාදය දකින වැඩපිළිවෙලට තමයි **සමුදය ධම්මානුපස්සී** වෙනවා කියන්නේ. රූපයේ ලක්ෂණ ටික විතරක් බැලුවාට මදි. රූපයට මොකද වෙන්නේ කියලා බල බලා ඉඳලා හරියන්නේ නැහැ. ඒ ටික ලෝකයට අයිතියි. ඇයි එහෙම කියන්නේ? ඒ රූප දිහා බලාගෙන ඉන්නේ මොනවායින් ද? අපේ ආයතන වලින්. එතකොට ආයතන අයිති කාට ද? මාරයාට! **සමුදය ධම්මානුපස්සී** වෙනවා කියන්නේ ආයතන ඉක්මවා යන දැක්මක්. අපි මුලින් පටන්ගන්නේ ආයතන වලට අහුවෙලා රූපයේ ලක්ෂණ ටික බලන්න. ඒකට තමයි පූර්ව ප්‍රතිපදව කියන්නේ. එතනින් එන්නේ **ඉති රූපං** කියන දැක්මට විතරයි. ඒකෙන් කරන එකම දෙය තමයි පංච නීවරණ යටපත් කිරීම. ඒ තුළින් සමථයක් වැඩෙනවා. නීවරණ යටපත් වුණ මනසකට දහම දකින්න පහසු යි. නීවරණ වලින් ඇත්ත වැහිලා තියෙන්නේ. **ඉති රූපං** කියලා රූපයේ ලක්ෂණ ටික බැලුවහම නීවරණ යටපත් කරගන්න පුළුවන්. කායානුපස්සනාවේ ඕනෑම භාවනාවක මුලින් තියෙන්නේ ඒ රූපයේ ලෝකයාට අයිති විදියට පෙනෙන ටික. දැන් මළමිණියක් දිහා බලාගෙන හිටියොත් පෙනෙන්නේ අසුභය. දෙතිස් කුණපය බැලුවොත් පෙනෙන්නේ පිළිකුල. ඒක ලෝකයාට දැනෙන දෙයක්. ආයතන වලටයි ඒවා දැනෙන්නේ. ඒකත් අමතක කරන්න එපා. අපි ලෝකයට අයිති

දේවල්ම (මාර ධර්ම) මුලින් යොදුගන්නවා නීවරණ ටික යටපත් කරගන්න. ඒ කරන්නේ පූර්ව ප්‍රතිපදව.

ඊළඟට මාරයාගේ ධර්මයෙන් බුදුරජාණන් වහන්සේගේ ධර්මයට හැරෙන්න වෙනවා. ඒ තමයි **ඉති රූපස්ස සමුදයො** කියන තැන. **සමුදය ධම්මානුපස්සී** වෙන්න ඕන. සමුදය ධර්මය මොකක්ද කියලා හඳුනගන්න ඕන. දැන් ඔය තියෙන කයෙහි සමුදය මොකක්ද කියලා හොයාගන්න ඕන. එතකොට සමුදය හොයාගත්තොත් නුවණක් එනවා 'මෙය ඇති කල්හි මෙය වෙයි' - සමුදය නිසායි ඵලය කියලා. සමුදය නිසායි ඔය රූපය. මේ සමුදය යෙදුණ නිසායි ඔය කය හටගත්තේ. සමුදය යෙදුණේ නැත්නම්? නොහටගැනීම - නිරෝධය.

ප්‍රශ්නය: රූපයේ සමුදය හොයාගන්නේ කොහොමද?

පිළිතුර: රූපය (**ඉති රූපං**) විතරක් නෙවෙයි, රූපයේ සමුදයත් දන්න-දකින කෙනෙක් වෙන්න උත්සාහ කරන්න. සතර සතිපට්ඨානයේ අනුපස්සනා හතරේම **සමුදය ධම්මානුපස්සී** වීමෙනුයි භාවනාව පටන්ගන්න තියෙන්නේ. එතකොට **සමුදය ධම්මානුපස්සී** වුණොත් විතරයි දහමට අනුව සතරසතිපට්ඨානය වඩන්න පටන්ගත්තා වෙන්නේ. ඒක හොඳට තේරුම් ගන්න. අපට කැමති කැමති ඒවා කළාට සතරසතිපට්ඨානය වැඩෙන්නේ නැහැ. ඒ නිසා තමයි ප්‍රවේශමෙන් සූත්‍ර කියවලා තේරුම්ගන්න වෙන්නේ. සතිපට්ඨාන සූත්‍රය කියෙව්වොත්, **සමුදය ධම්මානුපස්සී වා කායස්මිං විහරති** කියන තැනින් තමයි සතිපට්ඨාන භාවනාව[34] පටන්ගන්නේ කියන බව වැටහෙයි. කායානුපස්සනාව තමයි රූපය පිරිසිඳ දකින්න තියෙන ක්‍රමය. පූර්ව ප්‍රතිපදවේ මූලික භාවනාවෙන් කරන්නේ රූපය මොකක්ද කියලා ලෝකයට අයිති විදියට හඳුනා ගැනීමක් විතරයි. එහෙම හඳුනාගත්තාට පස්සේ තමයි ආර්ය ප්‍රතිපදව පටන්ගන්නේ.

සමුදය දැක්කොත් රූපයේ පටිච්චසමුප්පන්න බව දකින්න පුළුවන් වෙනවා. 'මෙය ඇති කල්හි මෙය වෙයි, මෙය නැත්නම් ඔහොම වෙන්න බැහැ' - **ඉමස්මිං සති ඉදං හොති, ඉමස්මිං අසති ඉදං න**

[34] විභඞ්ග සූත්‍රය - සංයුත්තනිකාය, මහාවග්ගය, සතිපට්ඨාන සංයුත්තය, අනනුස්සුත වග්ගය.

හොති කියන ධර්මතාවය. ඒ නිසා සමුදය හොයාගන්න එක හරිම වැදගත් වෙනවා. සමුදය දැක්කොත් විතරයි පටිච්චසමුප්පන්න බව තේරුම්ගන්න පුළුවන් වෙන්නේ. අපි ඵලයේ ලක්ෂණ ගැන කොච්චර බැලුවත්, සමුදය හොයාගත්තේ නැත්නම් එතන හේතු-ඵල සම්බන්ධයක් පෙනෙන්නේ නැහැ. හේතු-ඵල අතර සම්බන්ධය තමයි මේ පටිච්චසමුප්පන්න ස්වභාවයේ තියෙන්නේ. ඒක තේරුම් ගන්න නම් සමුදය හොයාගන්නම වෙනවා. ඒ නිසා තමයි සතරසතිපට්ඨානයට එකම මාර්ගය කියන්නේ.

දැන් අපි රූපය කියලා කොහෙන් විමසුවත් මේ <u>අජ්ඣත්ත බහිද්ධ දෙකට තමයි අන්තිමට එන්නේ</u>. මොකද - අපි ආයතන වලින් තමයි රූප ගැන දැනගන්නේ. අජ්ඣත්ත බහිද්ධ දෙක ගැනයි ආයතන වලින් දැනගන්නේ.

ප්‍රශ්නය: එතකොට ආයතන වලින් පිට ඉඳලා ද මේක දකින්න වෙන්නේ?

පිළිතුර: ඔව්. ආයතන තුළ ඉඳලා තමයි අපි මෙච්චරකල් දැකලා තියෙන්නේ. මේ ආයතන ඉක්මවා යන මාර්ගයක් තමයි බුදුරජාණන් වහන්සේ දේශනා කරන්නේ. ඇයි එහෙම කියන්නේ? ආයතන භයම අපව රවට්ටන නිසා. ආයතන කියන්නේ ලෝකය, මාරයා, දුක, සත්ත්වයා බවයි මේ සූත්‍ර හතරෙන්ම පෙන්වන්නේ.

ප්‍රශ්නය: සත්ත්වයෙක් පුද්ගලයෙක් නැහැ කියලා බලන්න කියන ක්‍රමයකුත් තියෙනවා නේද?

පිළිතුර: එහෙම ක්‍රම තියෙනවා. රූපය තියෙනවා, ඕක 'මම නෙවෙයි, මගේ නෙවෙයි, මගේ ආත්මය නෙවෙයි' කියලා බලන්න කියන ක්‍රම තියෙනවා. ශරීරය තියෙනවා ඕක 'මම නෙවෙයි' කියන්න හදනවා. ඒ ක්‍රමය දහමත් එක්ක ගළපලා බලන්න වෙනවා. මේ සූත්‍ර හතරේම පෙන්වනවා රූපය ඇති කල්හි (**අත්ථි රූපා**) මාරයා ඉන්නවා, ලෝකය තියෙනවා, සත්ත්වයා ඉන්නවා, දුක තියෙනවා කියලා. නමුත් අපි කියන්න හදනවා 'මම නැති රූපයක්' තියෙනවා කියලා. ඔය කියමන බුද්ධ දේශනාවට ගැළපෙනවා ද කියලා තමන්ම නුවණින් විමසන්න. එහෙම බලන්න ද කියන්නේ, නැත්නම් රූපයේ

පටිච්චසමුප්පන්න බව දකින්න කියලා ද බුදුරජාණන් වහන්සේ දේශනා කරලා තියෙන්නේ කියලා අපට නුවණින් විමසන්න වෙනවා. පටිච්චසමුප්පාදය දැක්කොත් තමයි දහම දැක්කා වෙන්නේ. රූපයේ 'මම නැහැ' කියලා දැකීම නෙවෙයි.

ප්‍රශ්නය: පටිච්චසමුප්පාදය දැක්කාට පස්සේ රූපයේ 'මම නැහැ' කියලා අවබෝධ වෙනවා නේද?

පිළිතුර: ඒක වෙනම අවබෝධයක්. රූපයේ 'මම' නැහැ කියන එක නෙවෙයි, මම ඉන්නවා හෝ නැහැ කියන්න රූපයක් පිහිටන්නේ නැති වෙනවා. මේ පටිච්චසමුප්පන්න බව තේරුම් ගත්තට පස්සේ 'මම' ගැන කතාවට එන්න පුළුවන්. සමුදය හොයාගන්න කොට ඊළඟට මොකක්ද වෙන්නේ කියලා තමන්ට තේරෙයි. සමුදය සොයාගැනීමයි දැන් අපි කළ යුත්තේ.

ශබ්ද රූපයේ සමුදය ගැන නැවතත් කතා කළොත් - මොනවා හරි ගැටුණ නිසා ශබ්දය ආවා කියලා මුලින්ම අපි ලෝකයට අයිති විදියට සමුදය හොයාගත්තා. දැන් ඒ සමුදය තියෙන්නේ තමන් තුළ ද, බාහිර ද කියලා විමසලා බැලුවොත් පෙනෙනවා ඒ ගැටුණ දේවල් තිබුණේ බාහිරයේ බව. එහෙනම් අපට ලෝකයයි, සමුදයයි අහුවෙලා තියෙන්නේ බාහිරයෙන්. එතකොට ඒක බුදුදහමට ගැළපෙන්නේ නැහැ නේද? එහෙම හොයලා ඇත්ත හොයාගන්න බැහැ. ඇත්ත හොයාගන්න නම් තමන් තුළින් ලෝකයයි, සමුදයයි හොයාගන්න වෙනවා. සමුදය තමන් තුළින් සොයාගැනීමටයි විදර්ශනාව කියන්නේ.

දැන් කනට ඇහෙන ඕනෑම ශබ්දයක් ගත්තොත් - ශබ්දයක් ඇහෙන කොට එළියේ මොනවා හරි ගැටිලා ශබ්දය ඇහුණා කියලා තමයි අපට හිතෙන්නේ. ඒ ලෝකයා හිතන හැටි. දැන් අපි ඊට එහා මට්ටමකින් විමසන්න ඕන. ශබ්දයෙත් සමුදය හොයාගන්න ඕන, කනෙත් සමුදය හොයාගන්න ඕන. ඒ දෙකම රූප - **ඉති රූපං** කියන තැන. එතකොට අජ්ඣත්ත රූපයෙත් කායානුපස්සී වෙන්න ඕන, බහිද්ධ රූපයෙත් කායානුපස්සී වෙන්න ඕන. සමුදය ධම්මානුපස්සී වෙනවා කියන එකටයි කායානුපස්සී වෙනවා

කියන්නේ. ඒ **ඉති රූපස්ස සමුදයො** කියන තැන. කනයි, ශබ්දයයි හටගත්තේ කොහොමද කියලා හොයාගන්න වෙනවා. නමුත් ඒක බාහිරයෙන් හොයලා බැරි බවත් අපි තේරුම් ගන්න ඕන.

එහෙනම් අපට ආයතන පැත්තෙන් විමසන්න වෙනවා. ශබ්දය තියෙනවා කියලා දැනගත්තේ කොහොමද, මොන ආයතන වලින් ද කියලා විමසන්න වෙනවා. කන ඇහුණේ නැත්නම් අපට ශබ්දයක් තියෙනවා කියන සිද්ධිය යෙදෙන්නේ නැහැ. එතන දී සෝතායතනය වැඩකරන්නේ නැහැ. ඇහුණ නිසා තමයි ශබ්දයක් තියෙනවා කියලා අපි දැනගත්තේ. මේ මොහොතේ තමන්ගේ කන තියෙනවා කියලා දැනගත්තේ කොහොම ද? ශබ්ද ඇහෙන නිසා තමයි කන තියෙනවා කියලා කියන්නේ. දැන් කන තියෙනවා ද කියලා බලන්න කිව්වොත් අපි හොඳට කන් යොමාගෙන ඉන්නවා ඇහෙනවා ද කියලා. ඇහෙනවා නම් කන තියෙනවා කියනවා. ඇහෙන්නේ නැත්නම් කන ඉපදිලා නැහැ. එහෙම නැතුව අපට කන පෙනිලා නෙවෙයි කනක් තියෙනවා කියලා දැනගත්තේ. මේ මොහොතේ තමන්ගේ කන ඇහැට පෙනෙන්නේ නැහැ. එහෙනම් ඇහෙන නිසායි අපි කන තියෙනවා කියලා දැනගත්තේ. ශබ්ද තියෙනවා කියලා දැනගන්නෙත් ඇහෙන නිසා.

ඊළඟට හොඳට නුවණින් විමසලා බලන්න ඇහෙනවා කියන්නේ කන ද, ඇහෙනවා කියන්නේ ශබ්දය ද? ඇසීම කියන්නේ ක්‍රියාවක් නේද? ඇසීම කියන්නේ රූපයක් නෙවෙයි නේ. එතකොට ඇසීම කියන්නේ කන වෙන්නත් බැහැ, ශබ්දය වෙන්නත් බැහැ. හැබැයි ඇසීම නිසායි අපි කන සහ ශබ්දයක් ගැන දැනගත්තේ. **ඉති රූපං** කියන්නේ කනයි, ශබ්දයයි. ඒ දෙක තමයි රූපස්කන්ධය. දැන් අපි මේ හොයන්න හදන්නේ ඒ රූපවල සමුදය - මේවා හටගත්තේ කොහොමද කියලා.

ප්‍රශ්නය: තිණ්ණං සඞ්ගති ඵස්සො වෙලා නේද?

පිළිතුර: ජාති තුනක් - කනයි, ශබ්දයයි, සෝත විඤ්ඤාණයයි තියෙනවා කියන එකටයි **තිණ්ණං සඞ්ගති ඵස්සො** කියන්නේ. ඒ සිද්ධියට තමයි ඵස්සය කියන්නේ. ඵස්සය තිබුණොත් වේදනාව,

සංඥව තියෙනවා. ඊළඟට ප්‍රපංච දක්වාම යනවා. මධුපිණ්ඩික සූත්‍රයේ[35] තියෙනවා **චක්ඛුඤ්චාවුසෝ පටිච්ච රූපෙ ච උප්පජ්ජති චක්ඛුවිඤ්ඤාණං තිණ්ණං සඞ්ගති ඵස්සෝ. ඵස්සපච්චයා වෙදනා. යං වෙදෙති, තං සඤ්ජානාති. යං සඤ්ජානාති තං විතක්කෙති. යං විතක්කෙති තං පපඤ්චෙති. තතොනිදානං පුරිසං පපඤ්චසඤ්ඤාසඞ්ඛා සමුදාචරන්ති අතීතානාගතපච්චුප්පන්නෙසු චක්ඛුවිඤ්ඤෙයෙසු රූපෙසු.** චක්ඛුවිඤ්ඤාණයෙන් දැනගන්න අතීත, අනාගත, වර්තමාන රූප කියන ප්‍රපංච සංඥ ටිකක් එනවා. ඒකට නිදනය තමයි මුල ඉඳන් කියන්නේ. මේවා හටගන්න හැටි. ඔය සාමාන්‍ය ලෝකයාට වෙන සිද්ධිය. ඇහැයි, රූපයි නිසා චක්ඛු විඤ්ඤාණය හටගන්නවා. ඔය තුනට ඵස්සය කියනවා. ඵස්සය නිසා වේදනාව. යමක් විඳියි ද, එය හඳුනගන්නවා. ඒ හඳුනගන්න දෙය ගැන කල්පනා කරනවා. ඒ කල්පනා කිරීම ප්‍රපංච. ඒ ප්‍රපංච ටික විස්තර කරනවා අතීත, අනාගත, වර්තමාන චක්ඛුවිඤ්ඤාණයෙන් දැනගන්න රූප කියලා. ආයතන හයටම ඔය විදියට කියනවා.

ඔය පෙන්නුවේ මධුපිණ්ඩික සූත්‍රයේ එක කොටසක් විතරයි. සාමාන්‍යයෙන් අපි ඔය ටික විතරයි බලන්නේ. නමුත් ඊළඟ කොටස නුවණින් විමසුවොත් එතන කියනවා **සෝ වතාවුසෝ චක්ඛුස්මිං සති රූපෙ සති චක්ඛුවිඤ්ඤාණෙ සති ඵස්සපඤ්ඤත්තිං පඤ්ඤාපෙස්සතීති ඨානමෙතං විජ්ජති.** (**සති** කියන්නේ මේවා ඇති කල්හි කියන අදහස) ඇස ඇති කල්හි, රූප ඇති කල්හි, චක්ඛුවිඤ්ඤාණය ඇති කල්හි, ඵස්සය කියලා ප්‍රඥප්තියක් පනවාගන්නවා කියන සිද්ධියක් විද්‍යමාන වෙනවා. **ඵස්සපඤ්ඤත්තියා සති වෙදනාපඤ්ඤත්තිං පඤ්ඤාපෙස්සතීති ඨානමෙතං විජ්ජති.** ඵස්සපඤ්ඤත්තිය තියෙන කොට වේදනා ප්‍රඥප්තියක් පනවාගන්නවා කියන සිද්ධියකුත් විද්‍යමාන වෙනවා. ඔය විදියට ප්‍රපංච දක්වා යනවා. අන්තිමට තියෙන්නේ **පපඤ්චසඤ්ඤාසඞ්ඛා සමුදාචරණපඤ්ඤත්තිං පඤ්ඤාපෙස්සතීති ඨානමෙතං විජ්ජති.**

[35] මධුපිණ්ඩික සූත්‍රය - මජ්ඣිම නිකාය, මූලපණ්ණාසකය, සීහනාදවග්ගය.

දැන් මෙතන කියන්නේ මොකක් ද? ඇස ඇති කල්හි, රූප ඇති කල්හි, චක්ඛුවිඤ්ඤාණය ඇති කල්හි මෙහෙම සිද්ධියක් වෙනවා. පඤ්ඤප්ති ගොඩක් පනවාගන්නවා. ප්‍රපංච දක්වා පනවාගන්න සිද්ධිය විද්‍යමාන වෙනවා. අනිත් ආයතන වලටත් ඔය ආකාරයටම කියනවා.

ඊළඟට කියනවා **චක්ඛුස්මිං අසති රූපෙ අසති චක්ඛුවිඤ්ඤාණෙ අසති එස්සපඤ්ඤත්තිං පඤ්ඤපෙස්සතීති නෙතං ඨානං විජ්ජති. නෙතං** කියන්නේ දකින්න බැහැ. ඇස නැත්නම්, රූප නැත්නම්, චක්ඛුවිඤ්ඤාණය නැත්නම්, එස්සපඤ්ඤප්තියක් පනවනවා කියන එකක් විද්‍යමාන වෙන්නේ නැහැ.

එතකොට මොකක්ද මෙතන කියන්නේ? ඒ තුන ඇති කල්හි පනවාගන්නවා, ඒ තුන නැත්නම් පැනවෙන්නේ නැහැ. මේ කියන්නේ පටිච්චසමුප්පන්න ස්වභාවය නේද? **ඉමස්මිං සති ඉදං හොති, ඉමස්මිං අසති ඉදං න හොති** කියන ධර්මතාවය.

දැන් අපි හිතන්න ඔන කොයි වෙලාවේ ද ඔවා නැත්තේ කියලා. මේ විස්තර කරන්නේ මොන වෙලාව ද?

ප්‍රශ්නය: ඇස ක්‍රියාත්මක නොවන අවස්ථාව ද?

පිළිතුර: ඇස ක්‍රියාත්මක නොවන අවස්ථාව කියන්නේ වෙන ආයතනයක් ක්‍රියාත්මක වෙන අවස්ථාවක් නේ. එහෙම දෙයක් නම්, දැන් ඊළඟට මේක ඉතිරි ආයතන වලටත් කියනවා. **සති** කියලා 'මේවා ඇති කල්හි' කියලා පෙන්වන්නේ සාමාන්‍යයෙන් ලෝකයේ යන කෙනාගේ තත්ත්වය. ඊළඟට පෙන්වන්නේ සමුදය. ඇස ඇති කල්හි, රූප ඇති කල්හි, චක්ඛුවිඤ්ඤාණය ඇති කල්හි මෙහෙම වෙනවා කියනවා. ඒකෙත් කියන්නේ පඤ්ඤප්තියක් පනවා ගන්නවා කියන එකක් විද්‍යමාන වෙනවා කියලායි. ඊළඟට **අසති** කියන්නේ සමුදය නොයෙදෙන වෙලාව. මෙතන දී සමුදය වෙන්නේ ඇසයි, රූපයි, චක්ඛුවිඤ්ඤාණයයි. ඒවා නොයෙදුණොත් ඔය සිද්ධිය වෙන්නේ නැහැ.

ප්‍රශ්නය: එහෙම නොයෙදෙන වෙලාවක් තියෙනවා ද?

පිළිතුර: ඒ කොයි වෙලාව ද කියන එක තමයි අපට නුවණින් හොයාගන්න වෙන්නේ. ඇහෙන් දැකීම ගැනයි බුදුරජාණන් වහන්සේ මේ දේශනා කරන්නේ. දකින වෙලාව ඔය විස්තර කරන්නේ. ඒ දකින වෙලාව දෙවිදියකට වෙන්න පුළුවන්. එකක් තමයි ප්‍රපංච දක්වා යන සිද්ධිය. අනෙක් එක තමයි එහෙම නොවෙන සිද්ධිය. සමුදය තියෙන කොට මොකක් ද වෙන්නේ, සමුදය යෙදුණේ නැත්නම් මොකද වෙන්නේ කියන අවස්ථා දෙක.

ඇහෙන් දැකීම තුළ අවස්ථා දෙකක් ඔය පෙන්වන්නේ. අජ්ඣත්ත ආයතන, බහිද්ධ ආයතන වලට හේතු විමසුවොත් ඒ අවස්ථා දෙක තේරුම් ගන්න පුළුවන්. මොනවා නිසා ද අජ්ඣත්ත, බහිද්ධ ආයතන හටගන්නේ? අවිද්‍යා, කර්ම, තණ්හා, ආහාර, නිබ්බත්ති ලක්ෂණ නොදැනීම [36] කියන කරුණු අහලා ඇති නේ. මේවා තිබුණොත් තමයි ආයතන උපදින්නේ. අජ්ඣත්ත, බහිද්ධ ආයතන වලට ඔය කරුණු හේතු වෙනවා.

එතකොට අජ්ඣත්ත, බහිද්ධ ආයතන තියෙන්නේ අවිද්‍යාව ඇති කල්හි, අවිද්‍යාව ප්‍රත්‍යවෙලා කියන ධර්මතාවය අපට පෙනෙනවා. අවිද්‍යාව ප්‍රත්‍ය නොවුණොත් අජ්ඣත්ත, බහිද්ධ ආයතන තියෙන්න බැහැ කියලා දැන් පෙනෙනවා ද? දැන් **සති, අසති** කියන්නේ මොකක් ද කියලා තේරෙනවා ද? අජ්ඣත්ත, බහිද්ධ ආයතන ඇති කල්හි සහ නැති කල්හි කියන අවස්ථා දෙක. ඔය දෙකෙන්ම විස්තර වෙන්නේ 'දැකීම' කියන සිද්ධිය. අවිද්‍යාව තියෙන කෙනාට දැකීමේ සිද්ධියේ දී මොකද වෙන්නේ, අවිද්‍යාව නැත්නම් මොකද වෙන්නේ කියන තැන. මේ කාරණා ගැන හොඳට නුවණින් බැලුවොත් පෙනෙයි මේ ඡේද වලින් කියන්නේ සමුදය යෙදුණොත් මොකක් ද තත්ත්‍වය, සමුදය යෙදුණේ නැත්නම් මොකක් ද තත්ත්‍වය කියන තැන. මේක ටිකක් හිතාගන්න අමාරුයි, ඒ වුණාට හොඳට නුවණින් විමසුවොත්, ඔය ධර්මතාවයන් තමයි මේ විස්තර වෙන්නේ.

සති කියලා එක පැත්තක් කියනවා, **අසති** කියලා තව පැත්තක් කියනවා. එතකොට අපි තව පැත්තකින් අහලා තියෙනවා **සති**

[36] බුද්දකනිකාය-පටිසම්භිදාමග්ගපාළි-මහාවග්ගො-ඤානකථා 15. චතුනානත්තඤාණනිද්දෙසො 16. ගොචරනානත්තඤාණනිද්දෙසො

කියන කොට අවිද්‍යාව තිබුණොත් තමයි අජ්ඣත්ත, බහිද්ධ ආයතන තියෙන්නේ. අවිද්‍යාව ප්‍රත්‍ය වුණේ නැත්නම් අජ්ඣත්ත, බහිද්ධ ආයතන හටගන්න බැරි බව. ඕකට තමයි පටිච්චසමුප්පන්න බව කියලා කියන්නේ. එතකොට තේරුම් ගන්න ඕන ඇහැත් පටිච්චසමුප්පන්නයි, රූපයත් පටිච්චසමුප්පන්නයි. ආයතන හයටම එහෙම යෙදෙනවා. මොකක් ද **පටිච්චසමුප්පන්න බව** කියලා කියන්නේ? **සමුදය ඇති කල්හි ඵලය** තියෙනවා. සමුදය මොකක් ද? **අවිද්‍යාව**. අවිද්‍යාව තිබුණොත් මේවා තියෙනවා. අවිද්‍යාව නැත්නම් උපදින්න බැහැ. ඒක තමයි පටිච්චසමුප්පන්න බව කියන්නේ. 'මෙය ඇති කල්හි මෙය වෙයි, මෙය නැත්නම් ඔහොම වෙන්න බැහැ' කියන ධර්මතාවය. ඒ අපි ඉන්න මට්ටම නෙවෙයි, ඒ අවිද්‍යාව දුරු කළ මනසක් තියෙන රහතන් වහන්සේගේ ස්වභාවයයි.

ප්‍රශ්නය: සති අසති කියන එක බල්ලාගේ උදාහරණය කිව්වා වගේ ප්‍රායෝගික උදාහරණයකින් පැහැදිලි කරන්න.

පිළිතුර: අවිද්‍යාව තියෙන කොට ගොඩ ඉන්න බල්ලාට වතුරේ බල්ලෙක් ඉන්නවා. අපේ ඒ අවිද්‍යාව නැති හින්දා වතුරේ බල්ලෙක් උපදින්නේ නැහැ. බල්ලෙක් නැහැ නෙවෙයි, උපදින්නේ නැහැ - නිරෝධයි. ඒක තමයි ඇත්ත තත්ත්‍වය. බල්ලා උගේ මෝඩකමට වතුරේ බල්ලෙක් උපද්දවාගෙන. අපේ මෝඩකමට අපි ඇහැයි, රූපයයි අවිද්‍යා ප්‍රත්‍යයෙන් උපද්දවාගෙන. ඇත්ත ස්වභාවය නිරෝධයි. මෝඩකම තියෙනකම් අපි ඕවා උපද්දනවා. එතකොට මෝඩකමට උපද්දන ටික තිබුණොත් අර සම්බුද්ධ සූත්‍රවල කියනවා වගේ මාරයා ඉන්නවා, ලෝකය තියෙනවා, දුක තියෙනවා, සත්ත්‍වයා ඉන්නවා. මෝඩකම ප්‍රත්‍ය වුණේ නැත්නම් ඒවා උපදින්නේ නැහැ - **නත්ථි** ස්වභාවය. ඒ තමයි නිරෝධය කියන ධර්මතාවය.

තව විදියකට කිව්වොත් මේ පෙන්වන්නේ දුකයි, සමුදයයි, නිරෝධයයි. මෝඩකම, අවිද්‍යාව තමයි සමුදය. මෝඩකම යෙදුණේ නැත්නම් නිරෝධය. නිරෝධය කියන්නේ නැතිවෙනවා කියන අර්ථයෙන් නෙවෙයි, උපදින්නේ නැහැ. උපද්දන්නේ නැහැ. හදන්නේ නැහැ. දුකයි, සමුදයයි, නිරෝධයයි දැක්කොත් මාර්ගයත්

දකිනවා. එහෙනම් මාර්ගය වෙන්න ඕන මේ මෝඩකම නැතිකරන ක්‍රමයක් නේද? මෝඩකමට උපද්දන ස්වභාවය නැතිවෙන්න ඕන.

දැන් ඔතන චතුරාර්‍ය්‍ය සත්‍යය සහ පටිච්චසමුප්පන්න බව කියන දෙකම තියෙනවා. මේ සියලුම ආයතන පටිච්චසමුප්පන්න බව අපි දකින්න ඕන. පටිච්චසමුප්පාදය දැක්කොත් තමයි දහම දැක්කා වෙන්නේ. අවිද්‍යාව ප්‍රත්‍ය බව තමයි බුද්ධ දේශනාව. අවිද්‍යාව කියලා අපි මොකක්ද හොයාගන්න ඕන. ඕක හොයාගන්න බුදුරජාණන් වහන්සේ දීපු වැඩ පිළිවෙල තමයි **සමුදය ධම්මානුපස්සී** වෙන එක. ඒ නිසා තමයි මේක කරන්න පුළුවන් දන්න-දකින කෙනාට කියලා කියන්නේ. සමුදය අවිද්‍යාව කියලා අපි දැනගන්න ඕන. තවම දැකලා නෙවෙයි, නමුත් බුද්ධ දේශනාවෙන් ඒ බව අපි දැනගන්න ඕන. එතකොට දන්න කෙනෙක් වෙනවා. ඒක තමන්ගේ දුක්ම කරගන්න සමුදය හොයාගන්න ඕන. ඇයි මේ අවිද්‍යා ප්‍රත්‍යයෙන් කියන්නේ කියන තැන හම්බවෙනකම් අපි සමුදය හොයාගෙන යන්න ඕන.

දැන් මේ ටික නැවතත් හොඳට නුවණින් විමසලා බලන්න. අපි කනයි, ශබ්දයයි තියෙනවා කියලා දැනගත්තේ කොහොම ද? ඇහෙන නිසායි. කන දැකලා නෙවෙයි. නමුත් අපි කියනවා ඇහෙන්න නම් කනක් තියෙන්න ඕන කියලා. අනිත් පැත්තට කියනවා ඇහෙන්න නම් ශබ්දයක් තියෙන්න ඕන කියලා. හොඳට විමසුවොත් පෙනෙයි ඒ දෙකම ඇසීම නෙවෙයි කියලා. ඒ දෙකම ඇසීම ගැන හිතන්න ගිහිල්ලා අපි පනවාගත්ත දේවල්. දැන් කනක් ගැන අහලාම නැති පොඩි දරුවෙකුටත් ශබ්ද ඇහෙනවා. නමුත් එයාට හිතෙන්නේ නැහැ මේ කන තියෙන හින්දා ඇහෙනවා කියලා. එහෙනම් ඇයි අපට එහෙම හිතුණේ? මේ වගේ දේවල් තමයි නුවණින් විමසන්න ඕන. පෙර ඇසුරක් ඔතෙන්ට අපි සම්බන්ධ කරලා තියෙනවා. ආශ්‍රව වලින් තමයි කන කියන දෙය හදන්නේ.

ප්‍රශ්නය: අපි වෙන වැඩක යෙදිලා ඉන්නකොට ඇහෙන්නේ නැහැ නේ. එවැනි අවස්ථාවක මොකද වෙන්නේ?

පිළිතුර: ඇහෙන්නේ නැති එක වෙනම කතාවක්. දැන් අපි මේ කතාකරන්නේ ඇහෙන වෙලාව ගැනයි. ඇසීම සිද්ධවෙන වෙලාව

ගැන. ඇහෙන්නේ නැති වෙලාවේ දී ශබ්දයක් තිබුණා කියලා අපි දන්නේ නැහැ. නමුත් ශබ්දයක් තියෙන බව, කන තියෙන බව දැනගත්ත වෙලාවේ දි මොකද වුණේ? කොහොමද ඒ බව දැනගත්තේ කියන එකයි මේ හොයන්නේ. සමුදය ගැනයි මේ විමසන්නේ.

ඇසීම ඇසීම බව නොදන්නාකම තමයි සමුදය. ඇසීම ඇසීමක් විතරයි කියලා නොදන්නාකමටයි ශබ්දයක් සහ කනක් පැනෙව්වේ. <u>ඇසීමට ඔය දෙකම අයිති නැහැ. ඔන්න ඔතන තමයි ගැඹුර තියෙන්නේ</u>. ඒ දෙකම අපි හිතාගත්ත දේවල් විතරයි. ඇසීම ඇසීමක් පමණක් වුණා නම් කනක් පනවන්නත් බැහැ, ශබ්දයක් පනවන්නත් බැහැ. කනයි, ශබ්දයයි කියන්නේ ඇසීම නෙවෙයි, ඒවා රූප.

එතකොට දැකීම දැකීම පමණක් වුණා නම් ඇහැක් පනවන්නත් බැහැ, රූප පනවන්නත් බැහැ. ඒ දෙපැත්ත එකතු කළා නම් එකතු කරලා තියෙන්නේ අවිද්‍යාවෙන්. ඇසීම ඇසීම බවට සිහිය නුවණ නැතිකම නිසා. දැකීම දැකීම බවට සිහිය නුවණ නැතිකමටයි අජ්ඣත්ත, බහිද්ධ දෙකක් පනවන්නේ. මේ එකතු කළේ කවුද? ඒ තමයි විඤ්ඤාණය. මාරයා. මායාකාරයා.

ප්‍රශ්නය: පෙර විඤ්ඤාණය නේද?

පිළිතුර: පෙර නෙවෙයි මේ මොහොතේ.

ප්‍රශ්නය: මේ මොහොතේ හැදෙන්නෙත් පෙර එකකට හේතුවක් වශයෙන් නේද?

පිළිතුර: ඒක පූර්ව ප්‍රතිපදාවත් එක්ක කෙරෙන විස්තර කිරීමක්. කම්මස්සකතා සම්මාදිට්ඨියත් එක්ක කරන විස්තර කිරීමක්. මේක මේ මොහොතේ සිද්ධියක් - පච්චුප්පන්න. **පච්චුප්පන්න යො ධම්මං තත්‍ර තත්‍ර විපස්සති - භද්දෙකරත්ත සූත්‍ර**[37] දේශනාවේ තියෙන්නේ පච්චුප්පන්න ධර්මතාවය එතන එතන විදර්ශනා කරන්න කියලා. **සමුදය ධම්මානුපස්සී** වීමටයි විදර්ශනා කරනවා කියලා කියන්නේ.

[37] භද්දෙකරත්ත සූත්‍රය - මජ්ඣිමනිකාය, උපරිපණ්ණාසකය, විභඞ්ගවග්ගය.

සමුදය නිවැරදිව දැක්කොත් කනයි, ශබ්දය කියන දෙකම පැනෙව්වේ අවිද්‍යාව ප්‍රත්‍යයෙන් කියලා පෙනෙයි. අපට ඔහොම පැනවුණාට අවිද්‍යාව නැති මනසට පැනවෙන්නේ නැහැ නේද? කියන නුවණත් එතනම යෙදෙනවා. දැන් බල්ලා වතුරේ බල්ලෝ හැදුවාට අපි හදන්නේ නැහැ නේ. ඒ වගේම අපි මෝඩකමට පනවන ටික අවිද්‍යාව දුරුවුණ මනසට පැනවෙන්න බැහැ. නිරෝධයි. නිරෝධ ධර්මය අපේ මෝඩකමට අපි උපද්දවාගෙන තියෙනවා. ඔය අවස්ථාව ගැන ටිකක් හිතන්න. නුවණින් පරීක්ෂණය කරන්න.

ඔය බැලුවේ **ඉති රූපං, ඉති රූපස්ස සමුදයෝ** කියන අවස්ථාව. අත්ථඞ්ගමය සාක්ෂාත් වෙන දෙයක්. ඒකට තමයි නිරෝධය කියන්නේ. සමුදය දැක්කොත් නුවණට පෙනෙන එකක් තමයි හට නොගන්න හැටි. හට නොගන්න හැටි උදාහරණ වලින් කියන්න අමාරුයි. අපි උදාහරණ දෙන්නේ ලෝකය තුළින් නේ. නිරෝධයේ දි ලෝකය හටගන්නේ නැහැ. ඒ මොන වගේද කියන එකට දෙන්න පුළුවන් එක උදාහරණක් තමයි අර බල්ලාගේ උපමාව. ඒකේ දී අපිව උදාහරණයට ගත්තොත් - දැන් බල්ලා රැවටිලා ඉන්න තාක් ඌට ඕක තේරෙන්නේ නැහැ. උගේ ලෝකයට බල්ලෙක් ඉන්නවාමයි. ඒ වගේ අවිද්‍යාව තියෙනකම් අපිත් ලෝකයක්ම පනවා ගන්නවා.

ප්‍රශ්නය: අවිද්‍යාව නැතිවුණොත් තත්ත්වය මොකක් ද?

පිළිතුර: දිට්ඨ, සුත, මුත, විඤ්ඤාත වලින් නවතිනවා. ඒවාට අපි අවිද්‍යාවෙන් එකතු කරන කිසිවක් එකතුවෙන්නේ නැහැ. මේ සියල්ලම නිරෝධ ධර්ම බව නුවණට පෙනෙනවා.

ප්‍රශ්නය: හැමතිස්සේම දුක්කායින් පස්සේ නේද අපි හිතන්නේ?

පිළිතුර: ඒක හරි. දැන් මේ ධර්මතාවය දැනගත්තා කියන්නේ රහත්වුණා නෙවෙයි. අපි තවම මේ කරන්න තියෙන වැඩපිළිවෙල හඳුනගන්නවා විතරයි. දන්න-දකින කෙනෙක් වෙන්න කියලා දේශනා කරලා තියෙනවා නේ. **ඤානං-පස්සං යථාභූතං** වුණාට පස්සේ තමයි කළ යුතු වැඩපිළිවෙල පටන්ගන්න පුළුවන් වෙන්නේ. ඔය දැනගන්න එක තමයි සම්මාදිට්ඨිය. සම්මාදිට්ඨිය ආවොත් තමයි මාර්ගය වඩන්න පටන්ගන්න පුළුවන් වෙන්නේ.

ප්‍රශ්නය: අජ්ඣත්ත රූපයේ සමුදය තව ටිකක් පැහැදිලි කරන්න.

පිළිතුර: අපි ඉස්සෙල්ලා ශබ්දයට හේතු හෙව්වේ බාහිරයෙන් නේ, යම් යම් දේවල් ගැටිලා ශබ්දය හටගත්තා කියලා. දැන් කොහෙද සමුදය තියෙන්නේ? මෝඩකම මත. අවිද්‍යාව මත. එතකොට අවිද්‍යාව තියෙන්නේ එළියේ ද, තමන් තුළ ද? තමන් තුළයි. අවිද්‍යාව තමන් තුළ නම් අවිද්‍යාවෙන් හදපු ටික තියෙන්නේ එළියේ ද, තමන් තුළ ද? ඒකත් තමන් තුළයි. එතකොට ලෝකයයි, සමුදයයි, නිරෝධයයි, මාර්ගයයි තියෙන්නේ තමන් තුළයි. දැන් මේ කරුණු දහමටත් ගැළපෙනවා නේද?

ප්‍රශ්නය: එතකොට සමුදය වෙන්නේම අවිද්‍යාව නේද?

පිළිතුර: ඒක තමයි මුළු බුදු දහම ම. අවිද්‍යාව දුරු කරනකම් තමයි මාර්ගය තියෙන්නේ.

ප්‍රශ්නය: අපට හැමතිස්සේම සමුදය වෙනවා නේ. එකින් එක අරගෙන විදර්ශනාවට ගන්න අමාරුයි, එච්චරටම සිතුවිලි එනවා නේ. එතකොට මොකක් ද කරන්නේ?

පිළිතුර: ඒක හොඳ ප්‍රශ්නයක්. හැම අරමුණකටම බලන්න යන්න එපා. එක සිද්ධියක් අරගෙන ඕන තරම් වෙලා අරගෙන විදර්ශනා කරන්න. සිද්ධවුණාට පස්සේ තමයි අපිට බලන්න වෙන්නේ. ඒකට කමක් නැහැ. ඔතන තමයි මාර්ගය පටන්ගන්න තැන. රූපයක් තිබුණොත් විතරයි කායානුපස්සනාව වඩන්න පුළුවන් වෙන්නේ. **ඉති රූපං** වුණොත් තමයි **ඉති රූපස්ස සමුදයො** වශයෙන් බලන්න පුළුවන් වෙන්නේ.

බල්ලාගේ උපමාව නැවතත් මතක් කරගන්න - බල්ලා රැවටෙනවා. අපි ඌට කියනවා ඔහොම දෙයක් නෙවෙයි තියෙන්නේ කියලා. අපට ඕන බල්ලාව කොහොම හරි මේ මුලාවෙන් මුදවන්න. එතකොට බල්ලා අපව ටිකක් හරි විශ්වාස කළොත් හිතයි, 'මට මෙහෙම හිතුනාට මේ කියන එක ඇත්තක් වෙන්න ඇති' කියලා. හැබැයි ඒ තවම ඇත්ත පෙනිලා නෙවෙයි. එතකොට අපි ඌට මුළාවෙන් මිදෙන වැඩපිළිවෙලක් කියලා දෙනවා. ඔන්න ඔහොම

බුදුරජාණන් වහන්සේත් අපට මගක් කියලා දෙනවා. 'ඔබ මෙහෙම රැවටීමක ඉන්නවා, මෙහෙම කළොත් ඔය මුළාවෙන් මිදෙන්න පුළුවන්' කියලා. ඒක තමයි බුදුරජාණන් වහන්සේ දේශනා කරන මාර්ගය - සතර සතිපට්ඨානය. සතර සතිපට්ඨානය පටන්ගන්න හැටි තමයි අපි දැන් මේ කතා කළේ. **සමුදය ධම්මානුපස්සී වා කායස්මිං විහරති** - කයක් තියෙනවා නම් ඒකේ සමුදය බලන්න. ඕක තමයි මාර්ගය.

දැන් මාර්ගය කියන්නේ තවම නිවන නෙවෙයි. මාර්ගය වඩන කොට තමයි අවිද්‍යාව දුරුවෙන්නේ. මාර්ගයේ එක එක අවස්ථා තමයි සෝවාන්, සකදාගාමී, අනාගාමී, අරිහත් කියලා කියන්නේ. මාර්ගය වඩන කොට තමයි දන්න දෙය දැක්මක් වෙන්නේ. දැන් තවම අහගත්තා විතරයි - **ඤාණං**. ඒක දැනුමක් විතරයි. ප්‍රායෝගිකව මේකේ යෙදෙන කොට මේ දැනුම තමන්ට ප්‍රත්‍යක්ෂ වෙනවා. මේක මෙහෙමමයි කියලා.

ප්‍රශ්නය: ප්‍රායෝගික වෙන්න භාවනා කරන්නම ඕනෙ ද?

පිළිතුර: මුලින්ම භාවනාව කියන්නේ මොකක්ද කියලා හඳුනගන්න එකයි මේ කරන්නේ. වාඩිවෙලා ඇස් පියාගෙන ඉන්න කතාවක් නෙවෙයි මේ කියන්නේ. මේක ශබ්දය ඇහෙන වෙලාවෙදි කරන්න ඕන දෙයක්. එතනදිත් එක ශබ්දයක් ගන්න. අපි මුලින්ම දැනගන්නේ ලෝකයට අයිති මට්ටමින්. ඊළඟට බුදුරජාණන් වහන්සේ දේශනා කරපු වැඩපිළිවෙල එතෙන්ට යොදන්න.

ශබ්දය කියන කොට අපි මුලින්ම එළියේ ශබ්දයක් ගැනයි දැනගන්නේ. එහෙම නැත්නම් ඒ ශබ්දය ඇහුණ කන ගැන දැනගන්නවා. කන තිබුණ නිසායි ඇහුණේ, ශබ්දය තිබුණ නිසායි ඇහුණේ කියලා. එතකොට කන කියන්නෙත් රූපයක්, ශබ්දය කියන්නෙත් රූපයක්. රූපය පිරිසිඳ දකින්න නම් කායානුපස්සනාව වඩන්න ඕන. කායානුපස්සනාවේ මුල්ම පියවර තමයි රූපයක් තියෙනවා නම් ඒකේ සමුදය හොයාගන්න එක. හටගත්තේ කොහොමද කියලා හොයාගන්න එක. එහෙම හොයන කොට අපි දන්න හේතු තමයි; එළියේ මොකක් හරි වුණ හින්ද ශබ්දය ආවා

කියලා. දැන් එතනින් එහාට විමසන්න ඕන. ඔය ශබ්දය තියෙනවා කියලා අපි දැනගත්තේ කොහොම ද? ඇහුණ නිසායි. ඇහුණේ නැත්නම් කොච්චර එළියේ මොනවා වුණත් අපි දන්නේ නැහැ. එතකොට අපේ ලෝකයට ඔය ශබ්දය ආවේ ඇහුණ නිසායි.

දැන් අපි මේ අවස්ථාවේ දී ආයතන හඳුන ගන්න ඕන. මොන ආයතන ද ඔතන වැඩ කළේ කියලා. එතකොට පෙනෙනවා කනයි, ඒ ගැන හිතපු මනසයි විතරයි ඔතන ක්‍රියාත්මක වුණේ කියලා. සෝතායතනයයි, මනායතනයයි වැඩ කළේ.

ආයතන ගැනත් අපි වෙනම දැනගෙන තියෙන්න ඕන. ආයතන හයේ කෘත්‍ය වෙනම දහම තුළින් විමසිය යුතුයි. සෝතායතනයට කරන්න පුළුවන් එකම එක වැඩයි - ඇසීම - **සුත**. චක්ඛායතනයට නම් **දිට්ඨ** - දැකීම විතරයි. එහෙනම් අපි දැන් ඇසීමෙන් නැවතිලා ද කියලා විමසලා බලන්න. ඇසීමට අමතරව අපි පුරුද්දට ශබ්දයකුයි, කනකුයි එකතු කරලා තියෙනවා. අපේ පරණ පුරුද්ද නිසායි ඒක වුණේ. වර්තමානයේ සිහිය, නුවණ නොයෙදුණු නිසා. එතකොට ඇසීම ඇසීම පමණක් බව නොදන්නාකමටයි අපි ශබ්දයකුයි, කනකුයි එතෙන්ට එකතු කරගෙන තියෙන්නේ. ඒවා අවිද්‍යාවෙන් එකතු කරගත්ත දේවල්. දැන් මේ ඇත්ත ටික ටික දකින්න පටන්ගන්න ඕන. එහෙම පෙන්නගෙන යනකොට වෙලාවක් එනවා තමන්ට ඇහෙයි, හැබැයි බාහිරයත් එක්ක සම්බන්ධ කරන්නේ නැහැ. කනයි, ශබ්දයයි හදන්නේ නැතුව අහගෙන ඉන්න පුළුවන්. හැබැයි පුරුදු කිරීම තුළයි එහෙම වෙන්නේ.

මෙන්න මේ පුරුදු කිරීමට කියනවා විදර්ශනාව කියලා. **පච්චුප්පන්න යො ධම්මං තත්‍ර තත්‍ර විපස්සති** - මේ මොහොතේ කනයි, ශබ්දයයි **පච්චුප්පන්න** ධර්මතා. දැන් අපි ඕවා නැහැ කියන්න යනවා නෙවෙයි. සමුදය පෙන්නනවා. **සමුදය ධම්මානුපස්සී** කියන එක තමයි මාර්ගය. හටගත්තා කියලා නවතින්නේ නැතුව, හටගත්තේ කොහොමද කියලා පෙන්නන්න ඕන. එහෙම පෙන්නන කොට මේ සමුදය තිබුණොත් විතරයි දෙපැත්තක් පැනවෙන්නේ කියලා අපට නුවණක් එනවා. මේ සමුදය යෙදුණේ නැත්නම් හටගන්න බැහැ කියන ධර්මතාවය අපට පෙනෙන්න ගන්නවා.

හොඳට මතක තියාගන්න නිරෝධ කියන්නේ හටගත්ත දෙය නැතිවුණා කියන එක නෙවෙයි. නොහටගැනීමටයි නිරෝධය කියන්නේ. නිරෝධ ධර්ම අපේ මෝඩකමට උපද්දලා තියෙනවා. අපේ මෝඩකම මතයි පැනෙව්වේ, අපේ මෝඩකම මතයි හටගත්තේ. **සබ්බං තං නිරොධ ධම්මං** කියන එකේ ලොකු ගැඹුරක් තියෙනවා. ඒක තේරුම් ගත්තොත් සෝවාන් වෙනවා. සෝවාන් වෙන එකයි, රහත් වෙන එකයි පටලවා ගන්න එපා. දැන් අපට තියෙන්නේ අහගත්ත දැනුම විතරයි නමුත් සෝවාන් වීමේ දී ප්‍රත්‍යක්ෂව මේ ධර්මතාවය දකිනවා. නමුත් සතිය නැති වෙලාවට ලෝකයට අහුවෙනවා.

දැන් අපි මේ සාකච්ඡා කරපු ධර්මතාවය තේරුම් ගන්න බැරි නැහැ නේද? එහෙම වුණා නම් බුදුරජාණන් වහන්සේ දේශනා කරන්නෙත් නැහැ. හැබැයි අපේ සංසාරගත පුරුද්ද නිසා මේ සත්‍ය වැහිලා, අනිත් පැත්තමයි පෙන්නන්නේ. උඩුගම් බලා පීනනවා කියන්නෙත් ඒ නිසායි. ලෝකයාට ඇත්ත ආර්ය දර්ශනයේ දී බොරුවක් වෙනවා.

හොඳට ඇස් ඇරගෙන ඉන්න වෙලාවට වුණත් මේක පුරුදු කරන්න පුළුවන්. දැන් කපුටෙක් කෑගැහුවා කියලා හිතන්න. ඒ කාක්කා බාහිරයේ ද ඉන්නේ, හිතෙන් ද හැදුවේ කියලා හොඳට නුවණින් විමසලා බලන්න. එතකොට පෙනෙනවා මේ හිතේ හදපු දෙයක් මෝඩකමට එළියෙන් තියලා කියලා. කිසිම දෙයක් බලෙන් නවත්වන්න හදන්න එපා. බුදුදහමේ කියන එකම දෙය තමයි මොනවා හරි තියෙනවා නම් ඒකේ සමුදය හොයන්න කියලා. මේ කියන එක ඇත්ත කියලා වැටහෙනවා නම් ප්‍රායෝගිකව කරන්න පටන්ගන්න. අපි සාමාන්‍යයෙන් හිතන විදියට වඩා මේ කියන කරුණු වෙනස් නිසා තමයි අපට මේවා තේරුම්ගන්න අමාරු. ඒ නිසාම තමයි මේක පෙර නොඇසූ විරූ දහමක් කියලා කියන්නේ. බුදුරජාණන් වහන්සේමයි එහෙම දේශනා කරන්නේ - **පුබ්බෙ අනනුස්සුතෙසු ධම්මෙසු** කියලා. මෙවැනි දහමක් අපි වෙන කොහෙන්වත් අහලා නැහැ. නමුත් මේක බොරුයි කියලා කාටවත් එක තර්කයක්වත් ගේන්න බැහැ. ටිකක් හරි ප්‍රඥව තියෙන කෙනාට මේක ඇත්තමයි කියලා පෙනෙනවා. දෘෂ්ටිගත වුණ අයට තමයි මේ සම්බන්ධයෙන් හිතාගන්නවත් බැරි!

ප්‍රශ්නය: යම්කිසි ආයතනයකින් නේද අපි ඕනෑම දෙයක් දැනගන්නේ?

පිළිතුර: ආයතනයකින් දැනගත්ත දෙයකින් තමයි අපි මුලින්ම පටන්ගන්නේ. ඊළඟට අපි ඒක විදර්ශනයට යොමු කරනවා. විදර්ශනාවට යොමු කරන්නේ ආයතනයකින් නෙවෙයි. දැන් ශබ්දය ඇහුණේ කනෙන් නම් ඒකේ සමුදයයි සෙවිය යුත්තේ. **සමුදය ධම්මානුපස්සී** වෙන්නේ ආයතනයකින් නෙවෙයි. දැනට, මුළා වුණාට පස්සේ තමයි අපට විදර්ශනා කරන්න වෙන්නේ. රැවටුණ එකේ රැවටුණේ ඇයි කියලා පෙන්නනවා. බාහිර රූප පනවන එක වැරැද්දක් කියලා දකින්න අපට මුලින්ම ශක්තිය නැහැ. අපි හිතන්නේ බාහිරයේ මොනවා හරි තියෙනවා, ඒක දැක්කා විතර නේ කියලා. ඒ **දිට්ඨෙ දිට්ඨ මත්තං** මට්ටම නෙවෙයි කියන එක තේරුම් ගන්න ඕන.

ලෝකෝත්තර දර්ශනය ගැනයි අපි මේ කතා කරන්නේ. ලෝකයයි, ලෝක සමුදයයි, නිරෝධයයි, මාර්ගයයි තමන් තුළින් දකින ආකාරය.

ප්‍රශ්නය: උපේක්ෂාවෙන් දෙයක් දැක්කහම එතන මොකක් ද වෙන්නේ?

පිළිතුර: උපේක්ෂාවේදීත් ඒ ටිකම තමයි වෙන්නේ. දැන් සක්මන් භාවනාව කරනවා කියලා හිතන්න. එතකොට කකුල පොළවේ ගැටෙනවා. දැන් අපිට කකුල ගැනවත්, පොළව ගැනවත් ඇලීමක්, ගැටීමක් නැහැ. උපේක්ෂාවක් තියෙන්නේ. නමුත් අපි ඒ අවස්ථාවේ දී තවම **සමුදය ධම්මානුපස්සී** වුණේ නැහැ.

මූලික දෙය තමයි රහතන් වහන්සේගේ ස්වභාවය ගැන දැන්මම හිතන්න යන්න එපා. මුලින්ම තමන් **සමුදය ධම්මානුපස්සී** වෙන්න පටන් ගන්න. එතකොට ඔය ප්‍රශ්න වලට උත්තර ලැබෙනවා. ප්‍රශ්න අහන්න එපා කියලා නෙවෙයි මේ කියන්නේ. ඒවාට උත්තර නැතුවාත් නෙවෙයි. හැබැයි ප්‍රායෝගිකව යෙදෙන්නේ නැතුව තර්කයෙන් විතරක් මේක අල්ලන්න ගියාට හරි අමාරුයි. තර්ක කරන එක හොඳයි, හැබැයි සමහර ඒවාට උත්තර තර්කයෙන් ලැබෙන්නේ නැහැ.

දැන් බල්ලාගේ උපමාවේ දී බල්ලා හොඳටම රැවටිලායි ඉන්නේ. ඌ ඇවිල්ලා වතුරේ ඉන්න බල්ලා ගැන අපෙන් ප්‍රශ්න අහනවා කියලා හිතන්න. ඔය බල්ලා සැර බල්ලෙක් ද, හොරෙක් ද කියලා ඔය වගේ ප්‍රශ්න අහනවා. ඒ මානසිකත්වයට ඒවා සාධාරණයි. හැබැයි අපි උත්තර දෙන්න ගියොත් අපිත් මෝඩ වෙනවා. ඒ නිසා තමයි මනස වඩන්නේ නැතුව තර්කයෙන් විතරක් මේ ධර්මතා දකින්න බැහැ කියන්නේ. සමහර ධර්ම කරුණු නොවැඩුණු මනසකට ගෝචර නැහැ. නොවැඩුණු මනසකට ඒ කරුණු තේරුම් ගන්න අමාරුයි.

බුදුරජාණන් වහන්සේ සමහර ප්‍රශ්න වලට උත්තර දෙන්නේ නැහැ, උත්තර දුන්නොත් ඒ කෙනාට හානියක් වෙන නිසා. උත්තර දුන්නොත් එයා දෘෂ්ටිගත වෙනවා. අර වතුරේ ඉන්න බල්ලා හොරෙක් ද කියන එකට අපි උත්තර දුන්නොත් අපි බල්ලාව වැරදි දෘෂ්ටියකට පත්කරනවා. ඒ නිසා ඔය ප්‍රශ්නය වැරදි බව අපි කොහොම හරි පෙන්නලා දෙන්න ඕන. බල්ලෙක් මවාගෙන නේ ඔය ප්‍රශ්නය අහන්නේ කියලායි අපි තේරුම් කරලා දෙන්න ඕන. නැතුව ඔතන දී ඔව් හෝ නැහැ කිව්වොත් අපිත් මුළාවට අහුවෙලා, ඌවත් මුළා කරනවා.

සමහර ප්‍රශ්න තියෙනවා ඒවාට කියන්නේ අව්‍යාකෘත ප්‍රශ්න කියලා. ඒ ප්‍රශ්නවල අඩුවක් තියෙනවා. ප්‍රශ්නයේ අඩුවක් තියෙද්දී උත්තර දෙන්න ගියොත් වැරදි දෘෂ්ටියකට වැටෙනවා. ඒ නිසා කෙනෙක් රූපයක් ගැන ප්‍රශ්නයක් අහනවා නම් මුලින්ම රූපයේ සමුදය බලලා ඉන්න කියලායි කියන්න තියෙන්නේ. **සමුදය ධම්මානුපස්සී** වෙන්න කියලා. සමුදය බලන කොට ඒ ප්‍රශ්නයට උත්තරය නිකම්ම ලැබෙනවා. එහෙම දෙයක් තමයි දහම නිවැරදිව විමසීමේ දී සිදුවෙන්නේ. දැන් බල්ලා අපෙන් ප්‍රශ්න අහන කොට අපි කියනවා ඉස්සෙල්ලා ඔය බල්ලා හටගත්තේ කොහොමද කියලා හොයාගන්න කියලා. ඒක හොයාගත්තාට පස්සේ අර ප්‍රශ්න මොකුත් අහන්නේ නැහැ. අහන්න ප්‍රශ්න නැතිවෙනවා. ක්‍රම ක්‍රමයෙන් තමයි අපට මේ මනස වඩන්න තියෙන්නේ. හැබැයි වැඩි කාලයක් යන්නෙත් නැහැ. දහම නිවැරදිව දකින්න පටන්ගත්තාට පස්සේ හරි පහසුවෙන් මේ කියන ධර්මතා දකින්නත් පුළුවන්. මේක තේරුම් ගත්තාට පස්සේ කිසි ගැඹුරකුත් නැහැ. දැන් අපට සමහර විට දහම ගැඹුරුයි වගේ

පෙනෙනවා. මේ පැත්තෙන් අහලා, විමසලා නැති නිසායි එහෙම වෙන්නේ. හැබැයි මේ කියන්නේ තේරුම් ගන්න බැරි ස්වභාවයක් නෙවෙයි. වැරදි විදියට බලන්න ගිහින් තමයි දහම අපට සංකීර්ණ වෙලා තියෙන්නේ.

හැබැයි හුඟක් ප්‍රවේසම් වෙන්න ඕන අපේ අදහස් දමන්නේ නැතුව දහමටම ගළපලා විමසන්න. අපට ඕන තේරුම් දන්න ගිය ගමන්ම වරද්ද ගන්නවා. 'ඔය කියන්නේ මේකයි' කියලා අපේ වචන දන්න යනවා. එතකොට මාර්ගය අවුල් කරගන්නවා. බොහොම පරිස්සමින් දහමේ තියෙන වචන ටිකෙන් විතරක් දහම විමසන්න උත්සාහ කරන්න. එතකොට කාටවත් වරදින්නේ නැහැ.

එතකොට පටිච්චසමුප්පාදය, චතුරාර්‍ය සත්‍යය, සතර සතිපට්ඨානය, ඔය ඔක්කෝම එකම තැන තියෙන්නේ. අජ්ඣත්ත බහිද්ධ පනවන්නේ අවිද්‍යාව මතයි කියන තැනට මනස වඩන්න උත්සාහ කරන්න. එතන මුළු ධර්මතාවයම තියෙනවා. අජ්ඣත්ත ආයතනයත්, බහිද්ධ ආයතනයත් සංඛතයි, පටිච්චසමුප්පන්නයි, අවිද්‍යා ප්‍රත්‍යයෙන් කියලා බලන්න තියෙනවා. සංඛතයි කියන්නේ හේතු ප්‍රත්‍යයෙන් හටගත්තේ. ඒක කියන්න නම් හේතුප්‍රත්‍යය ගැනත් හොයාගන්න ඕන. කටපාඩමින් මේ වචන ටික කියලා හරියන්නේ නැහැ. ඒක හොයාගන්නයි **සමුදය ධම්මානුපස්සී** විය යුත්තේ.

ප්‍රශ්නය: ඇලීම-ගැටීම නැතිවෙන විදියට කල්පනා කළොත් නිවැරදි ද?

පිළිතුර: ඇලීම ගැටීම අඩුකරන එක පූර්ව ප්‍රතිපදාව විතරයි. ඒක විදර්ශනාව නෙවෙයි. විදර්ශනා කරන්න පටන්ගන්න කොට මුලින්ම තමන්ට පහසුයි කියලා හිතෙන ආයතනයකින් පටන්ගන්න. ඒක කෙනා කෙනාට වෙනස් වෙන්න පුළුවන්. සාමාන්‍යයෙන් ඇසීම තමයි විදර්ශනා කරන්න පහසුම තැන කියන එකයි මගේ අදහස. ඇසීමේ දී වර්ණයක්, හැඩයක් නැහැ නේ. එතකොට අපි හිතෙන් හදන ටික හොඳට පෙනෙනවා. අපි හිතෙන් දැනගත්ත දේවල් ශබ්දයට අයිති නැහැ. ඒක බලන්න ටිකක් පහසුයි. පටන්ගැන්මේ දී ඇහෙන් දකින දේවල් ගැන බලන්න අමාරුයි. 'තියෙන හින්දා නේ

පෙනෙන්නේ' කියන තැන තමයි අපි සාමාන්‍යයෙන් ඉන්නේ. කනෙන් ඇහෙන ශබ්දය ගැන විදර්ශනා කරන එක ඊට වඩා පහසුයි.

ප්‍රශ්නය: රූපය නම් දිගටම පෙනෙනවා නමුත් ශබ්දය ඇහිලා ඒ වෙලාවේම නිරෝධවෙනවා නේද?

පිළිතුර: ඔය නිරෝධ වෙනවා කියන්නේ ඇතිවුණ එක නැතිවෙනවා කියන එකට නේ. ඒක නෙවෙයි මේ කියන්නේ. හටගත්තා නම් හටගත්තේ ඇයි? කියලා විමසන්න ඕන. හටගත්ත දෙය නැතිවෙන එක අපි බැලුවත් නැතත් සිද්ධ වෙනවා. අපට බලන්න තියෙන්නේ හටගත්තා නම් හටගත්තේ ඇයි කියලා. සමුදය. ඇසීම ඇසීම බව නොදන්නකමටයි හටගත්තේ.

එතන ටිකක් ගැඹුරුයි. එතෙන්ට යන්න කලින් ශබ්දයට රූප සම්බන්ධ කරන එක ගැන විමසීමයි අපට මුලින්ම කරන්න තියෙන්නේ. ඇහෙන්නේ ශබ්දයක්, ඒකේ රූප තියෙන්න බැහැ නේ, ශබ්දයේ වර්ණ හෝ හැඩ තියෙන්න බැහැ නේ කියන පැත්ත. හැබැයි අපට මතක්වෙන දේවල් - ඔය ශබ්දය ආවේ මේකෙන් කියලා මතක්වෙන එකේ ඔක්කොම යෙදිලා තියෙනවා. එහෙනම් ඒක මුළාවක් බව දකින්න ඕන. මේ හිතෙන් හදන එකයි ඔය පෙනෙන්නේ, එළියේ තියෙන එක නෙවෙයි කියන තැනින් පටන්ගන්න වෙනවා. ශබ්දයට අනුව මොනවද හිතුනේ කියන තැනින් පටන්ගන්න. එතකොට ඒ දේවල් ඇහෙන් දැක්කා ද, හිතෙන් හිතුවා ද? අන්න එහෙම මෙනෙහි කරන්න. ඒක හුරු කරගෙන යනකොට ඊළඟට ගැඹුරු තැන තේරුම් ගන්න පුළුවන් වෙයි. එතෙන්ට එකපාරටම එන්න අමාරුයි.

ප්‍රශ්නය: ඒ හිතෙන් හැදුවේ අවිද්‍යාව නිසා ද?

පිළිතුර: හිතෙන් හැදුවේ අවිද්‍යාව නිසා නෙවෙයි. ඔය හිතෙන් හදපු එක එළියේ නේ තියෙන්නේ කියලා විශ්වාස කළේ අවිද්‍යාව නිසා යි. දැන් කපුටෙක් කෑගහනවා ඇහෙනවා කියමු. අපට හිතෙන්නේ එළියේ ඉන්න කපුටෙක් කෑගහනවා කියලා නේ. එළියේ කපුටෙක් නෙවෙයි, මේ හිතේ හදපු කපුටයි අපි දැනගත්තේ. එළියට සම්බන්ධ කළේ අවිද්‍යාවෙන්. අන්න එතන ඉස්සෙල්ලා පෙන්නන්න

පුරුදුවෙන්න. දැනගත්ත දෙය එළියේ තියෙනවා කියලා කියන්නේ මෝඩකමට. දැන් හඳුනගන්න දෙයක් එළියේ තියෙනවා කියලා අපි භාරගත්තා නේ. දැනගත්ත දෙය එළියේ දෙයක් නෙවෙයි, හිතෙන් හදගත්තේ කියලා පෙන්නන්න.

ප්‍රශ්නය: ඔය විග්‍රහ කරන්නේ සතර සතිපට්ඨානය ද?

පිළිතුර: ඔව්. **සමුදය ධම්මානුපස්සී** වීම ම තමයි, වෙන මොකුත් නෙවෙයි මේ විස්තර කරන්නේ. අපේ පරණ පුරුද්ද කඩන්න නම් සතිපට්ඨානය නිතර නිතර පුරුදු කරන්න ඕන. **භාවිතා බහුලිකතා** කියන එක තමයි බුද්ධ දේශනාව. භාවිතා කරන්න, බහුලව භාවිතා කරන්න. හැබැයි ඉස්සෙල්ලා දන්න-දකින කෙනෙක් වෙන්න ඕන. නැත්නම් භාවිතා කරන්න බැහැ. ඒකත් පැහැදිළිවම බුද්ධ දේශනාවේ තියෙනවා. මේක කරන්න පුළුවන් දන්න-දකින කෙනාට විතරයි. නොදන්න, නොදකින කෙනාට බැහැ කියලාම බුදුරජාණන් වහන්සේ දේශනා කරලා තියෙනවා. අපි කොච්චර තර්ක කරන්න ගියත් වැඩක් නැහැ. **ඉති රූපං ඉති රූපස්ස සමුදයෝ** කියන එක ඉස්සෙල්ලා දැනගන්න ඕන. තේරුම්ගන්න ඕන.

ප්‍රායෝගිකව කරන්න පුළුවන් හොඳම ක්‍රමය තමයි ඇහෙන ශබ්ද ගැන හොඳට අහගෙන ඉන්න. බාහිර රූපයක් සම්බන්ධ කරන්නේ නැතුව අපට එක ශබ්දයක්වත් අහන්න බැහැ. හැම ශබ්දයකටම අපට රූපයක් තියෙනවා. ඒ අපේ සංසාරගත පුරුද්ද. අපි විමසන්න ඕන ඔය රූපය මේ මොහොතේ එළියේ තියෙන දෙය ද, නැත්නම් හිතෙන් හදන දෙය ද කියලා. ඇහෙන්නේ ශබ්දය විතරයි, ඇහැට ශබ්දය පෙනෙන්නේ නැහැ. එහෙනම් ඔය දැක්කෙම හිතෙන් හදපු දෙයක්. ඔය සිද්ධිය නැවත නැවත හිතට මතක් කරලා දෙන්න. ඕක තමයි ප්‍රායෝගිකව කරන්න තියෙන මුල් පියවර.

ප්‍රශ්නය: හුස්ම ගැන බලන ආකාරය විස්තර කරන්න.

පිළිතුර: හුස්ම ගැන බලන එක ටිකක් ගැඹුරුයි. ඉස්සෙල්ලා ශබ්දය පුරුදු කරන්න. හුස්ම ගැන බලනවා නම් කරන්න තියෙන්නේ හුස්ම කය කියන එකේ සමුදය මොකක් ද කියලා බලන්න. හුස්ම කයක් තියෙනවා කියලා දැනගත්තේ කොහොම ද? ආශ්වාස ප්‍රශ්වාසයක්

තියෙනවා කියලා දැනගත්තේ කොහොම ද? මොන ආයතන වලින් ද? කායායතනයයි, මනායතනයයි. ඒ විදියට මුලින් ආයතන දෙක වෙන්කර ගන්න. ඊළඟට ආයතන කෘත්‍ය විමසන්න. කායායතනයේ කෘත්‍ය මොකක් ද? මනායතනයේ කෘත්‍ය මොකක් ද? දැන් අපි ආයතන වල කෘත්‍යය දන්නවා නේ, දිට්ඨ, සුත, මුත, විඤ්ඤත කියලා. කායායතනයේ කෘත්‍ය මුත - දැනීමක් දෙනවා විතරයි. දැනීම කියන්නේ හුස්ම නෙවෙයි. එක ක්ෂණයක දැනීම ගත්තොත් ඒක ආශ්වාසයක් ද, ප්‍රශ්වාසයක් ද කියලා කියන්න බැහැ. දැනීම් කිහිපයක් එකතු කළාට පස්සේ තමයි ආශ්වාසයක් හෝ ප්‍රශ්වාසයක් කියලා කියන්නේ. එතන දී විමසලා බලන්න ආශ්වාසයක් හෝ ප්‍රශ්වාසයක් කියලා කියන්නේ කායායතනයෙන් ද, මනායතනයෙන් කියලා. ඒ කියලා තියෙන්නේ මනායතනයෙන් බව එතකොට පෙනෙන්න ගන්නවා. ඊළඟට බලන්න මනායතනයෙන් කියන ඒවා අල්ලන්න පුළුවන් ද? කියලා. එහෙනම් ඒක නාසයේ හැපෙන්න පුළුවන් ද? බැහැ. ඔන්න එතකොට හුස්මේ සමුදයයි, නිරෝධයයි පෙනෙනවා. ආයතන විදියට බලන්න - එච්චරයි කරන්න තියෙන්නේ.

හරි සරළ දෙයක් මේ කියන්නේ. ඉස්සෙල්ලා ආයතන හඳුන ගන්න, ඊළඟට ආයතන කෘත්‍ය මතක් කරගන්න. ඊට වඩා අපි එකතු කරන දේවල් මුළාවක් බව තේරුම් ගන්න. එතකොට එළියේ තියෙන හුස්ම කියන්නේ අපි මෝඩකමට එකතු කරපු දෙයක් බව පෙනෙනවා. දැනීමකුයි, සිතීමකුයි විතරයි මෙතන තියෙන්නේ කියන බව දැක්කේ නැහැ. එතකොට දැනීමටයි, සිතීමටයි දෙකටම එළියේ දෙයක් දෙන්න බැහැ. ඒ දෙකම තියෙන්නේ තමන් තුළ. එහෙනම් අපේ මෝඩකමට තමයි නාසයකුයි, හුස්මකුයි පනවලා තියෙන්නේ කියලා නුවණට පෙනෙන්න ගන්නවා.

ප්‍රශ්නය: පූර්ව ප්‍රතිපදාවේ දී, **සමුදය ධම්මානුපස්සී** වා වෙන්න ඉස්සෙල්ලා ඒක බලන්නේ කොහොම ද?

පිළිතුර: එතන දී ඉස්සෙල්ලා හුස්ම කියලා දෙයක් තියෙනවා නම් ඒකේ ලක්ෂණ ටික ලෝකයට අයිති විදියට හොයාගන්න ඕන. දිග, කෙටි ආදි වශයෙන්. මේ හුස්ම කියන එක හොඳට තේරුම් ගන්න.

ඉති රූපං - රූපය මේකයි කියලා. අපි තවම මාර්ගය පටන්ගත්තේ නැහැ කියන බව හොඳට මතක තියාගන්න. කයක් තියෙන බව දැනගත්තා නම් ඊට පස්සේ තමයි **කායානුපස්සී** වෙන්න කියන්නේ. බහුතරයක් කරන්නේ හුස්ම දිහා බලාගෙන ඉන්න එක විතරයි. බුද්ධ දේශනාවට අනුව සමුදය බලලා නැහැ. බොහෝ දෙනෙක් වර්තමානයේ පුරුදුකරන ආනාපානසතිය බුදුරජාණන් වහන්සේට කලින් හිටපු අයත් කරපු එකක්.

නිකම්ම හුස්ම දිහා බලාගෙන හිටියාට දහම අවබෝධ වෙන්නේ නැහැ. සමුදය ධර්මය බලන්න ඕන කියන එක අනිවාර්යයි. එහෙම කෙනා සතිපට්ඨානය වැඩුවොත් මගඵල ලැබෙනවාමයි. මේ භාවනා කරනවා කියන අයගෙන් අහලා බලන්න කොයි වෙලාවෙ ද ඒ අය සමුදය බැලුවේ කියලා. අපි හුගක් වෙලාවට කළ යුත්ත නිවැරදිව හොයාගෙන නෙවෙයි භාවනා කියලා කරන්නේ.

ප්‍රශ්නය: සමහර අය කියනවා හුස්මරැල්ල නැහැ කියලා යම්කිසි තැනකට එනවා ලු. එතනින් එහාට ඉබේම ඉතිරි ටික වෙනවා ලු. ඒ ගැන මොනවද කියන්නේ?

පිළිතුර: ඒක දෘෂ්ටිගත වීමක් විතරයි. හුස්මේ සඤ්ඤාව නැහැ කියන්නේ අසඤ්ඤාව ඉන්නවා. එහෙම ඉඳලා මැරුණොත් අසඤ්ඤතලයේ උපදින්න පුළුවන්. එතන පටිච්චසමුප්පාදය දැක්කා ද, චතුරාර්‍ය්‍ය සත්‍යය අවබෝධ වුණා ද කියලා ඒ කියන අයගෙන් අහන්න!

ප්‍රශ්නය: පව් වලින් මිදිලා පින් කිරීම තමයි සම්මාදිට්ඨිය කියලා කියනවා නේද?

පිළිතුර: ඒක මේ විදියට තේරුම් ගන්න. ඒ ලෝකයට අයිති කෙනාගේ සම්මාදිට්ඨිය. ලෝකෝත්තර සම්මාදිට්ඨිය ගැන දන්න කෙනාටයි අතන අඩුව පෙනෙන්නේ.

ඉති රූපං, ඉති රූපස්ස සමුදයො, ඉති රූපස්ස අත්ථගමො කියන පැත්තෙන් විමසුවොත් ලෝකයයි, ලෝක සමුදයයි, ලෝක නිරෝධයයි පැහැදිලිව පෙනෙනවා. මේ ලෝකෝත්තර දහම තේරුම්

ගන්නකොටයි ලෞකික සම්මාදිට්ඨියෙන් එහාට යන්න ඕන කියන බව වැටහෙන්නේ. නැත්නම් ලෞකික සම්මාදිට්ඨියේ අඩුව පෙනෙන්නේ නැහැ.

ප්‍රශ්නය: මේ සියල්ලම මායාකාරී ලෙස අවිද්‍යාවෙන් ගොඩනගා ගත්ත දෙයක් කියලා සත්ත්වපුද්ගලභාවයකින් තොරව මේක දකින්න පුළුවන් නම් හරි නේද?

පිළිතුර: එහෙම කියන්න ගියහම ආයෙත් දෘෂ්ටියකට අහුවෙනවා. එතකොට සත්ත්වපුද්ගලභාවයකින් තොරව ලෝකය දකින්න යනවා. එහෙම දෙයක් නෙවෙයි මේ කියන්නේ. සත්ත්වපුද්ගලභාවයකින් තොරව හෝ ලෝකය පැනවූයේ නම් දුක හටගෙන! නිරෝධය සාක්ෂාත් වෙනකොට ඔය කතා යෙදෙන්නේ නැහැ.

ප්‍රශ්නය: ශබ්දයක් ඇහෙන කොට ඒක තුළ නැවත නැවත බලන්නේ කොහොම ද?

පිළිතුර: දැන් ශබ්දයක් ඇහෙන කොට අපි රූපයට අහුවෙනවා නේ. එතකොට අපි මෝඩකමට අහුවුණා කියන එක මතක් කරලා දෙන්න. දැන් බල්ලෙක් බුරන එක ඇහෙනවා කියලා හිතන්න. අපට හිතෙන්නේ එළියේ බල්ලෙක් ඉන්නවා, ඌ කෑගහනවා කියලා. එතකොට අපි අනිත් පැත්තට පෙන්නනවා ඔය ලෝකයා හිතන හැටි - 'එළියේ බල්ලෙක් හිටියා, ඌ කෑගැහුවා, ඒක මට ඇහුණා' කියලා. විදර්ශනයේදී අපි නුවණින් අපේ පැත්තෙන් සිද්ධවුණ දෙය පෙන්නනවා. ශබ්දය ඇහුණ නිසායි ඔය ටික දැනගත්තේ කියලා. ඇහුණේ නැත්නම් අපේ ලෝකයට ඔය රූපය නැහැ. එහෙනම් මෙහේ පටන්ගත්තේ ඇහෙන එකෙන්. ඇසීම ගැන හිතන්න ගිහින් තමයි බල්ලෙක් කියලා දැනගත්තේ. 'ඔය බල්ලෙක්' කියලා දැනගන්නකොට ශබ්දය ඉවරයි. එහෙනම් මේ ශබ්දයට පස්සේ දැනගත්ත බල්ලා බුරපු ශබ්දය ද ඉස්සෙල්ලා අර ඇහුණේ? වෙන්න බැහැ නේ. ඒ එක පැත්තක්. ශබ්දය ඇහුණාට පස්සේ නේ අපි බල්ලා හදලා තියෙන්නේ. දැන් ලෝකයට අයිති විදියට නම් බල්ලා හිටියා, ඌ බිරුවා. ඒක මට ඇහුණා.

නමුත් ඇත්ත ඇතිහැටි බැලුවොත් - ශබ්දයක් ඇහුණා, ඒක ගැන හිතන්න ගිහින් බල්ලෙක් හැදුවා. බල්ලා හදනකොට ශබ්දය ඉවරයි. එහෙනම් පස්සේ හදපු බල්ලා බුරපු ශබ්දය ද මේ කලින් ඇහිලා තියෙන්නේ? වෙන්න බැහැ නේ. මෙන්න මේ ආකාරයට නුවණින් විමසන්න පුරුදු වෙන්න.

ඔන්න ඔහොම අපේ වැරැද්ද පෙන්නන කොට; එහෙනම් ඔය එළියේ ඉන්න බල්ලෙක් නෙවෙයි, මේ දැනගත්තේ හිතෙන් හදපු බල්ලෙක් ගැනයි. ඒ හිතෙන් හදපු එක එළියේ තිබ්බේ මෝඩකමට, අවිද්‍යාව නිසා නේ කියලා පෙනෙන්න ගන්නවා.

ප්‍රශ්නය: ඒක දැක්කා කියමු. එතනින් එහාට මොකක්ද කරන්න ඕන?

පිළිතුර: මෙහෙම පෙන්නන කොට අපි බාහිර ලෝකයෙන් ටික ටික මිදෙනවා. හිතෙන් හදපු එකක් නේ ඔය දැනගත්තේ කියන තැනට එනවා. හැබැයි අපට තවම ශබ්දයකුත් ඇහෙනවා, බල්ලෙකුත් හැදෙනවා. බාහිරයට සම්බන්ධ කරන්නේ නැති එක තමයි මුලින් වෙන්නේ. හිතන එක නවත්වන්න හදනවා නෙවෙයි. හිතන එක නවත්වන්න යන්නත් එපා. ඒක සමාධිය විතරයි. ඒවායින් තමයි අසඤ්ඤ තලයට යන්නේ.

ප්‍රශ්නය: මේ විදියට පෙනෙන කොට මොනම පදනමක් නිසාවත් රාගයක්, ද්වේෂයක් සකස් වෙන්න බැහැ නේද?

පිළිතුර: එහෙම වෙන්න නම් අනාගාමී වෙන්න ඕන. අපට මේ ඉන්නවා, තියෙනවා කියන දේවල් අපේ මෝඩකමට හදගත්තා කියන එකයි මෙතන මුලින්ම පෙන්විය යුත්තේ. ප්‍රඥාවෙන් දකින කොට අතහරින්න දෙයක් නැහැ. අතහරින්න කිසිවක් හටගන්නේ නැති වෙනවා. මෝඩකමට හදන දේවල් ටික ටික අයින් වෙනවා මිසක් තියෙන දේවල් නැතිවෙයි කියලා භයවෙන්න ඕන නැහැ! ප්‍රඥාව වඩන්න විතරයි අපට තියෙන්නේ. ඇත්ත පෙන්නලා දෙන්න. ඇත්ත පෙන්නලා දෙන්න නම් ඉස්සෙල්ලා ඇත්ත මොකක්ද කියලා තේරුම් ගන්න වෙනවා. ඒකට තමයි බුදුදහම තියෙන්නේ. කළ්‍යාණ මිත්‍ර ඇසුරයි, සද්ධර්ම ශ්‍රවණයයි අවශ්‍ය බව බුදුරජාණන් වහන්සේ දේශනා කරලා තියෙනවා. ඉන්පසුවයි යෝනිසොමනසිකාරය

කරන්න තියෙන්නේ. කළ්‍යාණ මිත්‍ර ඇසුරයි, සද්ධර්ම ශ්‍රවණයයි වැරදුණොත් යෝනිසොමනසිකාරයත් වරදිනවා. අපි මොකක් හරි ක්‍රමයක් විදර්ශනාව කියලා හිතාගෙන ඒක කරලා හරියන්නේ නැහැ. සම්මා දිට්ඨිය ඇතිවෙන විදියට දහම නුවණින් විමසන්න පුරුදුවෙන්න.

ප්‍රශ්නය: එස්සය ගැනත් ටිකක් විස්තර කරන්න.

පිළිතුර: අජ්ඣත්ත රූපය, බහිද්ධ රූපය, විඤ්ඤාණය කියන තුන හටගත්තොත් එස්සය වෙනවා. එස්සයත් පටිච්චසමුප්පන්නයි. අවිද්‍යාව මතයි එස්සය තියෙන්නේ. එස්සයයි, එස්ස සමුදයයි, එස්ස නිරෝධයයි දැක්කොත් සම්මාදිට්ඨිය ඇතිවෙනවා කියලා සම්මාදිට්ඨි සූත්‍රයේ[38] දේශනා කරලා තියෙනවා. ඇහෙන් දකින මොහොතේම එස්ස නිරෝධයත් තියෙනවා. අපි නිරෝධය කියලා දැනට හිතන්නේ; යමක් දැක්කා, ඊටපස්සේ ඒ දැක්ක දෙය නැතිවුණා කියලායි. එහෙම දෙයක් නෙවෙයි දකින්න ඕන. මෝඩකම තියෙනකොට එස්සය තියෙනවා, මෝඩකම යෙදුණේ නැත්නම් එස්සය හටගන්න බැහැ කියන ධර්මතාවය. එස්සය කියන්නේ දුක. ආයතන හැදුවා කියන්නේ දුක හටගත්තා. සමුදය දැක්කා නම් නිරෝධ වෙනවා නෙවෙයි, නිරෝධය කියන්නේ මොකක් ද කියලා අවබෝධ වෙනවා. සමුදය යෙදුණ නිසා ඕක තියෙනවා. අපට සමුදය යෙදුණාට සමුදය යෙදෙන්නේ නැති මනසකුත් තියෙනවා නේ. ඒ මනසට ඕක නිරෝධයි නේද? කියන නුවණ එනවා. අන්න ඒකටයි සාක්ෂාත් වෙනවා කියන්නේ. ආයතන වලට නෙවෙයි, ප්‍රඥාවටයි ඒක පෙනෙන්නේ. ප්‍රඥාවට තමයි පටිච්චසමුප්පන්න බව පෙනෙන්නේ. අපට අජ්ඣත්ත රූපය, බහිද්ධ රූපය, විඤ්ඤාණය හැදුණාට රහතන් වහන්සේට ඒවා හටගන්නේ නැහැ කියන නුවණක් එනවා. ඒ තමයි නිරෝධෙ ඤාණය.

දැන් ත්‍රිලක්ෂණය වෙන පැත්තකින් පෙනෙයි. මෝඩකම තියෙනකම් අපි දේවල් පනවනවා - නිත්‍යයි, තියෙනවා කියලා. අවිද්‍යාව යෙදුණේ නැත්නම්? නිත්‍ය කළේ මෝඩකමට නේ. නිත්‍ය කරන්න

[38] සම්මාදිට්ඨි සූත්‍රය - මජ්ඣිම නිකාය, මූලපණ්ණාසකය, මූලපරියායවග්ගය.

බැරි බවටයි අනිත්‍ය කියන්නේ. පිහිටුවන්න බැරි ස්වභාවයක් අපි පිහිටුවලා තියෙන්නේ මෝඩකමට. අනිත්‍ය බව දකිනවා කියන්නේ නිරෝධ බව දකිනවා - මෝඩකමට උපද්දලා කියලා. දැන් අර පැනවීම නිසා වින්ද සුඛයට මොකක් වෙයි ද? දැන් යමක් අනිත්‍ය නම් දුකයි කියන ධර්මතාවය පෙනෙන්න ගන්නවා. 'යමක්' කියන්නේ අපි මෙච්චරකල් ඇතැයි කියලා භාරගත්ත දේවල්. යමකින් ආස්වාදයක් වින්ද නම් ඒ මොන මෝඩකමට ද කියලා පෙනෙනවා. අනිත්‍ය බව දැකීම තුළ දුක අවබෝධ වෙනවා.

අනිත්‍ය සහ දුක් බව දකින කොට, දැන් ආත්ම කතාවක් යෙදෙන්නෙත් නැහැ. ඔය ටික දකින කොට සක්කායදිට්ඨිය කැඩෙනවා. රූපය ඇසුරුවෙන්නේ නැහැ. 'මම නැති රූපයක්' ගැන දැන් මෝඩකමටයි කතා කරලා තියෙන්නේ කියලා පෙනෙන්න ගන්නවා. ඒ වෙනස නුවණින් තේරුම් ගන්න උත්සාහ කරන්න. කලින් අපි මෙපමණ කල් බලන්න හැදුවේ 'රූපය තියෙනවා, ඒක මම නෙවෙයි' කියන්න නේ. යමක් අනිත්‍ය නම් ඒක සැප ද, දුක ද? යමක් අනිත්‍ය නම්, දුක නම්, ඒක මම, මගේ, මගේ ආත්මය වශයෙන් ගන්න එක සුදුසු ද කියලයි දහමේ අහන්නේ. අනිත්‍ය දුක්කහම 'මම, මගේ' කියන කතාවක් යෙදෙන්නේ නැහැ. ප්‍රශ්නය වැරදියි කියලා පෙනෙනවා. රූපය අනාත්මයි කියන්න ගිය එකේ මෝඩකම පෙනෙනවා.

බුදුදහම නිවැරදිව තේරුම් ගන්නකොට ඉච්ඡ නැති බවින් අනිච්ඡයි, වෙනස්වෙන නිසා අනිත්‍යයි ආදි වශයෙන් කරන විග්‍රහයන් මෝඩ කතා කියලා පෙනෙනවා. ඉතින් ඒවා එක්ක තර්ක කරන එක නෙවෙයි, අපි නිවැරදි දහම පෙන්නන එකයි කරන්න ඕන. ඇත්ත දකිනකොට ඔය ප්‍රශ්න නැතිවෙනවා.

මේ දේවල් මම කිව්වට පිළිගන්නත් එපා. දහමට ගළපලා බලන ගමන් ටිකක් ප්‍රායෝගිකව විදර්ශනයේ යෙදෙන්න. එතකොට තමන්ටම දහම පෙනෙන්න ගන්නවා.

හැමදෙනාටම තෙරුවන් සරණයි!

අපට දැන් දහම අහන්න ලැබිලා තියෙන නිසා දන්න-දකින කෙනෙක් වුණාට පස්සේ (ඉති රූපං, ඉති රූපස්ස සමුදයෝ - වාසිජට සූත්‍රය [39]) - ඊළඟ පියවර තමයි සමුදය බැලීම. කායානුපස්සනාව වඩනවා කිව්වාට අපි මෙපමණ කල් කරලා තියෙන්නේ කායානුපස්සනාවේ මුල් කොටස විතරයි. ඒක පූර්ව ප්‍රතිපදාව, ලෝකයට අයිති කොටසයි. තමන්ගෙන්ම ප්‍රශ්න කරන්න - ඔය කය ඔහොම තියෙන බව දැනගත්තේ කවුද? 'මම' කියලා කියන්න වෙනවා නේද? ඔය කය ඔහොම ඉරියව්වලින් තියෙනවා, ඔය කය සතරමහාධාතු වලින් හැදිලා තියෙනවා කියලා දැනගත්තු කෙනාත් ඉන්නවා, ඕවා ඇතිවෙනවා, නැතිවෙනවා කියලා දැනගත්තු කෙනාත් තවම ඉන්නවා.

එහෙනම් අපි තවම විදර්ශණය පටන්අරගෙන නැහැ. තවම සමුදය ධම්මානුපස්සී වෙලා නැහැ. තවම මේ වඩන්නේ පූර්ව ප්‍රතිපදාව. තවම කය හඳුනාගන්න ටික විතරයි කරලා තියෙන්නේ. හුස්ම දිගයි, කොටයි, ඇතිවෙනවා, නැතිවෙනවා, හුස්ම නැහැ, සංසිදිලා කියලා දැනගත්තු 'මම' තවම ඉන්නවා. විදර්ශණය කියන්නේ බුද්ධ උපදේශයක්. කායානුපස්සනාවේ පොදු උපදේශය තමයිඃ **ඉති අජ්ඣත්තං වා කායෙ කායානුපස්සී විහරති, බහිද්ධාවා කායෙ කායානුපස්සී විහරති, අජ්ඣත්ත බහිද්ධාවා කායෙ කායානුපස්සී විහරති**. අපි තවම **කායානුපස්සී විහරති** වුණේ නැහැ. **කායානුපස්සී** වීම සඳහා කය ගැන හඳුනාගැනීමක් විතරයි තවම කළේ. ඒ තමයි **ඉති රූපං** කියන අවස්ථාව.

කායානුපස්සනාව තවම වැඩුවේ නැහැ කියන්නේ, **අනිස්සිතෝ ච විහරති** වීම සඳහා කළ යුත්ත තවම කළේ නැහැ. තවම **නිස්සිත**යි. කයක් ඇසුරු කරගෙනයි ඉන්නේ. ආනාපානසතිය වඩලා හුස්මේ ලක්ෂණයි, හුස්මට වෙන ටිකයි ඔක්කෝම දැනගත්තා. සමහර විට

[39] වාසිජටොපම සූත්‍රය - සංයුත්ත නිකාය, ඛන්ධක වග්ගය, ඛන්ධසංයුත්තය, පුප්ඵ වග්ගය.

හුස්ම නැතිවෙලා යන හැටිත් දැනගන්න ඇති. එතැනින් එහාට තමයි විදර්ශනාව පටන්ගන්නේ. ඔය හඳුනාගත්ත රූපයේ අනිත්‍ය සංඥාව වඩන්න ඕන. සමුදයයි, අස්ඛිගමයයි දැක්කොත් තමයි අනිත්‍ය සංඥාව වැඩුවා කියන්න පුළුවන් වෙන්නේ.

ප්‍රශ්නය: කායානුපස්සනාව වැඩුවහම මග-ඵල ලැබෙනවා ද?

පිළිතුර: ඔව්. බුද්ධ දේශනාවට අනුව සතර සතිපට්ඨානය වැඩුවොත් එහෙම වෙන්න ඕන. මග-ඵල ලබන්න නම් කායානුපස්සනාව වැඩෙන්න ඕන කියලායි දේශනාවේ තියෙන්නේ. අපි තවම කායානුපස්සනාව වඩන්න පටන්ගත්තේ නැහැ. තවම කායානුපස්සනාවේ ලෝකයට අයිති ටික විතරයි අපි කරලා තියෙන්නේ. ලෝකයෙන් එතෙරවෙන කොටස තවම පටන්ගත්තේ නැහැ. සමුදය හොයාගත්තාට පසුවයි ඒ ලෝකෝත්තර මාර්ගයට පිවිසෙන්නේ.

ප්‍රශ්නය: පූර්ව ප්‍රතිපදාවෙන් මග-ඵල ලබන්න බැරි ද?

පිළිතුර: පූර්ව ප්‍රතිපදාවෙන් මග-ඵල ලබන්න බැහැ. ඒ නිසා තමයි කිව්වේ පූර්ව ප්‍රතිපදාව වැඩුවාට, ඒ දැනගත්ත දේවල් දැනගත්ත 'මම' ඉන්නවා. මෙන්න මේ ලක්ෂණ වලින් යුක්ත කයක්, මේ හුස්ම දිගයි කොටයි, ඇතිවෙනවා නැතිවෙනවා, සියුම්වෙලා යනවා, දැනෙන්නේ නැතිව යනවා කියලා දැනගත්තු 'මම' තවම ඉන්නවා. ආනාපානසතිය වඩලා ඉවරවෙලා 'මට' වුණ විස්තර ටික කියනවා. 'මම' දැනගත්තු ටික ඇවිල්ලා කියනවා. මට මෙහෙම වුණා. දැන් මම සෝවාන් වෙලා ද? ඒ 'මට' වුණ දේවල් ටික ගැන නේද අහන්නේ. සක්කාය දිට්ඨියට වුණ ටික ඇවිල්ලා අහනවා. මගේ සක්කායදිට්ඨිය නැතිවුණා ද කියලා! මම හොඳට හුස්ම නැතුව හිටියා. මට හොඳ ආලෝකයක් පෙණුනා. මට ශරීරය කැඩි කැඩී යනවා පෙණුනා. මට මේක ඇතිවෙන නැතිවෙන හැටි පෙණුනා. කාට ද මේ පෙනිලා තියෙන්නේ? මට යි. ඉතින් එයා අහනවා ඒ 'මම' සෝවාන් වෙලා ද කියලා. ඒ සක්කාය දිට්ඨිය දැන් සෝවාන් වෙලා ද කියලාත් අහනවා!

තවම පූර්ව ප්‍රතිපදාවේ නේද ඉන්නේ කියලා තේරුම්ගන්න. මේ මග නොමග තේරුම්ගන්නකම් ආර්‍ය්‍ය මාර්ගයට වැටෙන්න බැහැ.

සම්මාදිට්ඨිය ඇතිවෙන්නේ නැහැ. තවම **ඤානං පස්සං යථාභූතං** වෙලා නැහැ. ඒ නිසා ආශ්‍රවක්ෂය කරන්න බැහැ. මේ තවම බුදුදහම නෙවෙයි. ආයතනවලින් අත්දැකපු මාරයාගේ ධර්ම ටික ගැනයි ඔය කියන්නේ. විඤ්ඤාණයෙන් දැනගත්තු දෙයක් ගැන නේ ඔය කියන්නේ. ඒ මායාකාරයා කියාපු ටික ඇවිල්ලා කියනවා; මෙන්න මෙහෙම මෙහෙම අත්දැක්කා කියලා. මේ මායාකාරී විඤ්ඤාණ හයම අයිති මාරයාට යි.

ආයතන හයම ඉක්මවා යන දහමක් පෙන්නන්නයි බුදුරජාණන් වහන්සේ නමක් පහළවෙන්නේ. ආයතන හයෙන් එකකට හෝ අහුවුණා නම් අපි තවම මාරයාට අහුවෙලා. මෙච්චර කල් විදර්ශණය කියලා වැඩුවේ පූර්ව ප්‍රතිපදාවයි කියලා දුක්වෙන්න එපා. ඒ බව දැනගන්න එක ප්‍රඥාවක්.

ආර්ය මාර්ගය හොයාගන්න, ඒ ගැන තේරුම්ගන්න නම් නුවණින් විමසන්න වෙනවා. දහම නිවැරදිව තේරුම්ගත්තේ නැතිනම් වෙන්නේ මගඵල ලැබුවා කියලා රැවටිලා මාරයාට අහුවෙනවා.

ප්‍රශ්නය: අජ්ඣත්ත-බහිද්ධ කියන්නේ විඤ්ඤාණයට ද?

පිළිතුර: විඤ්ඤාණයෙන් තමයි අජ්ඣත්ත-බහිද්ධ දෙක ගැන කියන්නේ. ඇසයි-රූපයයි ගැන කියන කෙනාටයි චක්ඛු විඤ්ඤාණය කියලා කියන්නේ. අනිත් ආයතන වලටත් ඒ වගේමයි. අජ්ඣත්ත එක අන්තයක්, බහිද්ධ තව අන්තයක්, විඤ්ඤාණය මැදයි කියලා මජ්ඣෙ සූත්‍රයේ[40] දේශනා කරලා තියෙනවා. අජ්ඣත්තයක් ගැන හෝ බහිද්ධයක් ගැන කිව්වා නම් ඒ කියලා තියෙන්නේ විඤ්ඤාණයෙන්. ඔය ධර්මතාවය තේරුම්ගන්න තමයි **ඉති අජ්ඣත්තං වා කායෙ කායානුපස්සී සහ බහිද්ධා වා කායෙ කායානුපස්සී** විය යුත්තේ. අජ්ඣත්ත හෝ බහිද්ධ අරමුණකින් පටන් අරගෙන කායානුපස්සී වුණොත් ඇත්ත හඳුනාගන්න පුළුවන්. හැබැයි කායානුපස්සී වෙන්න නිකම් බැහැ. දහම අහලා තේරුම්ගන්නත් ඕන. **ඤානං පස්සං යථාභූතං** - මේ යථාභූත ස්වභාවය දන්න-දකින කෙනෙක් වෙන්න ඕන. ඒක දැනගන්න

[40] මජ්ඣෙ සූත්‍රය - අඞ්ගුත්තර නිකාය, ඡක්කනිපාතය, මහාවග්ගය.

පුළුවන් බුද්ධ දේශනාවෙන් විතරයි. ඒ නිසායි බුදුරජාණන් වහන්සේ පෙර නො ඇසූ විරූ දහමක් දේශනා කළා කියලා කියන්නේ. ඒ දහම තනිවම තමන් තුළින් අවබෝධවෙන එකක් නෙවෙයි. ඒක අපි බුදුදහමක් අහලාම දැනගත යුතුයි. ඒ නිසායි මේ දහම අහන්න ලැබෙන එක ක්ෂණ සම්පත්තියක් කියලා කියන්නේ. දහම තියෙන කාලයක මනුෂ්‍ය ජීවිතයක් ලැබුණේ නැතිනම් ඒත් දහම අවබෝධ කරගන්න බැහැ. අන්න එතැනයි බුදුකෙනෙක් ගැන ශ්‍රද්ධාව ඇතිවෙන්නේ. ඒ ශ්‍රද්ධාව ඇතිකරගන්න නම් දහම නුවණින් සොයන්න ඕන.

එතකොට අජ්ඣත්ත-බහිද්ධ දෙක ගැන දැනගත්ත පමණින්ම භාවනාව තවම පටන්ගත්තේවත් නැහැ. ඔය පූර්ව ප්‍රතිපදාවේ කොටසක් විතරයි. තවම විඤ්ඤාණයෙන් කියාපු දේ තමයි මේ අපි හොයාගෙන යන්නේ. විඤ්ඤාණයෙන් මොනවා කිව්වත් ඔතැන තියෙන්නේ අජ්ඣත්තය සහ බහිද්ධය නේද කියන තැනට නුවණ වැඩෙන්න ඕන. ඔය රූපය මොන විදියට පෙන්නුවත්, ඇවිදින, ඉඳගෙන ඉන්න, නිදගෙන ඉන්න ශරීරයක් විදියට පෙන්නුවා. මළ මිනියක් විදියට පෙන්නුවා. සතරමහාධාතුවෙන් හැදිලා කියලා පෙන්නුවා. ඇතිවුණා නැතිවුණා කියලා පෙන්නුවා. ඒවා ඕන භාවනාවකට දාගන්න. ඒ මොන විදියකට පෙන්නුවත් ඔතැන තියෙන්නේ අජ්ඣත්ත සහ බහිද්ධ දෙක විතරයි. අජ්ඣත්ත කයයි, බහිද්ධ කයයි විතරයි.

ප්‍රශ්නය: ඒ දෙකම අවිද්‍යා ප්‍රත්‍යයෙන් නේද?

පිළිතුර: ඒක හොයාගන්න ඕන. අජ්ඣත්ත සහ බහිද්ධ රූපවල ප්‍රත්‍යය දැන් හොයාගන්න වෙනවා. සමුදය හොයාගත්තොත් අවිද්‍යාව අහුවෙනවා. සමුදය සොයන්න කලින් අවිද්‍යාව අහුවෙන්නේ නැහැ. අපට අහුවෙන්නේ අජ්ඣත්ත රූපයි, බහිද්ධ රූපයි කියලා විතරයි. ඒ දෙපැත්ත කිව්වේ කවුද? විඤ්ඤාණය. විඤ්ඤාණයෙන් පෙන්වන මායාව මත දැන් අපි මුලු ලෝකයම අජ්ඣත්ත බහිද්ධ කියලා දෙපැත්තකට බෙදනවා. ඕක තමයි **ඉති රූපං** කියන අවස්ථාව. රූපස්කන්ධය කියලා බෙදාගන්නේ ඇසයි-රූපයයි, කනයි-ශබ්දයයි, නාසයයි-ගන්ධයයි, දිවයි-රසයයි, කයයි-

පොට්ඨබ්බයයි (කයේ වදින යම්කිසි ස්වභාවයක්). ඔවා තමයි රූප. ඔය ටික තමයි අජ්ඣත්ත-බහිද්ධ වෙන්නේ. අපි ඕනෑම රූපයක් ගැන දන්නවා නම් ඔය දෙකෙන් එකක් වෙන්න ඕන.

ඉති රූපං කියන අවස්ථාව හඳුනාගන්න නම්, නිකම්ම රූපයක් කියලා සංකල්පයකින් මනසේ මවාගත්තාට හරියන්නේ නැහැ. අපි රූප කියලා අදහස් කරන්නේ ඇසයි-රූපයයි, කනයි-ශබ්දයයි, නාසයයි-ගන්ධයයි, දිවයි-රසයයි, කයයි-පොට්ඨබ්බයයි බව දැනගන්න ඕන. ඔය ටිකට අහුනොවෙන රූප කිසිවක් නැහැ.

රූපස්කන්ධය පිරිසිඳ දකින වැඩ පිළිවෙල තමයි කායානුපස්සනාව. ඔය ටික අහගත්තා කියලා අපි තවම කායානුපස්සනාව වැඩුවේ නැහැ. දැන් අහලා දැනගත්තේ රූපය මොකක් ද කියලා විතරයි. **ඉති රූපං** - ඔය රූපය මොකක් ද කියලා ලෝකයට අයිති විදියට හොයාගෙන ගියහම අන්තිමට අහුවෙනවා අජ්ඣත්ත රූප සහ බහිද්ධ රූප කියලා දෙපැත්තක්. ඒ ටික සොයාගන්න තමයි අර මූලික වැඩ පිළිවෙළ (පූර්ව ප්‍රතිපදාව) පනවලා තියෙන්නේ. තමන් ඉන්න මට්ටමේ දී රූපය කියන්නේ මොකක් ද? ඔක බලාගෙන, බලාගෙන ගියහම ඔතැන තියෙන්නේ අජ්ඣත්ත රූපයි, බහිද්ධ රූපයි විතරක් බව අහුවෙනවා.

එතකොට අජ්ඣත්ත, බහිද්ධ රූප කියලා දැනගත්ත කෙනාට එතැන ඉඳන් විදර්ශණය පටන් ගන්න තියෙනවා. ඒක තමයි ලෝකයෙන් එතෙර වෙන මාර්ගය. සතිපට්ඨානයේ සෑම අනුපස්සනාවකම කියන්නේ - **ඉති අජ්ඣත්තං වා කායෙ කායානුපස්සී විහරති, බහිද්ධා වා කායෙ කායානුපස්සී විහරති** කියලායි.

අජ්ඣත්ත-බහිද්ධ හඳුනාගත්තාට පස්සේ අපට කරන්න වැඩක් තියෙනවා. ඒ තමයි ඊළඟට සමුදය සොයන එක. අපි දහම අහපු නිසායි අජ්ඣත්ත-බහිද්ධ බෙදුවේ විඤ්ඤාණයෙන් බව දැනගත්තේ. වෙන කිසිම විදියකට ඒ බව දැනගන්න බැහැ. දැන් **ඤානං** - දහම ඇහුවා කියන මට්ටමට ආවා. තවම **පස්සං** වුනේ නැහැ. බුදුදහමක් අහන්න ලැබුණොත් විතරයි ඔය බව කියන්න පුළුවන් වෙන්නේ. බුදු

කෙනෙකුට විතරයි මේ බව සර්වඥතා ඥානයට ගෝචරවෙන්නේ. ඒ නිසායි මේක පෙර නො ඇසූ විරූ දහමක් කියලා කියන්නේ.

මේ අහගත්ත, පාඩම් කරගත්ත දහම තමන් තුළින් දැක්ක දවසට; බුදු කෙනෙක් සිටියත් නැතත් ලෝකයේ පවතින ඇත්ත මේක නේ කියන නුවණක් එනවා. දහම දැක්ක දවසට ලෝකයේ යථාභූත ස්වභාවය නේද මේ දේශනා කරලා තියෙන්නේ කියන නුවණ එනවා. දහම අහපු පමණකින්ම ඒ නුවණ එන්නේ නැහැ. අහපු එකත් ලොකු දෙයක් තමයි. නිවැරදි දහම අහන්න ලැබෙන එකටත් හේතු සම්පත් තියෙන්න ඕන. ඒක පරණ පිනකට ලැබුණ අවස්ථාවක්. එතැනින් ඉදිරිට යන එක තමයි අපි දැන් කළ යුත්තේ. දැනගත්තු දෙය තමන්ගේ දැක්මක් කරගන්න ඕන. අජ්ඣත්තය එක අන්තයක්, බහිද්ධය තව අන්තයක්, විඤ්ඤාණය මැද. (මජ්ඣෙ සූත්‍රය[41]) දහම සොයාපු නිසායි මෙවැනි දහම් කරුණු අපට අහන්න ලැබෙන්නේ. මෙවැනි වැදගත් සූත්‍ර අහපු හින්දයි අපි මේ ගැඹුරු දහම් කරුණු දැනගත්තේ.

මායූපමඤ් ච විඤ්ඤාණං කියලා බුදුරජාණන් වහන්සේ විතරමයි දේශනා කරලා තියෙන්නේ. (ඵෙණපිණ්ඩූපම සූත්‍රය[42]) වෙන කිසිම ශාස්තෘන්වහන්සේ නමක් මේ විඤ්ඤාණය මායාවකට උපමා කළේ නැහැ. විඤ්ඤාණයෙන් තමයි මේ දෙපැත්තක් බෙදලා පෙන්නුවේ. ද්වයතාවයක්. දෙපැත්තකු යි, මැද යි. ඒ දෙපැත්ත හය ආකාරයකට දකින විදියක් මජ්ඣෙ සුත්‍රයේ පෙන්නනවා. 1) අතීතය එක අන්තයක්, අනාගතය එක අන්තයක්, වර්තමානය මැද යි. 2) සුඛ වේදනාව එක අන්තයක්, දුක්ඛ වේදනාව තව අන්තයක්, අදුක්ඛමසුඛ වේදනාව මැද යි. 3) නාමය එක අන්තයක්, රූපය තව අන්තයක්, විඤ්ඤාණය මැද යි. 4) අජ්ඣත්ත ආයතන එක අන්තයක්, බාහිර ආයතන තව අන්තයක්, විඤ්ඤාණය මැද යි. 5) සක්කාය එක අන්තයක්, සක්කාය සමුදය දෙවන අන්තය, සක්කාය නිරොධය මැද යි. 6) ඵස්සය එක අන්තයක්, ඵස්ස සමුදය තව අන්තයක්. ඵස්ස නිරෝධය මැද යි.

---

[41] මජ්ඣෙ සූත්‍රය - අඞ්ගුත්තර නිකාය, ඡක්කනිපාතය, මහාවග්ගය.

[42] ඵෙණපිණ්ඩූපම සූත්‍රය - සංයුත්ත නිකාය, ඛන්ධක වග්ගය, ඛන්ධ සංයුත්තය, පුප්ඵ වග්ගය.

ලෝකයා අවිද්‍යාව මත දෙපැත්තක් බෙදන හැටියි ඔය පෙන්නන්නේ. විඤ්ඤාණයෙනුයි මේ බෙදීම කරන්නේ. ලෝකය විස්තර කරපු හය ආකාරයක් තමයි ඔය සූත්‍රයෙන් පෙන්නන්නේ. සාමාන්‍ය ලෝකයේ මනසට පෙනෙන්න පුළුවන් හැටියි මේ හය ආකාරයකට විස්තර කරන්නේ. සම්මා දිට්ඨිය ඇතිවෙන්න නම්, දන්න දකින කෙනෙක් වෙන්න නම්, මේ දහම් කරුණු හොඳට තේරුම් ගන්න වෙනවා.

අජ්ඣත්ත, බහිද්ධ දෙපැත්තක් තියෙනවා කියලා දැනගත්තහම, ඒක **ඉති රූපං** කියන අවස්ථාව. දැන් ලෝකය කියන්නේ මෙහෙම දෙපැත්තක් කියලා හඳුනාගත්තා. එතකොට අජ්ඣත්ත-බහිද්ධ විදියට අපට සමහර වෙලාවට කය අහුවෙනවා. සමහර වෙලාවට වේදනාව අහුවෙනවා. සමහර වෙලාවට සිත අහුවෙනවා. සමහර වෙලාවට ධම්මා අහුවෙනවා. ඔය හැම එකකම අජ්ඣත්ත-බහිද්ධ ස්වභාවයක් තමයි තියෙන්නේ. කය, වේදනාව, චිත්ත, ධම්ම කියන හතරෙන් අපට වැඩිපුරම ප්‍රකට වෙන්නේ කය. ඒ නිසා සතරසතිපට්ඨානය වඩන කොට කායානුපස්සනාවෙන් තමයි පටන්ගන්න තියෙන්නේ. අපි මේ ඉන්න මට්ටමේ දී අපට ශරීරයක් කියලා දෙයක් තියෙනවා. ඔය ශරීරයේ තියෙන දේවල් තමයි ඇස, කන, නාසය, දිව, කය.

බුදුරජාණන් වහන්සේ දේශනා කරලා තියෙනවා සතරසතිපට්ඨානය ඒකායන මාර්ගය කියලා. කොහේ ගිහින් හෙව්වත් වෙන කෙටි පාරවල් නම් ලැබෙන්න විදියක් නැහැ. සතර සතිපට්ඨානය වඩන්නේ නැත්නම් බුදුදහම අනුගමනය කරනවා කියලා කියන්න බැහැ. ඒ නිසා මේ දුර්ලභ දහම අහන්න ලැබුණ වෙලාවේ අපි ඔන්න ඔතැනින් විමසන්න පටන්ගන්න ඕන. නැතිනම් අපරාදේ නිකම් ක්ෂණ සම්පත්තිය, කාලය නාස්ති කරගන්නවා. කයේ **සමුදයධම්මානුපස්සී** වීම තුළින් තමයි කායානුපස්සනාව පටන්ගන්න තියෙන්නේ. මේක තමයි බුද්ධ දේශනාව. සතිපට්ඨාන සූත්‍රය[43] කියවලා බලන්න.

[43] මහා සතිපට්ඨාන සූත්‍රය - දීඝනිකාය, මහාවග්ගය

කය කියන්නේ මොකක් ද කියලා මනාව සොයාගන්නයි අපි පූර්ව ප්‍රතිපදාව පුරුදු කළේ. ඒ සඳහා කායානුපස්සනාවේ ඕනෑම කමටහණකින් පටන්ගන්න පුළුවන්. එතකොට කයක් අහුවෙයි. ආනාපානසතිය වැඩුවොත් හුස්ම කය අහුවෙයි. අනික් කමහටනක් වැඩුවත් කොහෙන් හරි කයක් අහුවෙයි. ඒ අහුවුණු කයේ තවත් විස්තර බැලුවොත්, ඔතැන තියෙන්නේ අජ්ඣත්ත-බහිද්ධ ස්වභාවය විතරයි කියලත් පෙනෙයි. ඔන්න ඔය තැනට ආවොත් **ඉති රූපං** - රූපය හඳුනාගත්තා වෙනවා.

ඊළඟට ඒ රූපයේ සමුදය (හටගත්තේ කොහොමද කියලා) සොයාගන්න වෙනවා. හේතු-ප්‍රත්‍ය ටිකත් අපට බුද්ධ දේශනාව උදවු කරගෙනමයි හොයන්න වෙන්නේ. බුදුරජාණන් වහන්සේ අපට බොහෝම උදව් කරලා තියෙනවා. අසූහාරදහසක ධම්ස්කන්ධයක් තියෙනවා අපට ඕක සොයාගන්න. බුදුරජාණන් වහන්සේ අපට අමුතුවෙන් සොයන්න දෙයක් ඉතුරු කරලා නැහැ.

අවිද්‍යා-කම්-තණ්හා-ආහාර තමයි රූපයේ සමුදය හැටියට දේශනාවල පෙන්නලා තියෙන්නේ. මෙහෙම කිව්වාට අපට මේ කරුණු තවම වචන ටිකක් විතරයි. අපි හොඳට නුවණින් පරීක්ෂණය කරලා මේවා සොයාගන්න ඕන. අජ්ඣත්ත ආයතනවල සහ බහිද්ධ ආයතනවල අවිද්‍යා-කම්-තණ්හා-ආහාර යෙදෙන්නේ කොහොම ද කියලා සමුදය සොයන්න ඕන. ඕනෑම ආයතනයකින් ඒ පරීක්ෂණය පටන්ගන්න පුළුවන්.

ප්‍රශ්නය: ශබ්දය සහ කන විදර්ශනා කරන්නේ කොහොමද?

පිළිතුර: ඒ දෙක ගැනම කායානුපස්සනාව වඩන්න ඕන. ඇසීමට අදාළව තියෙන අජ්ඣත්ත-බහිද්ධ ආයතන දෙක තමයි ශබ්දයයි, කනයි. එතකොට ශබ්දය හටගත්තේ කොහොම ද? කන හටගත්තේ කොහොම ද? කියලා අපි සෙවිය යුතුයි. නමුත් ඒවා සොයන්න කලින් ශබ්දය කියන්නේ මොකක් ද, කන කියන්නේ මොකක් ද කියන එක අපි සොයාගෙන තියෙන්න ඕන. ඒ තමයි **ඉති රූපං** අවස්ථාව. අපි ශබ්දය හෝ කන කියලා අදහස් කරන්නේ මොකක් ද කියන තැනින් පටන්ගන්න ඕන. ශබ්දය කියන්නේ මොකක් ද කියලා

වෙන කාගෙන්වත් අහලා හරියන්නේ නැහැ. තමන්ට තියෙන මේ අජ්ඣත්ත-බහිද්ධ දෙකෙන් තමයි පරීක්ෂණය පටන්ගන්න ඕන. දැන් තමන් ශබ්දය කියලා මොකක් ගැන හෝ හිතනවා නේ. ඒ මොකක් ද කියලා හඳුනාගන්න තමයි කායානුපස්සනාවේ මුල කොටස තියෙන්නේ. ශබ්දයක් තියෙනවා නම් ඒ ශබ්දයේ ලක්ෂණ ටික සොයාගන්න ඕන. මොකකින් ද ශබ්දයක් පනවන්නේ? ශබ්දයේ තියෙන ලක්ෂණ මොන වාගේ ද? ඔය ශබ්දය කොහේ ද තියෙන්නේ? තමන් තුළ ද, එළියේ ද තියෙන්නේ? කියලා විමසන්න ඕන. එතකොට ශබ්දය තියෙන්නේ එළියේ බව පෙනෙනවා. කනට ඇහෙන ශබ්දය, අපි පිලිගන්න ශබ්දය, එළියෙන් ඇවිල්ලා කනේ වදින්න ඕන කියලා තමයි අපි පිලිඅරගෙන තියෙන්නේ. ඒ ආකාරයට මුලින්ම තමන් ඉන්න තැනින් පටන්ගන්න. කවුරුවත් එහෙම නෙවෙයි කිව්වාට එහෙම පටන්ගන්න යන්න එපා. තමන් ශබ්දය කියලා අදහස් කරන්නේ කුමකට ද කියන තැනින් පටන්ගන්න. එතකොට ශබ්දය කනේ වදින්න නම් එළියෙන් එන්න ඕන කියලායි අපි මූලිකව හිතන්නේ. එහෙනම් කන අජ්ඣත්තයි, ශබ්දය බහිද්ධයි. එතකොට ශබ්දයක් කියලා අපි කතා කළොත් ඒක බාහිර දෙයක්. ඒ වගේම කන කියලා කතා කළොත් ඒක අජ්ඣත්තයි. මේ ශරීරයට අයිති දෙයක්. අපි පටන්ගන්නේ ඔතනින්. එතැනින් පටන්ගෙන දහම තවදුරටත් විමසන්න ඕන.

එළියේ තියෙන ශබ්දය කියලා අපි දැනගත්තේ මොන වාගේ ගතියක් ද? ඇතිවුණා, නැතිවුණා කියන්නේ ඒ ශබ්දයේ එක්තරා ලක්ෂණයක්. ඒ ආකාරයටත් බලන්න ඕන. පෙර නො තිබීම හටගත්තා, ඉතුරු නැතුවම නිරුද්ධවුණා කියන්නේ ශබ්දයේ තව ලක්ෂණයක්. කන ගැනත් ඒ ලක්ෂණ ටිකම කියන්න පුළුවන්. **අහුඤ්ඣා සමහූතං, හුඤ්ඣා න භවිස්සති** කියන්නෙත් බුද්ධ දේශනාවක්. අජ්ඣත්ත-බහිද්ධ දෙක තවත් හොඳට තහවුරු කරගන්නයි මෙහෙම විමසන්නේ. මේ වාගේ දෙයකට තමයි අජ්ඣත්ත-බහිද්ධ කියලා කිව්වේ කියලා. **ඉති රූපං** කියන පැත්තයි තවමත් මේ බලන්නේ. ඔය ශබ්දය ඇතිවෙන්නේ එළියේ තියෙන ධාතු-ධාතු ගැටීම නිසා කියලාත් අපි සොයාගන්නවා. ඒකත් ඇත්තක් තමයි. ශබ්දයක් තියෙන්න නම් මොනවා හරි ගැටෙන්නත් ඕන. ඒකත් ඇත්තක්. ඒකත් ශබ්දය

ඇතිවෙන්න එක්තරා හේතුවක්. ඒ සියළුම සමුදයන් ලෝකයට අයිතියි. ගැටෙන දේවල් තියෙන්නේ බාහිරයේ. එතකොට සමුදය හොයලා තියෙන්නේ බාහිරයෙන් මිසක් තමන් තුළින් නොවන බවත් තේරුම් ගන්න.

නවීන විද්‍යාවෙන් සොයන හැම දෙයකම සමුදය තියෙන්නේ එළියේ. ශබ්දයක් හටගත්තේ කොහොම ද කියලා ඇහුවොත් කම්පණ වලින් කියලා කියයි. ඒ ඔක්කෝම තියෙන්නේ එළියේ නිසා ඒක ලෝකයට අයිති සමුදයක් පමණයි.

ලෝකෝත්තර දහම හොයන අයට ලෝකයට අයිති සමුදයෙන් වැඩක් නැහැ. ලෝකයෙන් එතෙරවෙන්න නම් සමුදය තමන් තුළින් සොයාගන්න වෙනවා. (රොහිතස්ස සූත්‍රය[44]) එහෙනම් දැන් කරන්න තියෙන පළමුවෙනි දෙය තමයි ශබ්දයක් තියෙනවා කියලා දැනගත්තේ කොහොමද කියලා හොයාගන්න එක. ඇසුන නිසා තමයි අපි ශබ්දයක් ගැන දැනගත්තේ. ඇසෙන මොහොතේ තමයි යම්කිසි ශබ්දයක් තිබුණා නම් තිබුණේ. ඒක ගැන තව ටිකක් නුවණින් විමසුවොත්; ඇසෙන්න ටිකකට කලින් තිබුණෙත් නැහැ. ඊට පස්සේ තිබුණෙත් නැහැ. පෙර නො තිබීම හටගත්තා, ඉතුරු නැතිවම නිරුද්ධවුණා කියන ඒ නුවණත් ඕන. එහෙනම් අතීතය ගැන බැලුවාට ඔය ශබ්දය ගැන හොයාගන්න බැහැ. අනාගතය බලන්න ගියත් ඔය ශබ්දය ගැන හොයාගන්න බැහැ. සොයනවා නම් සොයන්න තියෙන්නේ වර්තමාණයේ යි, පච්චුප්පන්න මොහොතේ යි. **අතීතං නාන්වාගමෙය්‍ය නප්පටිකඞ්ඛෙ අනාගතං, පච්චුප්පන්නඤ්ච යො ධම්මං තත්‍ර තත්‍ර විපස්සති** කියලාත් දහමේ දේශනා කරලා තියෙනවා. අතීතය ගැන සොයලා වැඩක් නැහැ. අනාගතය ගැන සොයලාත් වැඩක් නැහැ. ඇත්ත දැනගන්න නම් මේ මොහොතේ විදර්ශනය කරන්න ඕන. භද්දෙකරත්ත සූත්‍රයේ[45] ඒ බව සඳහන් වෙනවා.

ප්‍රශ්නය: මේවා කරන්න ශූන්‍යාගාරයකටම යන්න ඕන ද?

---

[44] රොහිතස්ස සූත්‍රය - සංයුත්ත නිකාය, සගාථවග්ගය, දෙවපුත්තසංයුත්තය, නානාතිත්ථීය වග්ගය.

[45] භද්දෙකරත්ත සූත්‍රය - මජ්ඣිමනිකාය, උපරිපණ්ණාසකය, විභඞ්ගවග්ගය.

පිළිතුර: ඒකත් එක්තරා දෘෂ්ටියක්. ඕනෑ තැනක ඉඳගෙන දහම නුවණින් විමසන්න පුළුවන්. **ආතාපි, සම්පජානො සතිමා** - වීර්යයි, නුවණයි, සතියයි තමයි ඕන වෙන්නේ. අපි බොහොම ප්‍රවේසමින් දහම විමසිය යුතුයි. අපි නොයෙකුත් හේතු දැගන්නවා; 'අනේ ඕවා අපට බැහැ, අපට ශූණ්‍යාගාර නැහැ, අපට ගෙදර හුඟක් වැඩ තියෙනවා, මේක අපට නෙවෙයි තියෙන්නේ අනික් අයටයි' - ඔහොම කිය කියා තමයි අපි මෙච්චර කල් සංසාරයේ ආවේ. අපට බුදුවරු අනන්ත හම්බවෙන්න ඇති නමුත් හැමදම ඔහොම කිය කියා ඉන්නත් ඇති මේ ක්ෂණ සම්පත්තියෙන් ප්‍රයෝජන ගන්නේ නැතුව.

ඒ නිසා දැන්වත් දහම දකින පැත්තට යොමුවෙන්න උත්සාහ කරන්න. අපට නිර්මල බුදුදහම ලැබිලා තියෙනවා. ක්ෂණ සම්පත්තියත් ලැබිලා තියෙනවා. වෙන මොනවාද ඕන? කොච්චර අමාරුවෙන් ද ඔය දෙක ලැබිලා තියෙන්නේ? ඒත් අපි මාර්ගය වඩන්නේ නැතුව නොයෙකුත් හේතු කිය කියා ඉන්නවා. 'අනේ අපට නම් ඕකෙන් ප්‍රයෝජන ගන්න බැහැ' කියලා. ඒකත් මාරයාගේ ධර්මයක්ම තමයි. බුදුදහම කෙරෙහි ශ්‍රද්ධාව ඇතිකරගෙන නිවැරදි මග වඩන්න දැන්වත් පටන්ගන්න.

අපි නැවතත් ශබ්දය ගැන විමසීමට යොමුවෙමු; මේ ශබ්දය පෙර නො තිබීම හටගෙන ඉතුරු නැතුවම නිරුද්ධවුණා කියලා දැක්කායින් පස්සේ; අතීත ශබ්ද ගැන සොයලා වැඩකුත් නැහැ, අනාගත ශබ්ද ගැන සොයලා වැඩකුත් නැහැ කියලා නුවණක් එනවා. ඒ නිසායි ඒ ආකාරයට දහම විමසීමත් වැදගත් වෙන්නේ. ඒක ලෝකයට අයිති නුවණක් වුණාට ඒ කරුණුත් උදව්වෙනවා. ලෝකයේ ඉඳන් ලෝකයෙන් එතෙර වෙන මාර්ගය වෙතට යන්නයි අපි මේ උත්සාහ කරන්නේ.

කන නිසා තමයි ශබ්දය ඇතිවුණා-නැතිවුණා කියලා අපි මුලින්ම දැනගත්තේ. එතන තවම ලෝකයට අයිති දැක්මක්, නමුත් ඒකට කමක් නැහැ. මාරයාට අයිති තැනින් පටන් අරගෙන අපට මාරයාගෙන් මිදෙන තැන දක්වා යන්න තියෙනවා. එතකොට ඒ ඇහෙන වෙලාවේ විතරයි ඇතිවුණා නැතිවුණා කියලා දැනගත්තේ. එහෙනම් ඊට කලින් සිදුවීම් විමසලා වැඩකුත් නැහැ. ඊට පස්සේ

සිදුවීම් විමසලා වැඩකුත් නැහැ කියන නුවණත් එතන යෙදෙන්න ඕන. ඒ බවත් අපි සොයාගත්තේ බුදුදහමෙන්ම යි.

එහෙනම් දැන් අපට කරන්න වැඩක් තියෙනවා. **පච්චුප්පන්නඤ්ච යො ධම්මං තත්ථ තත්ථ විපස්සති** වෙන්න තියනවා. ඒකත් අපි බුදුරජාණන් වහන්සේගෙන්මයි අහගත්තේ. දහමක් අහන්න ලැබුණ නිසායි අපි ඔය ටික හරි දැනගත්තේ. මේ පච්චුප්පන්න වුණ මොහොතේ තමයි විපස්සනා කරන්න ඕන. විපස්සති කියන කොට බුදුරජාණන් වහන්සේ දේශනා කළ ඒකායන මාර්ගය වන සතරසතිපට්ඨානය වඩන්න වෙනවා. වෙන මාර්ග නැහැ.

එහෙනම් ඔය ඇසුණ ක්ෂණයේ අපට ශබ්දයකුත් තිබුණා, කනකුත් තිබුණා. ඔය ක්ෂණය කිව්වේ ඇසුණ මොහොතටයි. කන තිබුණ හින්ද තමයි ඇසුණේ, ශබ්දය තිබුණ හින්ද තමයි ඇසුණේ කියන තැනිත් තමයි පටන්ගන්න තියෙන්නේ. කනයි-ශබ්දයයි නිසා සෝත විඤ්ඤාණය හටගත්තා. කනයි-ශබ්දයයි තිබුන නිසායි සෝත විඤ්ඤාණයට අජ්ඣත්ත-බහිද්ධ කියලා දෙපැත්තක් බෙදන්න පුළුවන් වුනේ. වර්තමානයේ ඉපදුණ කන-ශබ්දය-සොත විඤ්ඤාණය කියන තුනේ එකතුවට ස්පර්ශය කියනවා - **තිණ්ණං සංඝති ඵස්සො.** විඤ්ඤාණය කනයි-ශබ්දයයි කියලා දෙපැත්තක් බෙදලා මැද්දෙන් ඉන්නවා. ඇසුණ මොහොතේ දී අජ්ඣත්ත කන එක අන්තයක්, බහිද්ධ ශබ්දය දෙවැනි අන්තය, විඤ්ඤාණය මැදයි. මේ සිද්ධිය වුණේ ඒ ක්ෂණයේ යි. ඊට කලිනුත් නෙවෙයි, පසුවත් නෙවෙයි.

දැන් මේ අවස්ථාවේ දී අපි මාරයාටත් අහුවෙලා, ලෝකයටත් අහුවෙලා. එහෙනම් එතෙරවෙන මාර්ගය පටන්ගන්න තියෙන තැන ඔතැන යි. **පච්චුප්පන්නඤ්ච යො ධම්මං තත්ථ තත්ථ විපස්සති** විය යුතු තැන. දැන් අපි අජ්ඣත්ත රූපයත් හඳුනාගත්තා, බහිද්ධ රූපයත් හඳුනාගත්තා - ඒ තමයි **ඉති රූපං** කියන අවස්ථාව. කනත් රූපයක්, ශබ්දයත් රූපයක්. ඒ රූපවල ලක්ෂණ ටිකත් හඳුනාගත්තා - අතීතයේ තිබුණේ නැහැ, අනාගතයේත් නැහැ, මේ ක්ෂණයේ හටගත්තා කියලා.

දැන් අපි විදර්ශනාව පටන්ගන්න ඕන. විපස්සනාවේ දී, රූපයක් තියෙනවා නම් ඊළඟට ඒකේ සමුදය සොයන්න කියලා දේශනා කරලා තියෙනවා. **ඉති රූපස්ස සමුදයො** කියන අවස්ථාව. කායානුපස්සනාවේ දී අජ්ඣත්ත-බහිද්ධ රූප තියෙනවා නම් ඒවායේ සමුදය ධම්මානුපස්සී වෙන්න වෙනවා. එහෙම කළොත් අපට රූපයේ ඇත්ත අහුවේවි. ඉන් මෙහා යථාභූත ස්වභාවය අහුවෙන්නේ නැහැ. දැන් අපට කනකුයි-ශබ්දයකුයි ඇසුරුවුණා නේ. ඒ ඇසුරුවුණ කනෙනුයි, ශබ්දයෙනුයි විදර්ශණාව පටන්ගන්න ඕන. ඇසුරුවුණා කියන්නේ නිශ්‍රිතයි. කනත් ඇසුරු කළා. ශබ්දයත් ඇසුරු කළා. ඇසුරු කළ නිසායි ඕවා ඇතිවෙලා නැතිවුණා කියලා දැනගත්තේ. එතකොට විඤ්ඤාණයත් වැඩ කළා, කන මගේ පැත්තේ, ශබ්දය එළියේ කියලා දෙපැත්තක් බෙදුවා.

ප්‍රශ්නය: ඔතන උපාදානයත් තියෙනවා ද?

පිළිතුර: උපාදානයත් වෙලා ඉවරයි. කෙටියෙන්ම කිව්වොත් ලෝකය හැදිලා. දුක සකස්වෙලා. මාරයා ඉන්නවා. සත්ත්වයා ඉන්නවා. (සමිද්ධි දුක්ඛපඤ්හ, මාරපඤ්හ, ලොකපඤ්හ, සත්තපඤ්හ සූත්‍ර[46]) එතැනින් තමයි අපි පටන්ගන්න ඕන. අපි ඉන්නේ එතැන නේ. එතැනින් පටන් අරගෙන බුදුරජාණන් වහන්සේ දේශනා කරලා තියෙන ඒකායන මාර්ගයට අනුව විදර්ශණය කරන්න ඕන.

ප්‍රශ්නය: ආයතන හයටම ඔහොම බලන්න ඕන ද?

පිළිතුරක්: ආයතන හය ගැනම හොයන්න ඉස්සෙල්ලා එකක් ගැන හොඳට විමසලා බලන්න. කනයි-ශබ්දයයි අරගෙන බලන එක ටිකක් පහසුයි කියලායි මට හිතෙන්නේ. ආයතන හයටම ඕක තමයි කරන්න තියෙන්නේ. එකක් තේරුම් ගත්තොත් අනික් ඒවාත් එහෙමම තමයි.

දැන් අපට අජ්ඣත්ත ආයතනයත් තියෙනවා, බහිද්ධ ආයතනයත් තියෙනවා. නමුත් අපි නො කරපු දෙය තමයි ඒ දෙකේ විදර්ශණය

[46] සමිද්ධි දුක්ඛපඤ්හ, මාරපඤ්හ, ලොකපඤ්හ, සත්තපඤ්හ සූත්‍ර - සංයුත්ත නිකාය, සළායතන වග්ගය, වෙදනා සංයුත්තය, මිගජාල වග්ගය.

වැඩීම. දැන් **ඉති රූපං** කියන තැනට ඇවිල්ලා තියෙන්නේ. ඒ රූපයේ ලක්ෂණ ටිකත් දන්නවා. රූපය කලින් තිබුණෙත් නැහැ. අනාගතයෙත් නැහැ. එහෙනම් පච්චුප්පන්න මොහොතේ තමයි විදර්ශණය කරන්න ඕන. විඤ්ඤාණයෙන් දෙපැත්තක් බෙදලා තියෙනවා කියලා දහමෙන් ඉගෙන ගත්ත ටිකත් තියෙනවා. ඒ **ඤානං** කියන මට්ටම. දැන් දැනුම තියෙනවා. **පස්සං** කියන දහම දකින මට්ටම තමයි තවම නැත්තේ. **තඤ්ච තඤ්ච විපස්සති** කරන්න නම් **ඤානං පස්සං යථාභූතං** වෙන්න ඕන. අපට ඕනෑ විදියට විපස්සනා කරලා හරියන්නේ නැහැ.

එහෙනම් දැන් මේ අජ්ඣත්ත, බහිද්ධ දෙකේම **සමුදය ධම්මානුපස්සී** වෙන්න ඕන. එතකොට එන අවබෝධය තුළ අවිද්‍යා ප්‍රත්‍යයෙන්, කම්‍ ප්‍රත්‍යයෙන්, තණ්හා ප්‍රත්‍යයෙන්, ආහාර ප්‍රත්‍යයෙන් කියලා විස්තර කරන ටික තේරෙන්න ඕන. ඊළඟට විදර්ශණා කරන කොටයි මේවා සංඛතයි, පටිච්චසමුප්පන්නයි, අවිද්‍යා ප්‍රත්‍යයෙන් කියලා තේරුම් ගන්න පුළුවන් වෙන්නේ. අහපු දහම තමන්ගේ දැක්මක් වෙන්න ඕන. අපට තවම ඒ දැක්ම නැහැ. අවිද්‍යා ප්‍රත්‍යයෙන් මේ මොහොතේ හටගත්තා කියන දැක්ම නැහැ.

ප්‍රශ්නය: අපි වචන ටික විතරයි නේද දන්නේ?

පිළිතුර: කිසිම දෙයක් විමසන්නේ නැතුව ඉන්නවාට වඩා ඒ වචන ටික දැනගැනීමත් වටිනවා. ඊළඟට ඒ දැනගත්ත දෙය අපි දකින්න උත්සාහ කරන්න ඕන. බුදුරජාණන් වහන්සේ දේශනා කළ පමණින්ම ඒක තමන්ගේ අවබෝධය වුණේ නැහැ. ක්ෂණ සම්පත්තිය ලැබුණ නිසායි දැනගත්තේ. ඒක ලැබුණේ නැත්නම් මෙහෙම දෙයක් තියෙනවා කියලා දැනගන්නත් බැහැ. ඒ නිසා දැනගත්ත දෙය දැක්මක් කරගන්න උත්සාහ කරන්න ඕන.

එහෙනම් දැන් ඔය ශබ්දය ගැනයි, කන ගැනයි අපි දන්න මට්ටමෙන් පටන් ගන්න. කන සහ ශබ්දය කියන කොට යම්කිසි ස්වභාවයක්, යම්කිසි ලක්ෂණ ටිකක් අපට මතක් වෙනවා. ඒ ගැනයි මේ සොයන්නේ. ඒ ලක්ෂණ දැනගන්න තමයි අපි පූර්ව ප්‍රතිපදාව වඩන්නේ. **ඉති රූපං** කියන අවස්ථාව. ඊළඟට ඒ රූපය විදර්ශණා කරන්න ඕන.

ඒ රූපය හටගත්තේ කොහොම ද කියලා විමසන්න ඕන. **සමුදය ධම්මානුපස්සී** වෙන්න ඕන.

එතකොට දැන් ඔන්න අපට ඇසුණ ක්ෂණයට යන්න වෙනවා. ඇසුණා කියන කොට සළායතන පැත්තෙන් විමසුවොත් එතන සෝතායතනය විතරයි වැඩ කළේ. වෙන එක ආයතනයක්වත් ඇසීමට සම්බන්ධ නැහැ. ඊළඟට සෝතායතනයට කරන්න පුළුවන් කෘත්‍ය මොකක්ද කියලාත් දහමේ සඳහන් වෙනවා. **දිට්ඨ-සුත-මුත-විඤ්ඤාත** හතරෙන් **සුත** - ඇසීම විතරයි සෝතායතනයට කරන්න පුළුවන් කෘත්‍ය.

සුත කියන්නේ ඇසීම කියන ක්‍රියාව විතරයි. ඇසීම කියන්නේ කනත් නෙවෙයි, ශබ්දයත් නෙවෙයි. ඇසීම කියන්නේ ක්‍රියාවක්. කන කියන්නේ රූපයක්. ශබ්දය කියන්නෙත් රූපයක්. දැන් ඇසීම ඇසීම විතරක් වුණා නම් අපට රූපයක් ගැන කතාකරන්න බැහැ. ක්‍රියාව ක්‍රියාවක් විතරක් වුණා නම් රූප ගැන කතාකරන්න බැහැ. ඇසීම ඇසීමක් නොවුණ නිසායි අපි කනක් සහ ශබ්දයක් පනවා ගත්තේ. ඇසීම ඇසීමෙන් නතරවුණේ නැහැ. රූප ටිකක් පනවාගෙන ඒවා ගැන කතා කරනවා.

තවත් ඉදිරියට ගැඹුරෙන් විමසගෙන යනකොට - මේ මොහොතේ ඇසෙන නිසායි කනක් තියෙන බව දැනගත්තේ. මේ මොහොතේ ඇසෙන්නේ නැති නම් කනක් තියෙනවා කියන එකට තේරුම් නැහැ. එහෙම කිව්වොත් ඒක බොරුවක් නේද? ඇසීමේ කෘත්‍ය වෙනවා නම් විතරයි කනක් තියෙනවා කියලා කියන්න පුළුවන්. ඒ වගේම ශබ්දයක් තියෙනවා කියලා දැනගත්තේ, ඒත් ඇසෙන හින්දයි. ඇසුණේ නැතිනම් ශබ්දය ගැන කතා කරන්නත් බැහැ. එතකොට අපි මඤ්ඤණා දෙකකට ගිය බව නුවණින් දකින්න ඕන. අපි කනක් සහ ශබ්දයක් මඤ්ඤණා කරලා තියෙනවා.

තථාගතයෝ එහෙම මඤ්ඤණා කරන්නේ නැහැ කියලා කාළකාරාම සූත්‍රයේ[47] දේශනා කරනවා. ඇසීමෙන් වෙන් වූ ඇසිය යුතු දෙයක් නො හඟී. (**න මඤ්ඤති** කියන්නේ නො හඟී.) නො ඇසූවක් නො

[47] කාළකාරාම සූත්‍රය - අඞ්ගුත්තර නිකාය, චතුක්ක නිපාතය, උරුවෙලවග්ගය.

හඟී. ඇසිය යුත්තක් නොා හඟී. අසන්නෙක් නොා හඟී. ඇසිය යුත්තක් කියන එක යි, අසන්නෙක් කියන එකයි දෙක ම හඟින්නේ නැහැ. ඒ කියන්නේ මඤ්ඤණා වෙන්නේ නැහැ. **න මඤ්ඤති** මට්ටම. අපට අහන දෙයක් සහ අහන කෙනා ඉන්නවා. ඇසීමේ ක්‍රියාවට අමතරව අපට අජ්ඣත්ත, බහිද්ධ දෙකක් තියෙනවා.

එතකොට ඒ දෙකම ඇසීම ඇසීම බව නොදන්නාකම නිසා, ඒ කියන්නේ අවිද්‍යා ප්‍රත්‍යයෙනුයි හටගෙන තියෙන්නේ කියලා තේරුම්ගන්න. ප්‍රත්‍ය වෙනවා කියන්නේ උදව් වෙනවා. අවිද්‍යාව නමැති ප්‍රත්‍ය යෙදුනේ නැතිනම්, අවිද්‍යාව නිසා හටගන්න ටික තියෙන්න බැහැ නේද? හේතු නැතිනම් ඵලය හටගන්න විදියක් නැහැ. එතකොට අප තුළයි අවිද්‍යාව ප්‍රත්‍යවෙලා තියෙන්නේ. රහතන් වහන්සේ තුළ අවිද්‍යාව ප්‍රත්‍ය වෙන්නේ නැහැ. රහත්වුණා කියන්නේ අවිද්‍යාව ඉතුරු නැතුව නිරෝධයි. අවිද්‍යා ප්‍රත්‍යයෙන් උපදින කිසිම දෙයක් අවිද්‍යාව නොා යෙදෙන මනසක උපදින්න විදියක් නැති බව හොඳට තේරුම් ගන්න.

බුදුරජාණන් වහන්සේ බාහිය දරුචීරියට[48] සහ මාලුඞ්ක්‍යපුත්ත[49] ස්වාමීන් වහන්සේට, ඇසීම ඇසීමක් පමණයි - **සුතෙ සුතමත්තං** විදියට හික්මෙන්න කියලා දේශනා කළා. හැබැයි එහෙම හික්මෙන්න නම් අජ්ඣත්ත බහිද්ධ ආයතන වල සමුදය සොයාගෙන තියෙන්න ඕන. කන සහ ශබ්දය හටගත්තේ අවිද්‍යා ප්‍රත්‍යයෙන් කියලා දකින්න ඕන. අවිද්‍යා ප්‍රත්‍යයෙන් කියන්නේ; ඇසීම ඇසීම බව නොා දන්නාකමට කන සහ ශබ්දය පනවාගෙන තියෙනවා. අජ්ඣත්ත-බහිද්ධ තියෙනවා කියලා කියන්නේ විඤ්ඤණයෙන්. ඒක විඤ්ඤණය කරපු මායාවක්. අවිද්‍යාව තියෙනකම් විතරයි විඤ්ඤණයට අජ්ඣත්ත-බහිද්ධ දර්ශණය කරන්න පුළුවන් වෙන්නේ. අවිද්‍යාව යෙදුණේ නැතිනම් විඤ්ඤණයට දර්ශණය කරන්න දෙයක්

[48] බාහිය සූත්‍රය - බුද්දක නිකාය, උදානපාළි, බොධිවග්ගය.

[49] මාලුඞ්ක්‍යපුත්ත සූත්‍රය - සංයුත්ත නිකාය, සළායතන වග්ගය, වෙදනා සංයුත්තය, ඡලවග්ගය

නැහැ. **විඤ්ඤාණං අනිදස්සනං** කියලා කෙවඩ්ඩ සූත්‍රයේ[50] දේශනා කරලා තියෙන්නේ අන්න ඒ අවස්ථාවයි.

විඤ්ඤාණං අනිදස්සනං අනන්තං සබ්බතෝ පභං.
එත්ථ ආපෝ ච පථවී තෙජෝ වායෝ න ගාධති.
එත්ථ දීඝඤ්ච රස්සඤ්ච අණුං ථූලං සුභාසුභං
එත්ථ නාමඤ්ච රූපඤ්ච අසෙසං උපරුජ්ඣති
විඤ්ඤාණස්ස නිරොධෙන එත්ථෙතං උපරුජ්ඣතීති.

එතැන ආපෝ-පථවී-තේජෝ-වායෝ පිහිටන්නේ නැහැ. පිහිටන්නේ නැහැ කියන්නේ ඒවා ගැන කතාකරන්නවත් බැහැ. ඒකෙදි දිග-කොට-මහත-හීනි සුභ-අසුභ කතාවක් නැහැ. නාම-රූපත් ශේෂයක් නැතුවම කපා හැරලා - **අසෙසං උපරුජ්ඣති**. නාමය එක අන්තයක්, රූපය එක අන්තයක් කියලා අපි මජ්ඣෙ සූත්‍රයේ[51] අහලා තියෙනවා නේ. **විඤ්ඤාණං අනිදස්සනං** අවස්ථාවේ දී ඔය සියල්ලක්ම කපා හැරලා තියෙනවා. විඤ්ඤාණයට දර්ශණය කරන්න කිසිම දෙයක් උපදින්නේ නැහැ. අවිද්‍යාව ශේෂයක්වත් ඉතුරු නැති මනසක් ගැනයි ඒ විස්තර වෙන්නේ.

දැන් අපි කලින් කතා කරපු **තිණ්ණං සංඝති එස්සෝ** කියපු තැන, අර ක්ෂණය තුළ ඔය සේරම තියෙනවා. 'ඇසීම ඇසීමක් පමණයි' ලෙස හික්මුණේ නැති නිසා තමයි එහෙම වුණේ. **විඤ්ඤාණං අනිදස්සනං** කියන තැන තේරුම් ගත්තොත් **දිට්ඨෙ දිට්ඨමත්තං, සුතෙ සුතමත්තං, මුතෙ මුතමත්තං, විඤ්ඤාතෙ විඤ්ඤාතමත්තං** විදිහට හික්මෙන්න පටන්ගන්න පුළුවන්. බුදුරජාණන් වහන්සේ බාහිය දරුවීරියට දේශනා කරනවා 'බාහිය ඔබ මෙසේ හික්මුණොත් එවිට බාහිය ඔබ එහි නොපිහිටයි. එයින් නො පිහිටන්නේ එහිත් නෙවෙයි, මෙහිත් නෙවෙයි, ඔය දෙක අතරත් නෙවෙයි' කියලා. එතකොට සක්කායදිට්ඨියට පිහිටන්න තැනක් නැතිවෙනවා.

[50] කෙවඩ්ඪ සූත්‍රය - දීඝනිකාය, සීලක්ඛන්ධ වග්ගය.
[51] මජ්ඣෙ සූත්‍රය - අඞ්ගුත්තර නිකාය, ඡක්ක නිපාතය, මහාවග්ගය.

දැනගත්තු කෙනෙක් ගැන දැන් කතාකරන්න බැරිවෙනවා. දැනගත්තු දෙයක් තිබුණොත් තමයි දැනගත්තු කෙනා ඉන්නේ. දැනගත්තු ස්වභාවයක් යෙදෙන්නේ නැතිනම් 'මම දැනගත්තා' කියන්න බැහැ.

බුද්ධ දේශනාව අපි ප්‍රඥාවෙන් තේරුම්ගන්න ඕන. එතකොට තමන්ට මාර්ගය වරදින්නේ නැහැ. අපි මේ සාකච්ඡා තුළින් මාර්ගය ගැන කිසිවක් කිව්වේ නැහැ. බුද්ධ දේශනාව මොන වාගේ එකක් ද කියන එක විතරයි අපි මේ සාකච්ඡා කරන්නේ. නුවණ තියෙන කෙනාට මාර්ගයයි, මාර්ගය නොවෙන්නේ මොකක්ද කියලායි තේරුම්ගන්න මේ සාකච්ඡා උපකාරී වෙයි කියලා අපි හිතනවා. බුදුකෙනෙක් දේශනා කරන මාර්ගයට වෙනස් මාර්ගයක් කවුරු හරි කිව්වොත් තමන්ට ඒක හඳුනගන්න පුළුවන් වෙන්න ඕන. ඔය කියන්නේ ලෝකයට අයිති කතාවක් ද, ලෝකයෙන් එතෙරවෙන මාර්ගයක් ද කියලා දකින්න තමන් දක්ෂ වෙන්න ඕන.

ප්‍රශ්නය: ආයතන ඉක්මවා යන්නේ කොහොම ද?

පිළිතුර: ආයතනවලට අහුවුණොත් ලෝකයට අහුවුණා. මාරයාට අහුවුණා. එතකොට අපි මේ ආයතන වලින් කියන දෙයක් ද විදර්ශණය කියලා වඩලා දැනගෙන තියෙන්නේ, නැතිනම් ආයතන ඉක්මවා යන මගක් ද වැඩුවේ කියලා නුවණින් විමසන්න ඕන. ඔන්න ඔතැනින් තමයි මග, නොමග හඳුනාගැනීමේ ඥානය එන්නේ. ඒකටත් ඕනෑ නම් වෙනම වචනයක් දාගන්න පුළුවන්. නිවන් මාර්ගය මොකක් ද, ලෝකයට අයිති මාර්ගය මොකක් ද කියලා වෙන්කරගන්න නුවණක් ඇති කරගන්න ඕන. සම්මාදිට්ඨිය තිබුණොත් තමයි ඒ නුවණ ඇතිවෙන්නේ. බුදුකෙනෙක් දේශනා කළ දහම මොකක් ද කියන එක ගැන තමන්ට නුවණක් එන්න ඕන. එතකොට දහම කියලා කවුරු මොනවා කිව්වත්, ඕක ලෝකයට අයිති ද නැත්ද කියන එක තමන්ටම පැහැදිලි වෙනවා මිසක් අපි කිසිවෙකුට රැවටිය යුතු නැහැ.

ඒ සඳහා තමයි ත්‍රිපිටක දේශනා තියෙන්නේ. මම කියන නිසා මේවා පිළිගන්න එපා. දේශනාවලට ගළපළා බලන්න කියලායි මේ කියන්නේ. දහමට ගළපළා බැලුවොත්, බුද්ධ දේශනාව මොකක් ද

කියලා සොයාගත්තොත් නො මග යන්න විදියක් නැහැ. එහෙම වුණොත් මේ ක්‍ෂණ සම්පත්තිය නිකම් අපතේ යන්නේ, නාස්ති වෙන්නේ නැහැ.

අපි මෙපමණ කල් දහම කියලා වැරැදි මාර්ගයක් වැඩුවා නම් ඒ ගැනත් දුක්වෙන්න එපා. ඒක අත්දැකීමක් හැටියට ගන්න. ඕනෑම දෙයක් හොඳට දහමට ගළපලා බලන්න. පූර්‍ව ප්‍රතිපදාව වැඩුවා කියලා දුක්වෙන්න එපා, ඒකත් උදව්වෙනවා. පූර්‍ව ප්‍රතිපදාවෙන් අපේ කෙලෙස් තුනී වෙනවා. නීවරණ යටපත් වෙනවා. දැන් මේ ලෝකෝත්තර දහම දැනගත්තා කියලා පූර්‍ව ප්‍රතිපදාව නො කර ඉන්න එපා. දෙතිස් කුණප භාවනාව කරන්න ඕන. අශුභය පිළිකුල වඩන්න ඕන. පුළුවන් නම් නවසීවථිකයත්, අට්ඨික සංඥාවත් වඩන්න. ඒවාත් බුද්ධ දේශනා. ඕවා ලෝකයට අයිතියි කියලා අයින් කරන්න එපා. ඒවාත් අපට උදව් වෙනවා. ලෝකෝත්තර දහම දකින්න අපේ මනස සකස් කරනවා.

හැබැයි මේ හැම භාවනාවක්ම කරන්නේ කුමක් සඳහා ද කියලා තේරුම්ගන්න ඕන. අපි මෛත්‍රිය වඩන්නේ ව්‍යාපාද නීවරණය යටපත්කරගන්න යි. අශුභය වඩන්නේ කාමච්ඡන්දය යටපත් කරගන්න යි. ඒ භාවනා වඩන්නේ සක්කායදිට්ඨිය නැතිකිරීම සඳහා නෙවෙයි. සිහිය පිහිටුවලා ඇත්ත දකින්න නම් නීවරණ පහ යටපත් කරගන්න වෙනවා. ඒ සඳහා පූර්‍ව ප්‍රතිපදාව තුළ යෙදෙන භාවනා උදව් වෙනවා.

ඊළඟට සිහිය පිහිටියාට මදි. සිහිය පිහිටුවාගෙන දැකිය යුතු දහමක් තියෙනවා. ඒක දැනගන්න වෙන්නේ බුදුදහමෙන්ම පමණයි. වෙන විදියක් නැහැ. ඒ නිසා තමයි අපේ ශාස්තෘන් වහන්සේ බුදුරජාණන් වහන්සේ වෙන්නේ. අපට වෙන ශාස්තෘවරු නැහැ. ඒ විදියට තමයි අචල ශ්‍රද්ධාවක් ඇතිවෙන්නේ. බුදුරජාණන් වහන්සේට පමණයි මෙහෙම දහමක් අවබෝධ කරගෙන දේශනා කරන්න පුළුවන්. ඒ නිසායි අපට මේ ලැබිලා තියෙන්නේ ක්‍ෂණ සම්පත්තියක් කියලා කියන්නේ. එක එක්කෙනා අවබෝධ කරගත්ත දහම අහන්න නම් ක්‍ෂණ සම්පත්තියක් වෙන්න අවශ්‍ය නැහැ. රැවටෙන්නේ නැතුව, දහම බොහොම පරිස්සමෙන් විමසන්න අපි පුරුදුවෙන්න ඕන.

අපි මේ සාකච්ඡා තියන්නේ දහම මොකක් ද කියලා තේරුම්කරන්න විතරයි. මාර්ගය කියා දෙන්න නම් නෙවෙයි. මගඵල දෙන්නත් නෙවෙයි. නිවන් මාර්ගය මොකක් ද, මාර්ගය නො වෙන්නේ මොකක්ද කියලා තේරුම්ගන්න නම් දහමට ගලපලා බලන්න වෙනවා. අපට දහම අහන්න ලැබිලා තියෙනවා. කාටවත් දහම සඟවන්න බැහැ. ත්‍රිපිටකයේ තියෙනවා. හැබැයි කෙනෙකුට ඒ වචන එහාට මෙහාට කරලා ලෝකයට අයිති තේරුම් දීලා ගළපන්නත් පුළුවන්. අපි දැක්ක වෙන්න ඕන සතිපට්ඨාන සූත්‍රයට ගැළපෙනවා ද කියලා නුවණින් බලන්න. දහම එක තැනකට ගැළපිලා තව තැනකට නො ගැළපෙනවා නම් ඒක අපේ අවබෝධයේ අඩුවක් මිසක් ධර්මයේ අඩුවක් නෙවෙයි කියන තැනින් දහම හොයන්න ඕන. හැමවිටම දහම ගැන නුවණින් විමසන්න, ප්‍රශ්න කරන්න. ලෝකයට අයිති දේවල් ගැනත් බුදුරජාණන් වහන්සේ දේශනා කරලා තියෙනවා. ඒ ඇයි කියලා සොයාගන්න. එතකොට කොහේවත්ම නොගැලැපීමක් වෙන්නේ නැහැ. සම්මා දිට්ඨිය ඇතිකරගන්න පුළුවන් වෙනවා.

බුදුකෙනෙක් දේශනා කරලා තියෙන්නේ පෙර නො ඇසූ විරූ දහමක්. ඒ දහම ටිකෙන් ටික අවබෝධ වෙනකොට තව තවත් ශ්‍රද්ධාව වැඩිවෙනවා. බුදුකෙනෙක් පහළවෙන්නේ මේ වාගේ දහමක්ම දේශනා කරන්නයි. අපි දන්න දෙයක් අනික් පැත්තට කියන්න නෙවෙයි. අපි මෝඩකමට අවිද්‍යාවෙන් කරන දේවල් හඳුනාගන්න ඕන. ඒ සඳහා තමයි නිතරම **සමුදය ධම්මානුපස්සී වා** කියන තැනින් මාර්ගය පටන්ගත යුත්තේ. අපි මුලින්ම දහම විමසන්න පටන්ගන්න කොට පෙනෙන්නේ ලෝකයට අයිති සමුදය යි. ඒ සමුදයත් අපට සොයාගෙන යන්න වෙනවා. අවිද්‍යාව දක්වා සමුදය විමසුවොත් තමයි ලෝකයෙන් එතෙරවෙන පැත්තෙන් සමුදයට යන්නේ. හැම දෙයක්ම 'මෝඩකමට නේ' හැදුවේ කියන තැන දකිනවා. **දිට්ඨ-සුත-මුත-විඤ්ඤාත** වලින් එහාට ගියොත්, ඒ හතරට අමතරව වෙනත් දේවල් පැනෙව්වා නම් ඒ මෝඩකම, අවිද්‍යාව මතමයි එහෙම කරලා තියෙන්නේ. අවිද්‍යාව (සමුදය) තියෙන තෙක් අජ්ඣත්ත-බහිද්ධ ලෝකය තියෙනවා.

අජ්ඣත්ත-බහිද්ධ දෙක ඇතිවෙලා-නැතිවෙනවා කියන තැනට අපි සමහරවිට ඇවිල්ලා ඇති. එතැනින් තමයි මාර්ගය පටන්ගන්නේ

කියන බව අපි දැනගෙන තියෙන්න ඕන. හටගත්තු මොහොතේ වෙන සිද්ධියත් නුවණින් විමසන්න ඕන - **පච්චුප්පන්නඤ්ච යො ධම්මං තත්ථ තත්ථ විපස්සති**. අවිද්‍යාව තියෙන තාක් ලෝකය තියෙනවා. ඒක ඇතිවුණා නැතිවුණාට, ඇතිවුණ මොහොතේ අවිද්‍යාව යෙදිලා බවත් දකින්න ඕන. **අවිද්‍යාවෙනුයි දිට්ඨ කියන එකට අමතරව ඇහැයි-රූපයයි පනවාගෙන තියෙන්නේ, සුත කියන එකට අමතරව කණයි-ශබ්දයයි පණවාගෙන තියෙන්නේ. මුත කියන එකට අමතරව කයක් සහ හැපෙන දෙයක්, දිවක් සහ රසයක්, නාසයක් සහ ගන්ධයක් පණවාගෙන තියෙන්නේත් අවිද්‍යාවෙන්. විඤ්ඤත කියන එක නො දන්නාකමට සිතපු දෙයක් සහ සිතපු කෙනෙක් පණවාගෙන තියෙන්නේත් අවිද්‍යාවෙන්.**

මන-ධම්ම කියලාත් අපි දෙපැත්තක් බෙදගෙන තියෙනවා. මේ දෙපැත්තක් බෙදන්නේම විඤ්ඤාණයෙන්. මාරයා-ලෝකය-දුක-සත්ත්වයා ඔය සේරම එතකොට තියෙනවා. දෙපැත්තක් බෙදපු ගමන් 'මම' ඉන්නවා. ඒ නිසා නේ දෙපැත්තක් බෙදෙන්නේ. දැන් මෙතැන-අතන හටගෙන. මෙතැන කියන්නේම 'මම' ඉන්නා තැන යි. අතන අව්ව, මෙතැන හෙවන කියනවා. අතෙන්ට ගිහිල්ලා බැලුවොත් කියයි මෙතැන අව්වයි, අතන හෙවනයි කියලා. එතකොට මෙතැන-අතන කතා කරන්න පුළුවන් වුණේ 'මම' ඉන්නා තැනක් තිබුණ හින්ද යි. සක්කායදිට්ඨිය තියෙන තාක් මෙතැන හැදෙනවා. මේ සියල්ලම හැදෙන්නේ අවිද්‍යාව මතයි. ඒවා විඤ්ඤාණයෙන් කරන මායාවන්. ඇත්ත දුක්කහම අන්ත දෙකක් තියා මැදක් ගැනවත් කතාකරන්න බැහැ.

දිට්ඨ-සුත-මුත-විඤ්ඤාත හතරේ ඔය දෙපැත්තක් නැහැ. **මජ්ඣෙ සූත්‍රයේ**[52] කියාපු එක අන්තයක් වත් පිහිටන්නේ නැහැ. අන්ත නැතිනම් මැදක් පිහිටන්නෙත් නැහැ. එහෙම වුනොත් තණ්හා සිබ්බණියට, මැහුම්කාරියට ගැට ගහන්න බැරිවෙනවා. අපව සසරේ ගෙනයන්න බැරිවෙනවා. අපි ගැට දුන්නේ ජීවිතයෙන් ජීවිතයට නෙවෙයි, සිතෙන් සිතට යි. මේ ක්ෂණයේ ඇත්ත දකින්නේ නැති නිසා ඊළඟ ක්ෂණයට ගැට ගහනවා. ඇසීම සිදුවෙන ක්ෂණයේ ඇත්ත

[52] මජ්ඣෙ සූත්‍රය - අඞ්ගුත්තර නිකාය, ඡක්කනිපාකය, මහාවග්ගය.

දකින්නේ නැති නිසා ශබ්දයකුයි, කනකුයි උපද්දවලා ගැට ගහනවා. අජ්ඣත්ත-බහිද්ධ දෙක. ඒ ඇත්ත නො දැක්ක ගමන් **අතීතානාගතපච්චුප්න්න චක්ඛුවිඤ්ඤෙයෙසු රූපෙසු. සොතවිඤ්ඤෙයෙසු සද්දෙසු** පනවාගන්නවා. අපි මේ පරිහරණය කරන්නේ ප්‍රපංච ලෝකයක්, හදගත්ත, මවාගත්ත ලෝකයක් කියලා දහම තුළින් තේරුම් ගන්න ඕන.

හැමදෙනාටම තෙරුවන් සරණයි!

අපි ප්‍රායෝගිකව භාවනාවේ යෙදෙන්න උත්සාහ කරමු:

හුස්ම ඇතුල්වෙන, පිටවෙන ගතිය දැනෙන තැනට අවධානය යොමු කරන්න. දැන් ඔහොම ඉන්න කොට වටපිටාවේ ශබ්ද ඇහෙනවා. ඒ ශබ්ද නිසා දැනගන්නේ මොනවාද කියලා බලන්න. ඇහෙන ශබ්ද නිසා අපි බාහිර දේවල් ගැන දැනගන්නවා. ෆෑන් එකක් කරකැවෙනවා. කුරුල්ලෝ කෑගහනවා. එතකොට මේ මොහොතේ ඒ බව දැනගත්තේ කොහොම ද කියලා විමසන්න. ශබ්දයක් ඇහෙනවා, ඊළඟට ඒ ශබ්දය ගැන කල්පනා කරනවා. ශබ්දය ඇහුනේ කනෙන්; කල්පනා කළේ සිතෙන්. කායායතනය සහ මනායතනය පමණයි වැඩ කළේ. ඔය ආයතන දෙකෙන් එකක් හරි වැඩ කළේ නැතිනම් අපි ඔය දැනුවත්වීමට එන්නේ නැහැ. ශබ්දය ඇහෙනවා කියන සිද්ධියේ රූප නැහැ. ඇසීමක් විතරයි සිද්ධ වෙන්නේ. ඒ ගැන කල්පනා කරන්න ගිහිල්ලායි ෆෑන් එක හෝ කුරුල්ලෙක් කියලා දැනගන්නේ. කල්පනා කරලා දැනගත්ත දේවල් සිතේ නිර්මාණ. සිතෙන් හදන දෙය සිත දැනගන්නවා. ඒවා බාහිරයේ තියෙන්න විදියක් නැහැ. ඔය දැනගත්තේ එළියේ තියෙන දෙයක් කියලා අපි විශ්වාස කළාට, සිත ඇතුළේ නිර්මාණය වුණ දෙයක් තමයි ඔය දැනගෙන තියෙන්නේ. ඔය එළියේ තියෙන දෙයක් කියලා විශ්වාස කළේ අපේ පරණ පුරුද්දට යි. ලෝකයට අයිති පුරුද්දට යි. මේ මොහොතේ ඇත්තටම සිදුවුණ දෙය දිහා හොඳට නුවණින් බලන්න. කනෙන් ඇසීමක් සිදුවුණා. ඇසීම ගැන කල්පනා කළා. කල්පනා කරන කොට සිතෙන් කියන දෙය සිත දැනගත්තා. සිතෙන් කියාපුවා සිත ඇතුළේ මිසක් බාහිරයේ තියෙන දේවල් නෙවෙයි. ඒවා අල්ලන්න පුළුවන් භෞතික දේවල් නෙවෙයි.

එහෙම මතක් කරලා දීලා නැවතත් හුස්මට අවධානය යොමු කරන්න. ඉහළ යන ගතිය; පහළ යන ගතිය. ඉහළ යන ගතිය; පහළ යන ගතිය. ...

ඔහොම ඉන්න කොට ශරීරයේ යම්කිසි ස්වභාවයක් දැනෙන්න පුළුවන්. කකුල රිදෙනවා, කොන්ද රිදෙනවා ආදී වශයෙන්. දැන් ඉරියව්ව වෙනස් කරන්න ඕන කියලා හිතෙනවා. දැන් නැවතත් නුවණින් බලන්න; ඒ දැනගත්තේ කොහොමද කියලා. කයට

ස්පර්ශයක් දැනෙනවා. සිතෙන් ඒ ගැන කල්පනා කරනවා. එතන වැඩ කරලා තියෙන්නේ කායායතනයයි, මනායතනයයි. දැන් මේ ආයතන දෙකේ කෘත්‍ය (හැකියාව) විමසන්න. කායායතනයට දෙන්න පුළුවන් දැනීමක් විතරයි. ඒ දැනීම ගැන කල්පනා කරන්න ගිහිල්ලා තමයි ඔය 'දැනෙන්නේ කොතැන ද' කියලා දැනගන්නේ. කකුල රිදෙනවා කියලා කියන්නේ සිතයි. කායායතනයෙන් දුන්න දැනීම ගැන සිතන්න ගියහම තමයි ශරීරයේ කොටසක්, (කකුල, අත, කොන්ද) බව දැනගන්නේ.

දැන් එතන ඇත්තටම සිද්ධවුණ දෙය ගැන නුවණින් විමසන්න. එතකොට එතන දී සිතෙන් හදපු දෙයක් සිත දැනගත්තා කියලා පෙනෙයි. හිතෙන් හදන දේවල් අපට අල්ලන්න පුළුවන් භෞතික දේවල් නෙවෙයි. එහෙනම් මේ ශරීරයට අයිති කොටසක් කියලා බාහිරයට සම්බන්ධ කළේ හිතෙන් හදපු බව නො දන්නාකමටයි. ලෝකයට අයිති අපේ පරණ පුරුද්දටයි. මේ මොහොතේ ඇත්තටම සිද්ධවුණේ දැනීමක් ඇතිවුණා; ඒ දැනීම ගැන කල්පනා කළා. කල්පනා කරපුවා එකක්වත් අල්ලන්න පුළුවන් දේවල් නෙවෙයි. එහෙනම් ඔය ශරීරය කියලාත් සිතෙන් දැනගත්තා විතරයි. පරණ පුරුද්දට තමයි අපි ඕක භෞතික ශරීරයක් බවට පත්කරලා, බාහිරයේ තියෙනවා කියලා විශ්වාස කළේ.

දැන් නැවතත් හුස්මට අවධානය ගන්නඃ ඉහළ යන ගතිය; පහළ යන ගතිය. ඉහළ යන ගතිය; පහළ යන ගතිය. ....

ඔය විදියට හුස්ම ගැන සිහියෙන් සිටින අතර නැවතත් ආයතන ගැන නුවණින් මෙනෙහි කරන්න. බාහිර දෙයක් ගැන දැනගත්තොත්, ශබ්දයක් ඇහුණා, සිතෙන් සිතුවා. ශරීරය ගැන මොනවා හරි දැනගත්තොත්, දැනීමක් ආවා, සිතෙන් සිතුවා. ඔය සිතෙන් දැනගත් එක දෙයක්වත් එළියේ තියෙන දේවල් නෙවෙයි, සිතෙන් හදන දේවල් ගැනයි මේ මොහොතේ දැනුවත් වුණේ. ලෝකයට අයිති පුරුද්දට, පරණ පුරුද්දට තමයි ඕවා එළියේ, ලෝකයේ තියෙන දේවල් කියලා භාරගත්තේ. මේ මොහොතේ මේ ආයතන වැඩ කළේ නැතිනම් ඕවා තියෙන බව දන්නෙත් නැහැ. එහෙනම් මේ සිතේ නිර්මාණ ටිකක් තමයි සිත දැනගෙන තියෙන්නේ. ආයතන වලින්

හදලා දීපු දෙයක් තමයි මේ මොහොතේ දැනගත්තේ. ඒවා එළියේ තියෙනවා කියලා භාරගන්නේ පරණ පුරුද්දට යි. දැන් අපි මේ සිද්ධවෙන දෙය ගැන ඇත්ත පෙන්නලා දෙනවා. ආයතන දෙකක් වැඩ කරන හැටි නුවණින් විමසනවා.

නැවතත් හුස්මට හිත යොමු කරනවා - ඉහළ යන ගතිය; පහළ යන ගතිය. ...

දැන් ඉහළ-පහළ යන හුස්ම ගැන දැනගත්තේ කොහොම ද කියලා විමසන්න. කායායතනයට ස්පර්ශයක් දැනෙනවා. ඒ ගැන කල්පනා කරනවා. කල්පනා කරන කොට නේද ඉහළ යන හුස්ම, පහළ යන හුස්ම කියල දැනගන්නේ? එහෙනම් ඒකත් සිතේ නිර්මාණයක්. සිතෙන් හදන දේවල් අල්ලන්න බැහැ. සිතෙන් හදන හුස්මට ඇවිල්ලා නහයේ හැපෙන්න බැහැ. ඒක සිත ඇතුළේ වැඩක්. අපි ඕක එළියේ දෙයක් කියලා භාරගත්තේ පරණ පුරුද්දට යි. ඒ දැනීම දිහායි දැන් බලාගෙන ඉන්නේ. ඉහළ යන ගතියේ මොන වාගේ දැනීමක් ද තියෙන්නේ? පහළ යන ගතියේ මොන වාගේ දැනීමක් ද තියෙන්නේ?

දැන් සිත සාමාන්‍ය තත්ත්වයට අරගෙන හෙමිහිට ඇස් අරින්න.

මේවා ගැන පැහැදිලි නැතිනම් ප්‍රශ්න කරලා හොඳට තේරුම්කරගන්න ඕන. තේරුම්ගත්තොත් තමයි ප්‍රායෝගිකව භාවනාවේ යෙදෙන්න පුළුවන් වෙන්නේ.

කතෘගේ වෙනත් පොත්

- බුදු දහම දැක ගනිමු - 1 - පටිච්ච සමුප්පාද සාකච්ඡා
- බුදු දහම දැක ගනිමු - 2 - මධ්‍යාම ප්‍රතිපදාව (මජ්ඣෙ සූත්‍රය ඇසුරෙන්)
- බුදු දහම දැක ගනිමු - 3 - අනිච්චසඤ්ඤ සූත්‍රය
- බුදු දහම දැක ගනිමු - 4 - තජ්ජෝ සමන්නාහාරෝ (මහා හත්ථිපදෙපම සූත්‍රය ඇසුරෙන්)
- බුදු දහම දැක ගනිමු - 5 - සතරමහා ධාතුවේ සතර ආකාරය (මූලපරියාය සූත්‍රය ඇසුරෙන්)
- බුදු දහම දැක ගනිමු - 6 - ලෝකෝත්තර දැක්ම සඳහා කායානුපස්සනාව
- බුදු දහම දැක ගනිමු - 7 - උණ්ණාභ බ්‍රාහ්මණ සූත්‍රය
- බුදු දහම දැක ගනිමු - 8 - පුබ්බෙ අනනුස්සුතෙසු ධම්මෙසු (කච්චානගොත්ත සූත්‍රය, මධුපිණ්ඩික සූත්‍රය සහ අනාථපිණ්ඩිකොවාද සූත්‍රය ඇසුරෙන්
- බුදු දහම දැක ගනිමු - 9 - උපාදය අස්මීති හොති නො අනුපාදය (උදයි සූත්‍රය, වීණොපම සූත්‍රය සහ ආනන්ද සූත්‍රය ඇසුරෙන්)
- බුදු දහම දැක ගනිමු - 10 - ආයතන මුළාව (යමක සූත්‍රය, මාලුඞ්ඛ්‍යපුත්ත සූත්‍රය සහ කාළකාරාම සූත්‍රය ඇසුරෙන්)
- බුදු දහම දැක ගනිමු - 11 - නිරොධෙ ඤාණං (ආනාපානසති සූත්‍රය, අට්ඨකනාගර සූත්‍රය සහ උදයබ්බඤාණ නිද්දෙසය ඇසුරෙන්)

මෙම පොත්වල අන්තර්ජාල සංස්කරණය (pdf) සහ සාකච්ඡා (mp3) ශ්‍රවණය/බාගත කිරීම සඳහා පහත සඳහන් වෙඩ් අඩවියට පිවිසෙන්න
To download mp3, right click and select the save as option.
http://ravi.harimaga.com

ඔබගේ පුණ්‍යානුමෝදනාවක් සහිතව පොත් නැවත මුද්‍රණය සඳහා කතෘ අමතන්න.

මහාචාර්ය රවීන්ද්‍ර කොග්ගලගේ විසින් මෙහෙයවන භාවනා/ධර්ම සාකච්ඡා වැඩසටහන් පැවැත්වෙන ස්ථාන

1) කොළඹ
සෑම සෙනසුරාදා දිනයකම
පෙ.ව. 8.30 සිට ප.ව. 1.00 දක්වා
සුභද්‍රාරාම විහාරස්ථානය - ගම්සභා හන්දිය, නුගේගොඩ.

2) මාතර
සෑම මසකම සතියේ පළමු ඉරිදා දින
පෙ.ව. 9.00 සිට ප.ව. 4.00 දක්වා
'ජය නිවස' - මාතර බෝධි ආරක්ෂක සභාවේ භාවනා මධ්‍යාස්ථානය
කුමාරතුංග මාවත (නූපෙ හන්දියෙන් හැරෙන්න), මාතර.
විමසීම්: දේශබන්ධු කේ. ජී. මුනිදාස මහතා - 071 4438 747

3) මාතලේ
සෑම මසකම සතියේ තුන්වන ඉරිදා දින
ප.ව. 1.00 සිට ප.ව. 4.00 දක්වා
බෝගහකොටුව විහාරය
විමසීම්: ජාලිය මහතා - 066 222 2083

4) **ප්‍රඥ නාලිකාව** (PEO TV Channel 112)
සෑම සෙනසුරාදා දිනයකම
ප.ව. 7.00 සිට 8.00 දක්වා

ධර්ම දානයක් වශයෙන් මෙම පොත් නැවත මුද්‍රණය කොට නොමිලේ බෙදාහැරීමට ඕනෑම අයෙකුට අවසර ඇති අතර මුදලට විකිණීම සපුරා තහනම්ය.

ධම් දැනයකි - නොමිලයේ බෙදහැරීම පිණිසයි.

මෙන්න මේ පුරුදු කිරීමට කියනවා විදර්ශනාව කියලා. **පච්චුප්පන්න යො ධම්මං තත්ථ තත්ථ විපස්සති** - මේ මොහොතේ කනයි, ශබ්දයයි **පච්චුප්පන්න** ධර්මතා. දැන් අපි ඕවා නැහැ කියන්න යනවා නෙවෙයි. සමුදය පෙන්නනවා. **සමුදය ධම්මානුපස්සී** කියන එක තමයි මාර්ගය. හටගත්තා කියලා නවතින්නේ නැතුව, හටගත්තේ කොහොමද කියලා පෙන්නන්න ඕන. එහෙම පෙන්නන කොට මේ සමුදය තිබුණොත් විතරයි දෙපැත්තක් පැනවෙන්නේ කියලා අපට නුවණක් එනවා. මේ සමුදය යෙදුණේ නැත්නම් හටගන්න බැහැ කියන ධර්මතාවය අපට පෙනෙන්න ගන්නවා. හොඳට මතක තියාගන්න නිරෝධ කියන්නේ හටගත්ත දෙය නැතිවුණා කියන එක නෙවෙයි. නොහටගැනීමටයි නිරෝධය කියන්නේ. නිරෝධ ධර්ම අපේ මෝඩකමට උපද්දලා තියෙනවා. අපේ මෝඩකම මතයි පැනෙව්වේ, අපේ මෝඩකම මතයි හටගත්තේ. **සබ්බං තං නිරොධ ධම්මං** කියන එකේ ලොකු ගැඹුරක් තියෙනවා. ඒක තේරුම් ගත්තොත් සෝවාන් වෙනවා. සෝවාන් වෙන එකයි, රහත් වෙන එකයි පටලවා ගන්න එපා. දැන් අපට තියෙන්නේ අහගත්ත දැනුම විතරයි නමුත් සෝවාන් වීමේ දී ප්‍රත්‍යක්ෂව මේ ධර්මතාවය දකිනවා. නමුත් සතිය නැති වෙලාවට ලෝකයට අහුවෙනවා.

දැන් ත්‍රිලක්ෂණය වෙන පැත්තකින් පෙනෙයි. මෝඩකම තියෙනකම් අපි දේවල් පනවනවා - නිත්‍යයි, තියෙනවා කියලා. අවිද්‍යාව යෙදුණේ නැත්නම්? නිත්‍ය කළේ මෝඩකමට නේ. නිත්‍ය කරන්න බැරි බවටයි අනිත්‍ය කියන්නේ. පිහිටුවන්න බැරි ස්වභාවයක් අපි පිහිටුවලා තියෙන්නේ මෝඩකමට. අනිත්‍ය බව දකිනවා කියන්නේ නිරෝධ බව දකිනවා - මෝඩකමට උපද්දලා කියලා. දැන් අර පැනවීම නිසා චින්ද සුඛයට මොකක් වෙයි ද? දැන් යමක් අනිත්‍ය නම් දුකයි කියන ධර්මතාවය පෙනෙන්න ගන්නවා. 'යමක්' කියන්නේ අපි මෙච්චරකල් ඇතැයි කියලා භාරගත්ත දේවල්. යමකින් ආස්වාදයක් චින්ද නම් ඒ මොන මෝඩකමට ද කියලා පෙනෙනවා. අනිත්‍ය බව දැකීම තුළ දුක අවබෝධ වෙනවා.

ISBN 978-955-43763-4-2

රවීන්ද්‍ර කොග්ගලගේ
http://ravi.harimaga.com